# වාර්ෂික වාර්තාව සහ ගිණුම
# 2004

LIBRARY
&
INFORMATION DIVISION
30 AUG 2007
NARA

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන
නියෝජිතායතනය (නාරා)
කාක දූපත, මට්ටක්කුලිය
කොළඹ - 15.

JNARA-037

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | සාමාන්‍ය පරිපාලනය | – 1 |
| 02. | පරිසර අධ්‍යයන අංශය | – 9 |
| 03. | ධීවර තාක්ෂණ අංශය | – 14 |
| 04. | ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය | – 16 |
| 05. | අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය | – 18 |
| 06. | තොරතුරු තාක්ෂණ අංශය | – 26 |
| 07. | පුස්තකාල හා තොරතුරු අංශය | – 28 |
| 08. | සමුද්‍ර ජීව සම්පත් අංශය | – 30 |
| 09. | සාගර විද්‍යා අංශය | – 36 |
| 10. | පසු අස්වනු තාක්ෂණ අංශය | – 40 |
| 11. | සේවා සහ මෙහෙයුම් අංශය | – 46 |
| 12. | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය | – 48 |
| 13. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය | – 50 |
| 14. | විගණකාධිපති වාර්තාව | – 51 |

# සාමාන්‍ය පරිපාලනය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා), ජලජ සම්පත් ක්ෂේත්‍රයට අයත් පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ කටයුතු දියත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම පිළිබඳව පූර්ණ වගකීම දරණ ප්‍රධාන ජාතික ආයතනයයි. ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ප්‍රතිව්‍යුහගත කොට 1981 වසරේදී නාරා ආයතනය පිහිටුවන ලදී. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේදී, 1996 අංක 32 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනත මගින් පසුව සංශෝධනය කරන ලද, 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් නියෝජිතායතන පනත නම් පාර්ලිමේන්තු පනත යටතේ අංග සම්පූර්ණ පර්යේෂණායතනයක් ලෙස නාරා ආයතනය ස්ථාපනය කිරීම සඳහා එවකට මට්ටක්කුලිය, කාක දූපතේ වර්තමාන නාරා පරිශ්‍රයේ පැවති ධීවර තාක්ෂණ ආයතනය සමග එම පර්යේෂණ අංශය ඒකාබද්ධ කෙරිණි. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නාරා ආයතනය කටයුතු කරයි.

නියෝජිතායතනයේ අරමුණු සහ එයට පැවරී ඇති කාර්යභාරයන් පහත පරිදි වේ.

- ජාතික සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා විද්‍යාත්මක සහ තාක්ෂණික විශේෂඥ දැනුම නිසි සේ යොදවනු ලබන බවට සහ ප්‍රයෝජනයට ගනු ලබන බවට වග බලා ගැනීම.


- සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ සංවර්ධනය උදෙසා යොමු වූ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ජීවී සහ අජීවී ජලජ සම්පත් වල උපයෝජනය, කළමනාකරණය සහ සංවර්ධනයට අදාල කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් සහ විශේෂඥ දැනුම සැපයීම සහ සම්බන්ධීකරණය කිරීම.

- තොරතුරු සහ දත්ත එක්රැස් කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත් කිරීම.

- පුහුණුව සැපයීම.

**1. ආයතනික ව්‍යුහය.**




**2. පාලක මණ්ඩලය**

තෝරා පත් කරන ලද සාමාජිකයන් 08 දෙනෙකුගෙන් සහ නිලය අනුව පත් වූ සාමාජිකයන් 08 දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. 2004 අප්‍රේල් දක්වා අදාල වූ පාලක මණ්ඩල සාමාජිකයිනගේ නම් පහත දැක්වේ.

පත්කරන ලද සාමාජිකයන් :

01. රසික් සරුක් මහතා (සභාපති)
02. ඒ. අබේවික්‍රම මහතා
03. මහාචාර්ය ආනන්ද ගුණතිලක
04. ආචාර්ය එන්. එෆ්. සී. රණවීර
05. පී. රත්පටබැඳි මිය
06. නිමල් සිල්වා මහතා
07. ආචාර්ය කේ. සිවසුබ්‍රමානියම්
08. ආචාර්ය එන්. පී. විජයානන්ද

නිලය අනුව පත්වූ සාමාජිකයන් **

09. ඒ. එන්. ආර්. අමරතුංග මහතා - ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
10. ජේ. ඒ. ආරියසේන මහතා - වරාය සහ නාවුක කටයුතු අමාත්‍යාංශය නියෝජනය කිරීම.
11. එන්. පද්මනාතන් මහතා - මුදල් අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
12. ඒ. වික්‍රමසූරිය මහතා -විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
13. රෙයාර් අද්මිරාල් එස්.පී.වීරසේකර - නාවික හමුදාපති නියෝජනය කිරීම සඳහා.
14. කේ. එල්. ඒ. ආර්. ද සිල්වා මහතා - මැණුම්පති.
15. පී. පියසේන මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
16. ආචාර්ය පී. පී. ජී. එස්. එන්. සිරිවර්ධන - අධ්‍යක්ෂ ජනරාල්, නාරා (23/01/04 දක්වා)
ආචාර්ය ටී.කේ.ඩී.තෙන්නකෝන් මහතා (17/05/04 දක්වා)

** පනතේ අන්තර්ගත අනුපිළිවෙල අනුව.

2004 ජුනි සිට තෝරා පත් කරන ලද සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සහ නිලය අනුව පත්වූ සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩල සාමාජිකයින්ගේ නම් පහත සඳහන් වේ.

පත් කරන ලද සාමාජිකයින් :

01. ආචාර්ය කේ. කේ. සී. කේ. පෙරේරා (සභාපති)
02. මහාචාර්ය කේ. දහනායක
03. මහාචාර්ය යූ. එස්. අමරසිංහ (ඔක්තෝබර් මස සිට ඉවත් විය.)
04. ආචාර්ය සී. කේ. එම්. දෙහෙරගොඩ
05. ආචාර්ය පී. ආර්. ටී. කුමාරතුංග මිය

නිලය අනුව පත්වූ සාමාජිකයින්:

06. එන්. බඹරවානගේ මහතා - ලේකම් / ධීවර අමාත්‍යාංශය.
07. ඒ. කුමාරසිරි මහතා - මුදල් අමාත්‍යාංශ ලේකම් නියෝජනය කිරීම සඳහා
08. ජේ. ඒ. ආරියසේන මහතා-වරාය සහ නාවුක කටයුතු අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා
09. රෙයාර් අද්මිරාල් එස්. පී. වීරසේකර - නාවික හමුදාපති නියෝජනය කිරීම සඳහා
10. පී. ඒ. ආරියරත්න මහතා - මැණුම්පති
11. ජී. එම්. එන්. විජේරත්න මෙනෙවිය - විද්‍යා හා තාක්ෂණික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා
12. පී. පියසේන මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
13. ආචාර්ය එස්. සී. ජයමාන්න මිය - අධ්‍යක්ෂ ජනරාල් / නාරා.

### 3. සංවිධානය

රසික් සරුක් මහතා සභාපතිවරයා ලෙස 20/02/2004 දක්වා කටයුතු කල අතර, 2004 ජුනි 16 දින සිට ආචාර්ය කේ.කේ.සී.කේ.පෙරේරා සභාපති වශයෙන් පත්විය. ආචාර්ය පී.පී.ජී.එස්.එන්.සිරිවර්ධන

මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස 2004 ජනවාරි 23 දක්වා කටයුතු කළ අතර, පිළිවෙලින් ආචාර්ය ටී.කේ.ජී.තෙන්නකෝන් 17/05/2004 දින දක්වා ද, ආචාර්ය එස්.සී.ජයමාන්න මිය 19/05/2004 දින සිට ඉදිරියට අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ කටයුතු කළහ.

නියෝජිතායතනය, පරිසර අධ්‍යයන අංශය, ධීවර තාක්ෂණ අංශය, අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීව වගා අංශය, ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය, තොරතුරු තාක්ෂණ අංශය, පුස්තකාල හා තොරතුරු අංශය, සමුද්‍ර ජීව සම්පත් අංශය, සාගර විද්‍යා අංශය, සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය, පසු අස්වනු තාක්ෂණ අංශය, ලෙස විද්‍යාත්මක හා තාක්ෂණික අංශ 10 කින් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා පාලන අංශය, සේවා හා මෙහෙයුම් අංශය සහ මූල්‍ය අංශය උපකාරක අංශ වේ.

## 4. අංශ ප්‍රධානීන්

සමාලෝචිත වර්ෂය තුළ පහත දැක්වෙන නිලධාරීන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලදී.

**පර්යේෂණ අංශ**

| | |
|---|---|
| එන්. සුරේෂ් කුමාර් මහතා | පරිසර අධ්‍යයන අංශය |
| ආචාර්ය පී. ඒ. ඒ. ටී. ජයවර්ධන / ආචාර්ය ඩී. එස්. ජයකොඩි | ධීවර තාක්ෂණ අංශය |
| එම්. ඒ. ආරියවංශ මහතා | ජලශාස්ත්‍රීය කාර්යාලය |
| ඒ. බී. ඒ. කේ. ගුණරත්න මහතා | තොරතුරු තාක්ෂණ අංශය |
| ආචාර්ය එස්. සී. ජයමාන්න මිය | අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීව වගා අංශය |
| වී. රූපසිංහ මිය | පුස්තකාල හා තොරතුරු අංශය |
| ආචාර්ය සී. අමරසිරි මිය | සමුද්‍ර ජීව සම්පත් අංශය |
| ආචාර්ය කේ. අරුලානන්තන් | සාගර විද්‍යා අංශය |
| ජී. ජේ. ගනේගමආරච්චි මෙනෙවිය | පසු අස්වනු තාක්ෂණ අංශය |
| ආචාර්ය ආර්. මල්දෙනිය මිය | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය |

**උපකාරක අංශ**

| | | |
|---|---|---|
| යූ. ඒ. සිරිසේන මහතා | – | පරිපාලන අංශය |
| එම්. ඩී. සේනාරත්න මහතා | – | මූල්‍ය අංශය |
| යූ. ඒ. සිරිසේන මහතා | – | සේවා සහ මෙහෙයුම් අංශ්‍ය |

## 5. බඳවා ගැනීම්

පහත සඳහන් බඳවා ගැනීම් 2004 වර්ෂය සඳහායි.

| තනතුරු නාමය | ස්ථිර / කොන්ත්‍රාත් | තනතුරු සංඛ්‍යාව | නම |
|---|---|---|---|
| මිනුම් කම්කරු | ස්ථිර | 01 | ඩී.එල්.අනිල් සංජේ මයා |
| බංගලා භාරකරු | ස්ථිර | 01 | ඉන්දික විජේසිංහ මයා |

| | | | |
|---|---|---|---|
| දත්ත සැකසුම් ක්‍රියාකරු / වචන සැකසුම් ක්‍රියාකරු | ස්ථිර | 01 | ඩී.පී.සිරිබද්දන මෙනෙවිය |
| පර්යේෂණ සහකාර | ස්ථිර | 02 | ජේ.එෆ්.තිස්රිනා මෙනෙවිය<br>එස්.එච්.යූ.චතුරානි මෙනෙවිය |
| රියදුරු | ස්ථිර | 01 | කාලිංග කොඩිතුවක්කු මයා |
| ගබඩා භාරකරු / ලිපිකරු | ස්ථිර | 01 | ඩී අබේවික්‍රම මහතා |
| රියදුරු | කොන්ත්‍රාත් | 01 | ඩබ්.පී.එම්.කේ.අබේවික්‍රම මයා |
| රසායනාගාර සහායක | කොන්ත්‍රාත් | 02 | කේ .ඩබ් .ඉන්දික මයා<br>එච්.එම්.සී.හේමමාලි මෙනෙවිය |

**6. 6.1 විශ්‍රාම ගැන්වීම්.**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී. එච්. සුගතදාස මහතා | මුදල් අයකැමි | 04/02/2004 |
| එම්. කේ. කේ. නානායක්කාර මහතා | විදුලි ඉංජිනේරු | 18/09/2004 |
| එල්. ජේ. ගුණසේකර මහතා | භූමි මිනින්දෝරු | 18/09/2004 |
| ආර්. ඩී. ගුණසේකර මහතා | යාත්‍රාපති (සයුරි) | 18/09/2004 |
| පී. එච්. බර්නාඩ් මහතා | කම්කරු | 18/09/2004 |
| එස්. පී. කීර්තිපාල මහතා | වැඩ පරීක්ෂක (විදුලි) | 18/09/2004 |
| පී. ඩී. තිලකලතා මිය | වචන සැකසුම් ක්‍රියාකරු | 21/10/2004 |
| එම්. ඒ. අමරසේන මහතා | පුහුණු කම්කරු | 21/10/2004 |

**6.2 සේවයෙන් ඉවත්වීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| යූ. පී. ඥානසේන මහතා | මේසන් | 24/07/2004 |
| රංජනී ගුරුගේ මිය | වචන සැකසුම් ක්‍රියාකරු | 29/02/2004 |
| එච්. සී. එස්. ප්‍රනාන්දු මහතා | ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 20/09/2004 |
| දර්ශි කවිරත්න මිය | විගණන ලිපිකරු | 31/07/2004 |
| කේ. එච්. ඩී. ටී. කසාගල මහතා | පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) | 15/04/2004 |
| ආර්. සී. වී. ගමගේ මහතා | පර්යේෂණ සහකාර | 20/10/2004 |

**6.3 සේවයෙන් ඉවත් කිරීම් (Vacation of Post).**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී. ඒ. එච්. කීර්තිරත්න මහතා | රසායනාගාර සහායක | 07/04/2004 |
| ඩබ්. පී. එම්. කේ. අබේවික්‍රම මහතා | රියදුරු (කොන්ත්‍රාත් පදනම) | 23/04/2004 |
| ඕ. ආර්. ඩබ්. ඩී. ඒ. ඔව්විපන මහතා | ජලශාස්ත්‍රීය මිනින්දෝරු (කොන්ත්‍රාත් පදනම) | 16/08/2004 |

**6.4 ඉවත් කිරීම්.**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එස්. ඩී. ගුණපාල මහතා | අරක්කැමි | 01/06/2004 |
| පී. එල්. එස්. පතාවල මහතා | පර්යේෂණ නිලධාරි | 30/07/2004 |

7. **2004 වර්ෂය අවසාන වනවිට පිරවීමට ඉතිරිව තිබූ පුරප්පාඩු**

| | |
|---|---|
| ප්‍රධාන පරිපාලන නිලධාරි | - 01 |
| පර්යේෂණ නිලධාරි | - 11 |
| ආර්ථික විද්‍යාඥ | - 01 |
| පර්යේෂණ සහකාර | - 02 |
| වැඩ ලිපිකරු | - 01 |
| විගණක ලිපිකරු | - 01 |
| වැඩ පරීක්ෂක (විදුලි) | - 01 |
| පැස්සුම්කරු | - 01 |
| මේසන් | - 01 |
| උපකරණ තාක්ෂණ ශිල්පි | - 01 |
| වවන සැකසුම් ක්‍රියාකරු | - 01 |
| සැලසුම් ශිල්පි | - 01 |
| රියදුරු | - 01 |
| බංගලා භාරකරු | - 01 |
| රසායනාගාර සහායක | - 01 |
| අරක්කැමි | - 01 |
| පුහුණු කම්කරු | - 01 |
| කම්කරු | - 06 |
| සනීපාරක්ෂක කම්කරු | - 02 |
| බංගලා භාරකරු සහායක | - 01 |
| ඩෙක්හැන්ඩ් | - 01 |
| නැවි | - 02 |
| යාත්‍රාපති | - 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / ජලශාස්ත්‍රඥ | - 01 |
| ප්‍රධාන ජලශාස්ත්‍රීය මිනින්දෝරු | - 01 |
| ජලශාස්ත්‍රීය මිනින්දෝරු | - 04 |
| මිනින්දෝරු | - 02 |
| ප්‍රධාන සිතියම් විද්‍යාඥ | - 01 |
| නියෝජ්‍ය සිතියම් විද්‍යාඥ | - 01 |
| නියෝජ්‍ය ප්‍රධාන සිතියම් විද්‍යාඥ | - 01 |
| සිතියම් විද්‍යාඥ | - 01 |
| ක්‍රම විශ්ලේෂක | - 01 |
| ක්‍රම විශ්ලේෂක / සම්පාදක | - 01 |
| ජ් ඩී පී සහකාර | - 01 |
| කාර්යාල සහකාර | - 01 |
| තාක්ෂණික සහකාර | - 01 |
| මිලදී ගැනීමේ නිලධාරි | - 01 |
| කොක්ස්වේන් | - 01 |

කළමනාකරණ හා සේවා අනුමැතිය ඇතිව තනතුරු සඳහා අයදුම්පත් කැඳවිය.

**2003 වසරේදී ලබාදුන් උසස්වීම්**

| **උසස් කරන ලද ශ්‍රේණිය** | **සංඛ්‍යාව** |
|---|---|
| I ශ්‍රේණිය සිට අධි ශ්‍රේණිය | 02 |
| II සිට I ශ්‍රේණිය | 04 |
| VII සිට VI ශ්‍රේණිය | 01 |
| VIII සිට VII ශ්‍රේණිය | 02 |

9. **විනය කටයුතු :**
පවත්වන ලද විනය පරීක්ෂණ වල විස්තර පහත දැක්වේ.

9. 1 **කම්කරු උසාවියේ නඩු**

(1) ඩබ්.ඩී.ශ්‍රේෂන් ප්‍රනාන්දු මයා }
සුරම්‍යා විජේසේකර මෙනෙවිය }

අවසන් කර ඇත. දෙදෙනාම වැරදිකරුවන් ලෙස ඔප්පු විය කෙසේ වුවත් ශ්‍රේෂන් ප්‍රනාන්දු මහතාට රු. 72,000/00 ක මුදලකුත් එස් විජේසේකර මෙනෙවියට රු.63,000/- ක මුදලකුත් ගෙවන ලෙස ආයතනයට නියෝග කරන ලදී. ආයතනය එසේ කටයුතු කරන ලදී.

(2) ජේ.කේ.බාලපටබැඳි මයා - විභාග වෙමින් පවතී.

(3) ඩී.ජ්.කරුණාසේන මහතා - විභාග වෙමින් පවතී.
(SR/F/57/04)

9. 2 **දිසා අධිකරණයේ නඩු.**

කඩොල්කැලේ ප්‍රා.ප. මධ්‍යස්ථානයේ ඉඩම් නඩුව - 6137/L විභාග වෙමින් පවතී. මීගමුව දිසා අධිකරණය.

9. 3 විනය පරීක්ෂණ.

(1) ගණකාධිකාරී / වයි.සමරරත්න මයා - පරීක්ෂණය අවසන් වී ඇති අතර, පාලක මණ්ඩලය විසින් සමරත්න මහතා 01/12/2004 දින සිට නැවත සේවයේ පිහිටුවන ලදී.

(2) කම්කරු / බී.උපුල් ඉන්ද්‍රසිරි මයා - පරීක්ෂණය අවසන්වී ඇති අතර, පාලක මණ්ඩලය විසින් උපුල් ඉන්ද්‍රසිරි මහතාගේ සේවය 09/04/2003 සිට අවසන් කර ඇත.

(3) පුස්තකාලයාධිපති / ම්.කේ.පී.නන්දන මයා - පරීක්ෂණය අවසන්වී ඇත. ම්.කේ.පී.නන්දන මයා 06/12/2004 දින සිට සේවයේ පිහිටුවීමට පාලක මණ්ඩල අනුමැතිය දෙන ලදී.

(4) ජේ.බී.ජ්.මාගම්මන මයා සහ ජී.ලමාහේවා මයා - විභාග වෙමින් පවතී.

10. **සුභසාධන කටයුතු**
පහත සුභසාධන කටයුතු සිදු කෙරිණි.

- "නාරා දිනය" නිමිත්තෙන් සමරු කලාපයක් එළි දක්වන ලදී.
- ලේ දන්දීමේ කඳවුරක් හා අක්ෂි සායනයක් ආයතනයේදී පැවැත්විණි.
- ආයතනය හා ආයතනයේ පරිසරය පවිත්‍ර කිරීමේ මහා ශ්‍රමදානයක් නොවැම්බර් 05 දින ක්‍රියාත්මක විය. මේ සඳහා ආයතනයේ සේවක මහත්ම මහත්මීන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ අතර, වෙරළ තීරය දක්වා වූ ප්‍රදේශය එළි පෙහෙළි කරන ලදී.

- වාර්ෂික විනෝද චාරිකාව නොවැම්බර් 6 සිට 8 දක්වා යාපනය ප්‍රදේශයට යෙදිණි.

- සාමාජික සාමාජිකාවන් සහ ඔවුන්ගේ පවුලේ අය සඳහා නත්තල් උත්සවයක් දෙසැම්බර් 18 දින ආයතන පරිශ්‍රයේදී පවත්වන ලදී.

- සුනාමි ව්‍යසනය සමග ආයතනයට දැඩි අලාභ හානි සිදුවිය. ආයතනයේ විද්‍යාගාර හා විසිතුරු මත්ස්‍ය ටැංකි පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් 27 දින සිට දියත් කෙරිණි. මේ සඳහා සේවක මහත්ම මහත්මීන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ. සමහර විද්‍යාත්මක උපකරණ ඔවුන් විසින් නැවත අලුත්වැඩියා කරන ලදී. මෙනිසා රු. 3,000,000/00 ක පමණ වූ වියදමක් ඉතිරි කරගත හැකි විය.

- අනෙකුත් සුභසාධන කටයුතු හා සේවක ප්‍රවාහන පහසුකම් ලබාදීම සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක විය.

## 11. 2004 වසර තුළ විදේශගතවීම් : (පුහුණු වැඩසටහන් / වැඩමුළු / රැස්වීම් ආදිය සඳහා)

| නම සහ තනතුර | රට | කාර්යය | කාලසීමාව |
|---|---|---|---|
| කේ.පී.පී.වික්‍රමසිංහ මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඔස්ට්‍රේලියාව | මීරාලී පර්යේෂණ නැවේ සිට සාගර විද්‍යා පුහුණුව | 24/01/04 සිට 22/02/04 |
| ආචාර්ය පී.පී.ජී.එස්.එන්.සිරිවර්ධන<br>පර්යේෂණ නිලධාරී | එක්සත් රාජධානිය | රැකියාවක් සඳහා (වැටුප් රහිත නිවාඩු) | 26/01/04 සිට 25/01/04 |
| එස්.එස්.කේ.හපුතන්ත්‍රි මයා<br>පර්යේෂණ නිලධාරී | ප්‍රංශය | ආචාර්ය උපාධිය සඳහා | 29/02/04 සිට 30/06/04 |
| එන්.සුරේෂ් කුමාර් මයා<br>පර්යේෂණ නිලධාරී<br>(අංශ ප්‍රධානී/පරිසර අධ්‍යයන අංශය) | තායිලන්තය | පළිබෝධ නාශක පරීක්ෂණ ක්‍රම පිළිබඳ කෙටි වැඩමුළුව | 16/02/04 සිට 20/02/04 |
| | ඉන්දියාව | පෞද්ගලික සංචාරයක් | 06/08/04 සිට 21/08/04 |
| | තායිලන්තය | ක්ෂේත්‍ර ඵලදායිතා වැඩමුළුව (MAMAS ව්‍යාපෘතිය) | 26–30/10/04 |
| ආචාර්ය සී.අමරසිරි මිය<br>පර්යේෂණ නිලධාරිණී<br>(අංශ ප්‍රධානී/සමුද්‍ර ජීව සම්පත් අංශය) | සීෂෙල්ස් | IOIC-OFCF කලාපීය වැඩමුළුව | 01–05/03/04 |
| | – එම – | හයවැනි විද්‍යාත්මක කමිටු රැස්වීම හා ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 8 වැනි සැසිය. | 03–12/12/04 |
| ආචාර්ය ආර්.ආර්.පී.මල්දෙණිය මිය<br>පර්යේෂණ නිලධාරිණී<br>(අංශ ප්‍රධානී/සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය) | පිලිපීනය | ආසියානු දිළිඳු නිවැසියන්ගේ ධීවර හා ජලජ නිෂ්පාදන දියුණු කිරීම, නගා සිටුවීම හා මෙහෙයුම් පිළිබඳ අවසාන වැඩමුළුව. | 17–20/03/04 |
| | තායිලන්තය/<br>සිංගප්පූරුව | පෞද්ගලික සංචාරයක් | 25–27/10/04 |
| එම්.ජ්.ආරියවංශ මයා | ඉන්දියාව | උතුරු ඉන්දියානු සාගර කලාපීය ජලශාස්ත්‍ර කොමිසමේ 4 වෙනි රැස්වීම. | 24–27/03/04 |
| | ඉන්දියාව | ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර මහාද්වීපික සීමා වෙන් කිරීම සඳහා වූ ද්විපාර්ශ්වික සාකච්ඡාව | 08–12/08/04 |
| එන්.බී.පී.පුණ්‍යදේව මයා<br>පර්යේෂණ නිලධාරී | ඉන්දියාව | කරදිය ධීවර තාක්ෂණ පුහුණුව | 19/04/04 සිට 14/05/04 |

| | | | |
|---|---|---|---|
| එස්.එස්.සී.පීරිස් මයා<br>පර්යේෂණ සහකාර | ඉන්දියාව | කරදිය ධීවර තාක්ෂණ පුහුණුව | 19/04/04 සිට<br>14/05/04 |
| පී.ජයසූරිය මයා<br>පර්යේෂණ සහකාර | ජපානය | ජලශාස්ත්‍රීය මිනින්දෝරු පුහුණුව (JICA) | 05/05/04 සිට<br>12/12/04 |
| එම්.එම්.සී.කරුණාරත්න මයා<br>කිම්දුම් සහකාර | ජපානය | කොරල්පර කළමනාකරණ පුහුණුව (JICA) | 25/05/04 සිට<br>22/08/04 |
| ජේ.කේ.රාජපක්ෂ මයා<br>පර්යේෂණ නිලධාරි | තායිලන්තය | පෞද්ගලික සංචාරයක් | 17-29/06/04 |
| | තායිලන්තය | MODIS හා NOAA/AVHRR මගින් ධීවර දත්ත යෙදවුම් අධ්‍යයනය. | 01/10/04 සිට<br>30/11/04 |
| පී.පී.එම්.හීනටිගල මිය<br>පර්යේෂණ නිලධාරිණී | තායිලන්තය | මත්ස්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව පුහුණුව | 05/08/04 සිට<br>30/09/04 |
| කේ.ඩබ්.එස්.ආරියවංශ මිය<br>පර්යේෂණ නිලධාරිණී | මැලේසියාව | ආචාර්ය උපාධිය | 29/08/04 සිට<br>මාස 36 ක් |
| ආචාර්ය කේ.කපිල<br>සී..කේ.පෙරේරා / සභාපති | ඉන්දියාව | කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනයෙහි ලා වඩාත් ඵලදායි හා සහභාගිත්ව ප්‍රබල කලාපීය වැඩමුළුව / දකුණු ඉන්දියාව. | 01-03/09/04 |
| | ඉන්දියාව | බෙංගාල බොක්ක වැඩ සටහනේ 1 වැනි රාජ්‍ය මණ්ඩල රැස්වීම. | 07-08/09/04 |
| ආචාර්ය එස්.සී.ජයමාන්න මිය<br>වැ. බ. අධ්‍යක්ෂ ජනරාල් | ඉන්දියාව | බෙංගාල බොක්ක වැඩ සටහනේ 1 වැනි රාජ්‍ය මණ්ඩල රැස්වීම. | 07-08/09/04 |
| එස්.ඩබ්.එස්.වීරසිංහ මයා<br>ප්‍රධාන පද්ධති විශ්ලේෂක | එක්සත් රාජධානිය | ENC පුහුණු වැඩසටහන | 11/09/04 සිට<br>17/10/04 |
| ඒ.කේ.වී.සමරවීර මිය<br>පර්යේෂණ නිලධාරිණී | මුරුසිය | විශාල උපතිතල මත්ස්‍ය වැඩසටහන. | 27/09/04 සිට<br>01/10/04 |
| එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය<br>පර්යේෂණ නිලධාරිණී | පිලිපීනය | | 12/-16/09/04 |
| එච්.බී.ජයසිරි මයා<br>පර්යේෂණ නිලධාරි | ඉන්දියාව | පෝෂක හා ජලවාංග විශ්ලේෂණ පුහුණුව. | 28/09/04 සිට<br>24/10/04 |
| බී.එච්.එම්.එන් .ද සිල්වා මයා | ඉන්දියාව | - එම - | - එම - |
| එච්.එම්.පී.කිත්සිරි මයා<br>පර්යේෂණ නිලධාරි | ඉන්දියාව | ආචාර්ය උපාධිය | 01/10/04 සිට<br>මාස 36 ක් |
| ආචාර්ය ටී.කේ.ඩී.තෙන්නකෝන්<br>පර්යේෂණ නිලධාරි | තායිලන්තය | මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව ප්‍රමිතිය. | 15/11/04 සිට<br>14/12/04 |
| වී.පහලවත්තආරච්චි මිය<br>පර්යේෂණ නිලධාරිණී | ඉන්දියාව | කඩොලාන පිළිබඳ ක්‍රමවත් විද්‍යාත්මක කළමනාකරණ පුහුණුව. | 15/11/04 සිට<br>15/12/04 |

## පරිසර අධ්‍යයන අංශය (E.S.D.)

### අංශ ප්‍රධානී : එන්.සුරේෂ් කුමාර් මහතා

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

ජල දූෂණය සම්බන්ධ අධ්‍යයන සහ ජලජ පරිසරය ආශ්‍රිත පාරිසරික ගැටළු සම්බන්ධ තක්සේරු කිරීමේ කටයුතු දියත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාලසීමාව තුළදී අංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ නිලධාරීන් දෙදෙනකු ගෙන් සමන්විත වූ අතර, එක් පර්යේෂණ නිලධාරියකු ඕස්ට්‍රේලියාවේදී සිදු කෙරෙන ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු වල නියැලීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා සිටියි. ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතිය යටතේ එක් පර්යේෂණ නිලධාරියකු කොන්ත්‍රාත් පදනමින් සේවය කරයි. මීට අමතරව පර්යේෂණ සහකරුවන් තිදෙනෙක්, එක් දත්ත නිවේශක ශිල්පියෙක් සහ කම්කරුවන් තිදෙනෙක් අංශයේ සේවය කරති. පර්යේෂණ කටයුතු එක් ක්ෂේත්‍රීය ව්‍යාපෘතියකට සීමා විය. යුරෝපීය කොමිසම මගින් ආධාර සැපයෙන පර්යේෂණ සහයෝගිතා ව්‍යාපෘතියක් මෙම අංශය විසින් තෙවන වසර සඳහා ක්‍රියාත්මක කරයි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා උපදේශක සේවා 2 ක් අංශය විසින් සිදු කරයි. දෙසැම්බර් 26 දින පැමිණි සුනාමිය නිසා නාරා ආයතනයට විශාල අලාභහානි සිදුවිය. මෙහිදී පරිසර අධ්‍යයන අංශයටද විශාල අලාභහානි සිදුවූ අතර, උපකරණ, පරිගණක, දැව භාණ්ඩ, රසායන ද්‍රව්‍ය, වීදුරු භාණ්ඩ ආදිය විනාශ විය. මෙහිදී රු. 9,779,200/00 ක පමණ අලාභහානියක් සිදුවී ඇති බව ඇස්තමේන්තු විය. අංශය යථා තත්වයට පත් කිරීම සඳහා ඉතා ඉක්මන් හා කෙටි ක්‍රියාමාර්ග ගතයුතු විය. මෙහිදී අංශයේ සියලු දෙනා එකමුතුව ඒ සඳහා වෙහෙසුනු අතර, පරිගණක, වායුසමන, ශීතකරණ, උණුසුම්කරණ වහා යථා තත්වයට පත් කිරීම අත්‍යවශ්‍ය විය.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. ජලජ පරිසරය ආශ්‍රිත පරිසර දූෂණයේ තත්වය | 1.1 පරිසර දූෂණය සහ ඇල්ගී ප්‍රභාවට විශේෂ අවධානය සහිතව තෝරාගත් අභ්‍යන්තර ජලජ පරිසරවල ජලයේ ගුණාත්මක තත්වය අධ්‍යයනය කිරීම. | 0.412 | එන්.සුරේෂ් කුමාර්<br>එස්.ඒ.එම්.අස්මි<br>පී.එල්.එස්.පතාවල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 1.2 වෙරළ හා වෙරළාසන්න මුහුදු තීරයේ ශේෂ වන ලෝහවල ප්‍රමාණ විශ්ලේෂණය. | 0.388 | එස්.ඒ.එම්.අස්මි | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 2. විශේෂඥ සේවා, උපදේශක සේවා, පරීක්ෂණ සේවා, හදිසි අවස්ථා පිළිබඳ අධ්‍යයන | 2.1 පරීක්ෂණ සේවා, විශේෂඥ සහ උපදේශන සේවා, ජල දූෂණය සහ මසුන් සමූහ මියයාම් අධ්‍යයනය | 0.04 (පරීක්ෂණ සේවා සඳහා සේවා යෝජකයාගෙන් ගාස්තු අය කෙරේ.) | එන්.සුරේෂ් කුමාර්<br>එස්.ඒ.එම්.අස්මි<br>පී.එල්.එස්.පතාවල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 3. අංශයේ පර්යේෂණාගාරය සඳහා බලයලත් පර්යේෂණාගාරයක තත්වය ලබා ගැනීම | 3.1 පරිසර අධ්‍යයන අංශයේ පර්යේෂණාගාරයට බලයලත් තත්වය ලබා ගැනීම සඳහා එම පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන | 0.32 | එන්.සුරේෂ් කුමාර්<br>එස්.ඒ.එම්.අස්මි<br>පී.එල්.එස්.පතාවල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 4. බහු කාර්ය ජලජ පරිසර පද්ධති තුල කෘෂිරසායන කළමනාකරණය (MAMAS) | 4.1 රසායන ද්‍රව්‍ය සහ ඒවායේ බලපෑම් අධ්‍යයනය කිරීම | යුරෝ 30,119 | එන්.සුරේෂ් කුමාර් | 2004 ජනවාරි | 2004 දෙසැ: |

**කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1.1 පසුගිය වර්ෂයේ සිට අඛණ්ඩව සිදු කෙරුණු මෙම ව්‍යාපෘතියේ එක්රැස් කළ දත්ත විශ්ලේෂණය මෙම වසරේදී සිදු කෙරිණි.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ තෝරාගත් අභ්‍යන්තර ජලාශ කිහිපයක ජලයේ වර්තමාන ගුණාත්මක තත්වය අධ්‍යයනය කිරීමයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාච්චදූව, තිසා වැව, නුවර වැව සහ රාජාංගනය වැව ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය වැව සහ පරාක්‍රම සමුද්‍රය යන ජලාශ වලින් එක් කළ දත්ත සංඛ්‍යාන විද්‍යාත්මකව විශ්ලේෂණය කරන ලදී.

ප්‍රගතිය භෞතික : 70% මූල්‍යමය : 60%

**ව්‍යාපෘතිය 1.2**

නැගෙනහිර පළාතේ වෙරළෙහි ජලයේ ශේෂ වන ලෝහයන්ගේ තත්වයන් අධ්‍යයනයක් සිදුවී නොමැති හෙයින් මෙම ව්‍යාපෘතිය මගින් ඒ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. නැගෙනහිර පළාතේ පුල්මුඩේ හා අක්කරෙයිපත්තුව ප්‍රදේශ ආවරණය වන සේ සිදු කරයි. ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක 3 ම මෙයින් ආවරණය වේ. නියැදි ලබා ගන්නා ස්ථාන, ත්‍රිකුණාමලයේ පුල්මුඩේ, යාන්ඔය, පුඩවක්කත්තු, සලුප්පියාරු, එරක්කන්ඩි, තිලාවැලි, ඕලන්ද බොක්ක, නැව් තටාංගනය, කොඩ්බේ, වෙල්ලයිමනාල්, කින්නියා සහ අල්ලෙ කන්තලේ (මහවැලි ගඟ) ප්‍රදේශ වේ. ත්‍රිකුණාමලය දකුණු ප්‍රදේශයෙන් වෙරුගල් (මහවැලි ප්‍රදේශය), පනිච්චන්කර්නි (උප්පූර්), මඩකලපු කලපුව, කාත්තන්කුඩි, ඔන්ඩච්චිමඩම්, කල්ලාර්, කිලිඔඩ්ඩි, ඔලුවිල් සහ අක්කරෙයිපත්තු මෙයට අයත් වේ. අට වතාවක් නියැදි එකතු කරන ලද අතර, ආරක්ෂක ප්‍රශ්ණ හා ගංවතුර තර්ජන නිසා සමහර මාස වලදී මෙය ඉටු කිරීමට අපහසු විය.

ලබාගත්තා දත්ත අතර පී.එච්. සාන්ද්‍රණය, උෂ්ණත්වය, ද්‍රාව්‍ය ඔක්සිජන් ප්‍රමාණය, විද්‍යුත් සන්නායකතාවය, බොරතාවය හා ලවණතාවයන් වේ. මෙහිදී ශේෂ වූ ලෝහ අතර ලෙඩ්, කොපර්, ක්‍රෝමියම්, කැඩ්මියම්, සින්ක්, මැන්ගනීස්, අයන්, නිකල්, ඇලුමිනියම්, සෝඩියම් සහ මැග්නීසියම් වේ.

දත්ත වල ප්‍රතිඵල වලින් පෙන්නුම් කළේ, මෙම ප්‍රදේශවල කර්මාන්ත වලින් ජලයට හානි සිදුවන්නේ සුළු වශයෙන් බවයි. නමුත් සමහර ස්ථානවල කොපර් සාන්ද්‍රණය ඉහළ මට්ටමක් ගෙන තිබුණි. කෘෂි රසායන ද්‍රව්‍ය ඉහළ ලෙස භාවිතය මෙයට හේතුවිය හැක. පෝෂක අගයන් අතර, නයිට්‍රේට් 0.001 සිට 0.07 mg/l දක්වාද, නයිට්‍රයිට් 0.003 සිට 0.014 mg/l දක්වාද, ෆොස්පේට් 0.006 සිට 0.024 mg/l දක්වාද, ඇමෝනියා 0.005 සිට 0.048 mg/l දක්වාද වේ. BOD අගයන් 3.9 mg/l අගයන් අතර විචල්‍ය වේ. උතුරු නැගෙනහිර හා නැගෙනහිර වෙරළ තීරය ආශ්‍රිත අනාගත සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම මූලික දත්ත ඉතා වැදගත් වේ.

ප්‍රගතිය භෞතික : 80% මූල්‍යමය : 35%

**ව්‍යාපෘතිය 2.1**

**පරීක්ෂණ සේවා.**

මෙම වැඩසටහන දියත් කෙරෙන්නේ අංශය සතු විශේෂඥ දැනුම සහ පරීක්ෂණාගාර පහසුකම් උපයෝගී කොට ආදායම් උපයා ගැනීම සඳහාය. මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ට සහ අනෙකුත් කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත කටයුතු නිසි ලෙස සහ ධීවර හා ජලජ සම්පත් පනත, ජාතික පරිසර ආරක්ෂක පනත යන පනත් යටතේ ගැසට් නිවේදනය කොට ඇති නීති රීති වලට අනුකූලව සිදු කිරීමට උපකාරී වීම සඳහා දියත් කෙරේ. මෙම ක්‍රියාවලිය පාලක මණ්ඩලයේ අනුමැතියන්ට අනුව සිදුවේ. කාර්මික අපවහන නියැදි 10 ක් රැස්කොට විශ්ලේෂණය කරන ලද අතර, වාර්තා ලබාදෙන ලදී. එමගින් නාරා ආයතනයට රු. 100,030/- ක ආදායමක් ලැබිණි.

**උපදේශක සේවා**

- තෙල් කාන්දුවීම් ආශ්‍රිත හදිසි අවස්ථා කළමනාකරණය කිරීමට අවශ්‍ය ආයතනික ශක්තිය ගොඩ නැංවීම.

තෙල් කාන්දුවීම් පිළිබඳ හදිසි අවස්ථා පනත සංශෝධනය කිරීම පිණිස සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරියට උපකාරී වීම සඳහා පිහිට වූ තෙල් කාන්දුවීම් සම්බන්ධ හදිසි අවස්ථා කළමනාකරණ ව්‍යාපෘතියෙහි ආයතනික අංශය ශක්තිමත් කිරීමේ කටයුතු සහ මෙහෙයුම් ප්‍රතිචාර කණ්ඩායමේ කාර්යයන් සඳහා එන්.සුරේෂ් කුමාර් මහතා සහභාගී විය.

- ශ්‍රී ලංකාවේ තෙත්බිම් සංරක්ෂණය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව.

වනසත්ව හා පාරිසරික අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස එන්.සුරේෂ් කුමාර් මහතා සහභාගී විය.

- තෙත්බිම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම.

ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික තෙත්බිම් ප්‍රතිපත්තියෙහි කෙටුම්පත සකස් කිරීම සඳහා පාරිසරික සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම් වලට එන්.සුරේෂ් කුමාර් මහතා සහභාගී විය.

- තුලන පිරවුම් ජලය කළමනාකරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.

තුලන පිරවුම් ජලය කළමනාකරණය කිරීම සඳහා ඔක්තෝබර් මාසයේදී සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය මගින් මූලික කණ්ඩායමෙහි රැස්වීමක් කැඳවන ලද අතර, මෙම රැස්වීම සඳහා නාරා ආයතනය නියෝජනය කරමින් එන්.සුරේෂ් කුමාර් මහතා සහභාගී විය.

**පාරිසරික බලපෑම් තක්සේරු කිරීම්.**

- රත්මලාන / මොරටුව කාර්මික සහ නේවාසික ප්‍රදේශ සඳහා යෝජිත කසළ ජලාපවහන පද්ධතිය.

යෝජිත ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම තක්සේරු අධ්‍යයනය සඳහා ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘතියට අනුමැතිය ලබාදෙන ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද කමිටු රැස්වීම් වලට එන්.සුරේෂ් කුමාර් මහතා සහභාගී විය.

**විශේෂඥ උපදේශන සේවා**

- රැකව, උස්සන්ගොඩ සහ කළමැටිය යන වෙරළාසන්න පරිසර පද්ධති ආශ්‍රිත ජල ස්කන්ධයන්හි ජල ගුණාත්මක තත්වය අධ්‍යයනය.

2003 නොවැම්බර් මසදී ආරම්භ වී මාස 18 ක කාලයක් පුරා සිදු කෙරෙන වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රැකව, උස්සන්ගොඩ සහ කළමැටිය වෙරළාසන්න පරිසර පද්ධති ආශ්‍රිත ජල ස්කන්ධයන්හි ගුණාත්මක තත්වය සඳහා GEF ආයතනයෙන් ආධාර ලැබේ. 2004 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාස 12 ක් සඳහා සෘතු 2 කදී ජලයේ ගුණාත්මක තත්වය අධ්‍යයනය කරන ලදී මාසිකව ජලයේ ගුණාත්මක තත්ව වාර්තා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුනි.

- හලාවත කලපුව සඳහා පාරිසරික පැතිකඩක් සකස් කිරීම.

හලාවත කලපුව සඳහා පාරිසරික පැතිකඩක් සකස් කිරීමේ ක්‍රියාකාරකම් මෙම අවුරුද්දේ සිදු කෙරිණි. අනෙකුත් අංශවල විශේෂඥයන්ගේ දායකත්වයද මේ සඳහා යොදා ගැනිණි. ප්‍රශ්නාවලී හා ප්‍රවාට පිළිතුරු ලබාගැනීම සඳහා ග්‍රාම නිලධාරී වසම් වලට අයත් ග්‍රාම නිලධාරීන්ගේ සහාය ලබා ගැනිණි.

මාරවිල, අඹකඳවිල හා එගොඩවත්ත යන ග්‍රාම නිලධාරි වසම් 3 හි වෙසෙන ජනයාගෙන් මේ සඳහා දත්ත රැස් කෙරිණි. වාර්තා සැකසෙමින් පවතී.

- කොග්ගල කලපුව අධ්‍යයනය.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් නාරා ආයතනයට ව්‍යාපෘතිය ලැබුණි. නමුත් මෙහි ප්‍රධාන වගකීම දරණුයේ නාරා ආයතනයේ සාගර විද්‍යා අංශයයි. පරිසර අධ්‍යයන අංශය විසින් මාස 12 ක් පුරා කලපුවේ නයිට්‍රජන්, පොස්පේට්, බොරතාවය, භාෂ්මිකතාවය, ශේෂ වූ ලෝහ ආදී තත්වයන් පරීක්‍ෂා කරන ලදී. 2004 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී නියැදි එකතු කළ අතර, 2005 සැප්තැම්බර් දක්වා අඛණ්ඩව සිදුවේ. කොග්ගල කලපුවේ ඉහත තත්වයන් පිළිබඳ ත්‍රෛයිමාසික වාර්තා ලබා දුනි.

- **හදිසි අවස්ථා අධ්‍යයනය.**

ප්‍රගතිය % භෞතික : 90% මූල්‍යමය : 70%

**ව්‍යාපෘතිය 3.1**

පර්යේෂණාගාරයේ තත්ව පාලන කටයුතු වැඩි දියුණු කිරීමේ යටිතල පහසුකම් සැපයීම හා ඒ අතර රසායන ද්‍රව්‍යයන්ගෙන් වන හානි හා ආරක්‍ෂක මෙවලම් ලබාදීම ටෙන්ඩර් පටිපාටියට අනුව සිදුවිය. රසායන ද්‍රව්‍ය අසුරා තිබීමේ ක්‍රමවත් බව මගින් ඒවායේ කාන්දුවීම් වලින් වන හානිය වැලැක්වීම හා පරීක්‍ෂණ සඳහා යොදා ගන්නා නියැදිවල ගුණාත්මක තත්වයන් වැඩි දියුණු කිරීම සිදුවිය. පිළිසකර කිරීමේ කටයුතු සඳහා සේවා හා මෙහෙයුම් අංශයේ සහාය ලැබිණි.

**සුනාමි ව්‍යසනයේ බලපෑම් :**

දෙසැම්බර් 26 දින සිදුවූ සුනාමි ව්‍යාසනය නිසා නාරා ආයතනයේ උපකරණ වලට විශාල වශයෙන් හානි සිදුවිය. හානි සිදුවූ උපකරණ වල වටිනාකම මෙසේය. උපකරණ රු. 9,005,000/00, දැව භාණ්ඩ රු.480,000/00, රසායන ද්‍රව්‍ය රු. 200,200/00, වීදුරු භාණ්ඩ රු. 94,000/00 මුළු වටිනාකම ලෙස රු.9,779,200/00 ඇස්තමේන්තු විය.

ප්‍රගතිය % භෞතික : 60% මූල්‍යමය : 25%

**ව්‍යාපෘතිය 4.1**

යුරෝපීය කොමිසම මගින් සැපයෙන ප්‍රතිපාදන යටතේ අන්තර්ජාතික පාර්ශ්වකරුවන් හයදෙනෙකුගේ සහභාගීත්වය සහිතව ආරම්භ කරන ලද මෙම පර්යේෂණ ව්‍යාපෘතිය එහි තුන්වන වසර සඳහා මින් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, ජලජ පරිසර පද්ධතිවල කෘෂි රසායනික භාවිතය කළමනාකරණය කිරීම හා වැඩිදියුණු කිරීමයි. මොයිනා හා තිලාපියා බිජු යොදා විෂ සහිත බව පිළිබඳ තත් - ස්ථානීය පරීක්‍ෂණ සිදු කෙරිණි. පහත සඳහන් පරීක්‍ෂණ ද සිදු කෙරිණි.

තිලාපියා බිජු යොදා ගැනීම සඳහා සුදුසු පරීක්‍ෂණ මාධ්‍යයන්, ප්‍රශස්ත පර්යේෂණ තත්වයන්, පර්යේෂණ කුට්ඨල ප්‍රමාණයන්, ක්ෂේත්‍ර ඵලදායිතාවයේ ප්‍රශස්ත කාලයන්, සුදුසු ආකෘති සංඛ්‍යාවන් වේ. ලබා ගන්නා බිජු ප්‍රමාණයන් දැඩි තත්ව යටතේ බීජ වල මාරක හා උප මාරක සාන්ද්‍රණ තත්වයන් සොයා බැලිනි. AIT ආයතනය කුඩා වැඩමුළු සංවිධානය කරන ලදී. මූලික පියවර ලෙස ශ්‍රී ලංකාව හා තායිලන්තය මේ සඳහා සුදුසු තත්ව ක්‍රමවේද සඳහා යොදා ගැනිණි. මොයිනා බීජ වගාව සඳහා සෙරොඩෆෝනියා වල ආක්‍රමණය ප්‍රශ්ණයක් විය. මේ නිසා නැවත නැවතත් පරීක්‍ෂණ සිදුවිය. තත් ස්ථානීය පරීක්‍ෂාව සඳහා මයික්‍රොබැක්ටීරියම් හා ත්‍රොමොනිච් කීටයින් යොදා ගැනිණි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමග එකතුව ගල්ගමුව ප්‍රදේශයේදී ක්ෂේත්‍ර පර්යේෂණ සිදුවිය. පරීක්‍ෂණ සිදු කරන ලදී.

ව්‍යාපෘතියේ එක් අංගයක් ලෙස තිලාපියා බීජෝෂණය සඳහා මූලික කිට උණුසුම්කරණයක් හඳුන්වා දෙන ලදී. ව්‍යාපෘති සමීක්ෂණය හා ඉදිරි සැලසුම්කරණ කටයුතු සඳහා තාරා ආයතනයේදී සියලු පාර්ශ්වකරුවන් සඳහා රැස්වීමක් සංවිධානය විය. AIT ආයතනය නැවතත් කුඩා වැඩමුළුවක් ඔක්තෝබර් මසදී තායිලන්තයේදී සංවිධානය කරන ලදී. ව්‍යාපෘතිය ප්‍රමාද වී ආරම්භ වූ බැවින් අරමුණු බලාපොරොත්තු වූ මට්ටමට සාර්ථක කර ගැනීමට නොහැකි විය. මේ නිසා ඉදිරි මාස 06 ක් සඳහා නොමිලයේ අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලීමක් කෙරිණි.

ප්‍රගතිය % භෞතික : 70% මූල්‍යමය : 55%

**5. ප්‍රකාශන** :

2004 ජූලි මස පම්බල කලපුවේ ජල දූෂණය නිසා සිදුවූ මත්ස්‍ය මරණ පිළිබඳ වාර්තාව ධීවර දෙපාර්තමේන්තුව හා හික්කඩුව දිස්ත්‍රික් ලේකම් වෙත භාර දෙන ලදී.

**6. පුහුණුවීම්** :

ආසියානු සංවර්ධන බැංකු වැඩ සටහන යටතේ එස්.ජ්.එම්.අස්මි මහතා පුහුණුවක් සඳහා නම් කළ අතර එම අවස්ථාව නොලැබිණි.

# ධීවර තාක්ෂණ අංශය

**අංශ ප්‍රධානි : ආචාර්ය පී.ජ්.ජ්.ටී.ජයවර්ධන /**
**ආචාර්ය ඩී.එස්.ජයකොඩි**

## 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

2004 වර්ෂය සඳහා ව්‍යාපෘති 02 ක් දියත් කෙරිණි.

(1) නාරා ආයතනයේ ධීවර ආම්පන්න කෞතුකාගාරයක් පිහිටුවීම.
(2) කලපු හා මුහුදු ධීවර යාත්‍රා හා ආම්පන්න පිළිබඳ නාමාවලියක් සැකසීම.

## 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

කෞතුකාගාරය සඳහා තොරතුරු හා නියැදි එකතු කෙරිණි ධීවර ආම්පන්න නාමාවලිය සඳහා ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම සිදුවිය.

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| නව ධීවර තාක්ෂණයන් ඇති කිරීම. | තාක්ෂණික තොරතුරු ඇතුලත් ධීවර ආම්පන්න කෞතුකාගාරයක් නාරා ආයතනයේ ඇරඹීම. | 13 | ආචාර්ය ඩී.එස්.ජයකොඩි එන්.බී.පී. පුන්‍යදේව | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| නව ධීවර තාක්ෂණයක් ඇති කිරීම | කලපු හා මුහුදු ධීවර යාත්‍රා හා ආම්පන්න පිළිබඳ නාමාවලියක් සැකසීම | 09 | ආචාර්ය ඩී.එස්.ජයකොඩි එන්.බී.පී. පුන්‍යදේව | 2004 ජනවාරි | 2004 දෙසැ: |

## 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘති 1 – තාක්ෂණික තොරතුරු ඇතුලත් ධීවර ආම්පන්න පිළිබඳ කෞතුකාගාරයක් නාරා ආයතනය තුළ ගොඩ නැංවීම.**

මෙම ව්‍යාපෘතිය යටතේ ධීවර ආම්පන්නවල නියැදි හා ඒවා තැන්පත් කිරීම සඳහා රාක්ක සකසන ලදී. රාක්ක තැන්පත් කිරීම සඳහා නාරා ශ්‍රවණාගාරය ඉදිරිපස තනා ඇති ප්‍රදර්ශන කුටිය අලුත්වැඩියා කළයුතු වූ නමුත්, එය සාර්ථක නොවිය.

ප්‍රගතිය : භෞතික : 70% මූල්‍යමය : 30%

**ව්‍යාපෘති 2 – කලපු හා මුහුදු ධීවර ආම්පන්න හා යාත්‍රා නාමාවලිය සැකසීම.**

දළ සැකසුමක් නිමාවිය.

ප්‍රගතිය : % භෞතික : 60% මූල්‍යමය : 50%

## 4. ප්‍රකාශන :

4.1 පර්යේෂණ ලිපි – නැත.

4.2 පර්යේෂණ වාර්තා – ලයිට්කෝස් පිළිබඳ වාර්තාවක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ලබාදුනි. ධීවර ආම්පන්න නාමාවලියේ දළ සැකසුමක් නිමාවිය.

4.3 ග්‍රන්ථ / අත්පොත් – පිළියෙල වෙමින් පවතී.

## 5. පුහුණුවීම් / අවබෝධාත්මක වැඩසටහන් ඉදිරියට.

I. මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමසිරි මානගේ මහතාගේ ආරාධනයක් අනුව අඩු වියදම් මත්ස්‍ය ආකර්ශණ තැටි (FADS) පිළිබඳ නවීන තාක්ෂණික හඳුන්වාදීමේ වැඩසටහන් මාතර දිස්ත්‍රික්කය තුළ සිදුවිය.

II. අම්බලන්ගොඩ ප්‍රදේශයේදී සිදුකල ලයිට්කෝස් පිළිබඳ පර්යේෂණ වාර්තා පිළියෙල කොට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

III. කල්පිටිය ධීවර පරීක්ෂණ කාර්යාලය සංවිධානය කල ලයිලා දැල් භාවිතයේ වර්තමාන තත්ව පිළිබඳ වැඩසටහනකට සහභාගී විය.

# ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය

## අංශ ප්‍රධානි : එම්.ජ්. ආරියවංශ මහතා

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

නාවික යාත්‍රික කටයුතු සුරක්ෂිතව සහ කාර්යක්ෂමව සිදු කිරීමට ආධාරක වන සේවා සැපයීම ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය මගින් සිදු කෙරේ. එයින් සැපයෙන ප්‍රධාන සේවා වන්නේ නාවික සිතියම් ඇතුළු නාවුක තොරතුරු සැපයීම, වෙරළ කලාපීය කළමණාකරණය සහ පාරිසරික ආරක්ෂණය ආදී අවශ්‍යතා සඳහා දත්ත සැපයීම සහ ඒ සම්බන්ධ අනෙකුත් සම්පාදන සහ සේවා සැපයීමය. නිවැරදි සහ කාලීන නාවික සිතියම් සම්පාදනය කිරීම මගින් නාවික වෙළඳ කටයුතු සහ අනෙකුත් සමුද්‍රය ආශ්‍රිත කටයුතු පහසු වන අතර, එමගින් සැලකිය යුතු ආර්ථික සහ වාණිජමය ප්‍රතිලාභ ජනනය වේ.

ජාතික නාවික සිතියම් සැකසීම නාරා ආයතනයේ ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය මගින් සිදුවේ. බටහිර වෙරළේ ජලශාස්ත්‍රීය දත්ත ආවරණය හා සම්පූර්ණ කිරීමත්, විශේෂයෙන් බටහිර වෙරළ තීරයේ ගල්කිස්ස සිට ගාල්ල දක්වා ගැඹුරු මුහුදේ ප්‍රදේශ ආවරණය කිරීමත්, කොළඹ බේරුවල හා ගාල්ල වරාය ප්‍රදේශ වලත් මෙම කටයුතු නිම කිරීමට නියමිතය.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|
| 1. ජාතික සිතියම්කරණ වැඩ සටහන | 1.1 ගල්කිස්ස සිට බෙන්තොට දක්වා වූ වර්ග කිලෝ මීටර් 700 ක මුහුදු ප්‍රදේශයක ගැඹුරු මිනිත දත්ත "සයුරි" මැනුම් යාත්‍රාව ආධාරයෙන් රැස් කිරීම. | එස්.එන්.එස්.අමරසිංහ<br>ඒ.එන්.ඩී.පෙරේරා | 2004 ජනවාරි | 2004 දෙසැ:: |
| | 1.2 ගල්කිස්ස සිට බෙන්තොට දක්වා වූ ප්‍රදේශයේ අක් වෙරළෙහි ගැඹුරු මිනිත දත්ත "තරංගා" මැනුම් යාත්‍රාව ආධාරයෙන් රැස් කිරීම. | එස්.එන්.එස්.අමරසිංහ<br>ඒ.එන්.ඩී.පෙරේරා | 2004 ජනවාරි | 2004 දෙසැ:: |
| | 1.3 කිලෝ මීටර් 20 ක් දක්වා සවිස්තර වෙරළ තීරය සමීක්ෂණය. | පී.එන්.කොඩිකාර | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 1.4 විද්‍යුත් දත්ත සැකසුම සහ සිතියම් සම්පාදනය හා කොළඹ වරායේ මිනුම් කටයුතු. | එස්.ඩබ්.එස්.විරසිංහ<br>ඕ.වී.ප්‍රේමචන්ද්‍ර | 2004 ජනවාරි | 2004 දෙසැ:: |

### 3. කාර්ය සාධනය

**ව්‍යාපෘති 1.1**

**ගල්කිස්ස සිට බෙන්තොට දක්වා වූ වෙරළ තීරයේ ගැඹුරු දියඹ ජලශාස්ත්‍රීය දත්ත රැස් කිරීම හා නිම කිරීම.**

2004 දෙසැම්බර් මස අවසාන වනවිට දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 700 මුහුදු ප්‍රදේශයක වැඩ කටයුතු නිමා විය. නමුත් අනපේක්ෂිත කාලගුණික වෙනස්කම් නිසාද උපකරණ නිසි පරිදි ක්‍රියා නොකිරීම නිසාද දිගු කාලයක් සේවකයින්ට මේ සඳහා වැය කිරීමට සිදුවිය.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 95%

**ව්‍යාපෘති 1.2 ගල්කිස්ස සිට බෙන්තොට දක්වා ජල ශාස්ත්‍රීය දත්ත එක්රැස් කිරීම.**

ගල්කිස්ස සිට බෙන්තොට දක්වා වූ කලාපයේ ආසන්න ජලශාස්ත්‍රීය දත්ත රැස් කරන ලදි. 2004 දෙසැම්බර් අවසාන වනවිට දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 200 ක ආසන්න වෙරළ කලාපය ආවරණය කරන ලදි.

ප්‍රගතිය : භෞතික : 90% මූල්‍යමය : 95%

**ව්‍යාපෘති 1.3 කිලෝ මීටර් 20 ක් දක්වා සවිස්තර වෙරළ තීරය සමීක්ෂණය.**

කිලෝ මීටර් 20 ක් දක්වා සවිස්තර වෙරළ තීරය සමීක්ෂණය ඉහත කලාප සඳහා නිමාවිය.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 95%

**ව්‍යාපෘති 1.4 විද්‍යුත් දත්ත සැකසුම් සහ සිතියම් සම්පාදනය හා කොළඹ වරායේ මිනුම් කටයුතු.**

විද්‍යුත් දත්ත සැකසුම සහ සිතියම සම්පාදනය.
කොළඹ වරායේ මැනුම් කටයුතු සිදු කිරීම.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 95%

**5. ප්‍රකාශන :**

ගාල්ල වරාය යෝජිත නාවුක සිතියම් සම්පාදනය.

**6. පුහුණුවීම් / අවබෝධාත්මක වැඩ සටහන් ඉදිරියටත්.**

සබරගමුව විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා ජල ශාස්ත්‍රීය ගවේෂණ පිළිබඳ ප්‍රායෝගික පුහුණුව.

ජල ශාස්ත්‍රීය අංශයේ දක්ෂතා නැංවීම සඳහා Multi Beam පුහුණුවක් එක්සත් රාජධානියේ ජල ශාස්ත්‍රීය කාර්යාලය මගින් ලබාදීම.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ කැඩෙට් නිලධාරින් සඳහා නාවුක සිතියම් සැකසුම පිළිබඳ පුහුණුව.

# අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය

අංශ ප්‍රධානීන් : ආචාර්ය එස්. සී. ජයමාන්න මිය
එච්. එම්. පී. කිත්සිරි මහතා
ඒ. එස්. එල්. ඊ. කොරයා මිය

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

2004 වර්ෂය තුළ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක විය. ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් 06 ක්ද ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයන්හි නිලධාරීන් 05 ක්ද යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක විය. ප්‍රධාන කාර්යාලයේ සිටින එක් නිලධාරියෙකු වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස මැයි සිට පත්වූ අතර, තවත් නිලධාරියෙක් ආචාර්ය උපාධිය සඳහා සැප්තැම්බර් මස පිටත්ව ගියේය. එක් නිලධාරියෙකුගේ ආචාර්ය උපාධිය නිමවී නොවැම්බර් මස ආපසු පැමිණීමට නියමිතව තිබූ නමුත් ඇය විසින් ආචාර්ය උපාධිය නිම කිරීම සඳහා නිවාඩු දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කෙරිණි.

වර්ෂය තුළදී අංශය විසින් වැඩ සටහන් සතුටුදායක ලෙස සිදුකළ නමුත්, මත්ස්‍ය රෝග හඳුනා ගැනීමේ වැඩ සටහනේදී උපකරණ හා රසායන ද්‍රව්‍ය ලබා ගැනීම් පමාව නිසා බාධා ඇතිවිය.

විවිධ සේවා ලබාදීම අංශය විසින් සිදු කෙරිණි. ඒ අතර ජල තත්ව පරීක්ෂණ ව්‍යාපෘති සමීක්ෂණය, මත්ස්‍ය රෝග හඳුනා ගැනීම් සහ පුහුණු වැඩ සටහන් හා අනෙකුත් ඉල්ලීම් සඳහා දායක විය.

කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ කඩොලාන උද්‍යානයක් සෑදීම සහ රඹකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ තිලාපියා අභිජනනය සඳහා අඩු වියදම් කුඩා අභිජනනාගාරයක් සෑදීමට අමතර වියදම් දැරීමට සිදුවිය.

සුනාමි ව්‍යසනය නිසා අංශය සතුව තිබූ උපකරණ, එකතු කරන ලද ආවේණික මසුන්, ජලජ පැලෑටි ආදිය විනාශ විය.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු. මි.) | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. වෙරළ කලාපීය ජලජීවී වගාව. | 1.a ඉස්සන් ගොවිපළ වලට වෛරස ආසාදන පැමිණිය හැකි මාර්ග වසා දැමීම. | 0.68 | පී.පී.එම්.හීනටිගල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | b. ඉස්සන්ගේ සෞඛ්‍ය කළමනාකරණය. | | ඒ.එස්.එල්.ඊ.කොරයා | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 2. කොස්සා සහ වෙක්කයා යන මත්ස්‍යයන්ගේ අභිජනනය කිටයන්ගේ දිවි පැවැත්ම සහ වගාව කෙරෙහි බලපාන සාධක නිර්ණය කිරීම. | 0.855 | පී.ඒ.ඩී.අජිත් කුමාර | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 2. අභ්‍යන්තර ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව. | 3. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ජලජීවී කෘෂි ඒකාබද්ධ වගා පද්ධතියක් වැඩි දියුණු කිරීම. | 1.105 | ආචාර්ය එස්.සී.ජයමාන්න<br>එම්.එච්.එස්.ආරියරත්න<br>වී.පහලවත්තආරච්චි<br>එම්.පී.අයි.එස්.පරාක්‍රම<br>ඒ.ඩී.ඩබ්.ආර්.රාජපක්ෂ<br>එම්.ගම්මන්පිල | 2004 ජනවාරි | 2004 දෙසැ: |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 4. ඒක දේශික විසිතුරු මත්ස්‍ය විශේෂවල මත්ස්‍ය පැටවුන් ඇති දැඩි කිරීම සඳහා යොදන අභිජනන ක්‍රම අධ්‍යයනය සහ විසිතුරු ජලජ පැලෑටි බෝ කිරීමේ ක්‍රම දියුණු කිරීම. | 0 .635 | එච්.එම්.පී.කිත්සිරි<br>එම්.ජී.අයි.එස්.පරාක්‍රම<br>පී.පී.එම්.හීනටිගල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | a. ඒක දේශික විසිතුරු මත්ස්‍ය අභිජනනය සඳහා තාක්ෂණික ක්‍රම. | | | | |
| | b. විසිතුරු ජලජ පැලෑටි බෝ කිරීම. | | ජ්.එස්.එල්.ජ්.කොරයා | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 5. ශ්‍රී ලංකාවේ දක්නට ඇති නීති විරෝධී, වාර්තාගත නොවූ සහ පාලනය නොවන ධීවර කර්මාන්තයන් පිළිබඳ ගවේශණය කිරීම. | 0.715 | පී.ජ්.ඩී.අජිත් කුමාර<br>ජ්.ඩී.ඩබ්.ආර්.රාජපක්ෂ | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 6. දකුණු පළාතේ දක්නට ඇති මිරිදිය මත්ස්‍ය විශේෂ, විශේෂයෙන්ම ඒකදේශීය විසිතුරු මත්ස්‍ය විශේෂ පිළිබඳ සමීක්ෂණය. | 0.309 | ජ්.ඩී.ඩබ්.ආර්.රාජපක්ෂ | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 7. ඒක දේශික මිරිදිය හා විසිතුරු මත්ස්‍යයින්ගේ තත්වයන් උසස් කිරීම, උසස් ගහණතාවයන් නැංවීම. | 0.825 | එච්.එම්.පී.කිත්සිරි<br>එම්.ජී.අයි.එස්.පරාක්‍රම<br>පී.පී.එම්.හීනටිගල | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 3. තෙත්බිම් පරිසර පද්ධති අධ්‍යයනය. | 8. වාසස්ථාන විනාශ වීම කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි මුහුදු තෘණවල නිෂ්පාදකතාවය විවිධ කලපු පරිසර පද්ධති ඇසුරින් සන්සන්දනාත්මක ලෙස අධ්‍යයනය කිරීම. | 0.376 | වී.පහලවත්තආරච්චි | 2004 ජනවාරි | 2004 දෙසැ: |

**3. කාර්ය සාධනය**

**වැඩ සටහන : ඉස්සන් /පොකිරිස්සන් සම්පත බෝ කිරීම හා කළමනාකරණය.**

**ව්‍යාපෘතිය 1.1 – ඉස්සන් ගොවිපළ තුළට වෛරස ආසාදන ඇතුළු විය හැකි මාර්ග සියල්ල පිළිබඳ සොයා බැලීම සහ ඒවා වැළැක්වීමට පිළියම් යෙදීම.**

(a) වෛරස ආසාදන ඇතිවීම වසා දැමීමේ ක්‍රම.

ඉස්සන් වගාවේදී අභිජනනාගාර කීට අවස්ථා හා වර්ධන අවස්ථාවලදී ද, පොකුණු තුළ වර්ධනය කිරීමේදී ද වෛරස ආසාදන විය හැකි සියළුම ක්‍රම අධ්‍යයනය සඳහා මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදී. ආසාදිත නොවූ මව් සතුන්ගෙන් බිහිවූ කීටයන්ද ආසාදිත තත්ව පෙන්නුම් කළ බැවින් අභිජනනාගාරය තුළ කීට වර්ධනය සිදු කරන කාලය තුළ ආසාදන සිදුවිය හැකි බව පෙනිණි. විබ්‍රියෝ විශේෂ හා සුදු පුල්ලි රෝගය අතර සම්බන්ධතාවය හඳුනා ගැනීම ද, වෛරස ආසාදන වලක්වා ගැනීමේ ක්‍රම නිර්දේශ කිරීම ද සිදුවූ අතර, ඉහළ විබ්‍රියෝ මට්ටමක් ඇති ගොවිපොළවල වෛරස ආසාදනය වීමේ සම්භාවිතාව වැඩි බවද පෙනී ගියේය. අධ්‍යයනය ඉදිරි වසර සඳහාද අඛණ්ඩව සිදු කෙරේ.

(b) ඉස්සන්ගේ සෞඛ්‍ය කළමනාකරණය.

අවුරුද්දේ මුල් කාලයේදී ඉතා ඉහළ ලවණතාවයක් හා අඩු වර්ෂාපතනයක් ඇතිවූ අතර, ගොවිපොළවල් 25% ක පමණ ප්‍රමාණයක පමණක් ක්‍රියාත්මක තත්වයේ විය. අප්‍රේල් මාසයේදී ඇතිවූ අධික වර්ෂාපතනය නිසා ඔලන්ද ඇලෙහි ඇමෝනියා තත්වය ඉහළ ගියේය. ගොවිපොළවල් ඔලන්ද ඇලෙහි ජලය භාවිතා කළ බැවින් ඉස්සන්ගේ මරණ අනුපාතය ඉහළ ගියේය. මීට හේතුව සුදු පුල්ලි වෛරසය යැයි සැක කොට ගොවිපොළ වල අස්වැන්න නෙළීම කලින් සිදු කරන ලද නමුත්. පරීක්ෂණ මගින් පෙන්වූයේ හේතුව සුදු පුල්ලි වෛරස් රෝගය

නොවන බවයි. නමුත් පරීක්ෂා කරන ලද ඉස්සන්ගේ ලක්ෂණයන් වූයේ අඩු ඔක්සිජන්, ඇමෝනියා හා පීඩනයන්ය. ග්රෑම් 10 ට අඩු සමහර ඉස්සන් මුදා හැරිය අතර, ධීවරයින් විසින් ඔවුන් අල්ලා ගන්නා ලදී.

අවත් වගා කාල සටහන් හඳුන්වා දුන්නද අවුරුද්දේ මැද භාගය (ජූනි-ඔක්තෝබර්) වනවිට මෝය ප්‍රදේශ ආශ්‍රිත ඉහල ලවණතා අගයන් (40 – 70 ppt) පෙන්වූ නිසා 10% ක පමණ ප්‍රමාණයක් පමණක් ගොවිපොළ සක්‍රියව තිබුණි. වගා කාල සටහනට හා කාලගුණ තත්වයන් එකකට එකක් නොගැලපෙන බැවින් බොහෝ ගොවිපොළ අවුරුද්දේ විශාල කාලයක් වසා දමා තිබුණි. ගොවිපොළ හා අභිජනනාගාර සඳහා අවසර ලබාදීම සිදුවිය.

එක් විද්‍යාත්මක ප්‍රකාශනයක් ඉදිරිපත් කළ අතර, තවත් ප්‍රකාශන සඳහා අනුමැතිය ලැබිණි.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 82%

**ව්‍යාපෘතිය 1.2 – කොස්සා සහ වෙක්කයා යන මත්ස්‍යයන්ගේ අභිජනනය කීටයින්ගේ දිවි පැවැත්ම සහ වගාව කෙරෙහි බලපාන සාධක නිර්ණය කිරීම.**

මව් මසුන් 06 ක් ඇති කරන ලද අතර, තුන්වන කාර්තුව ආරම්භයේදී කලපුවේ ලවණතාවය ඉහළ යාම නිසා සියළුම සතුන් මරණයට පත්විය. පරිණත මව් මසුන් නැවත එකතු කිරීමට ගත් උත්සාහය, මීගමු දඩුගම් ඔයේ මරු වැල් පත්‍රය ගංවතුර නිසා මාස 06 ක කාලයකින් සිදු නොකිරීම නිසා ව්‍යර්ථ විය. ඇල්ගී වගාව විද්‍යාගාරය ඇතුලත හා පිටත පොකුණු තුළ සාර්ථකව සිදු කෙරුණි. පිටත ඇල්ගී ටැංකි තුළ අඩු ගහණ ඝනත්වයකින් වෙක්කයන් තැන්පත් කරන ලදී. මව් මත්ස්‍ය ගහණය වැඩි දියුණු කිරීම සඳහා වෙක්ක ඇඟිලිලන් 1000 ක් මඩ පොකුණු තුළ වගා කරන ලදී. වෙක්කයන් ෆයිබර් ග්ලාස් ටැංකි තුළ වර්ධනය කිරීම සඳහා oil cake ආහාරයක් ලෙස යොදා ගනිමින් පර්යේෂණයක් සිදු කරන ලදී. මත්ස්‍යයන් විශාල හිසක් හා දික්වූ සිහින් ශරීර සහිතව වැඩුණු අතර, පර්යේෂණය සාර්ථක නොවිය. අභිජනනාගාරය කඩා වැටීම නිසා මෙම ව්‍යාපෘතියට බාධා පැමිණිනු අතර, මුහුදු ජල පොම්ප අක්‍රිය වීම නිසා නොවැම්බර් මාසයේදී සම්පූර්ණයෙන් නැවැත්වීමට සිදුවිය.

රොටිෆෙරාවන් (Brachionus plicatilis), ස්කෙලිටොනිමා (Skeletonema), Nanochloropsis sp. Tetraselmis හා Chlorella sp. ගෘහස්ථව හා පිටත පොකුණු තුළ සාර්ථකව වගා කරන ලදී.

කලපුවේ පාවෙන කූඩු තුළ වගා කළ මව් සතුන්, මත්ස්‍ය ආහාර වලට අමතරව ස්වාභාවික ආහාර ගැනීමට හැඩ ගැසී ඇති බව සොයා ගැනිණි. පරිණත මව් මසුන් දෙදෙනෙකුගේ ඩිම්බ වල ස්වභාවය මාසිකව අන්වීක්ෂයක ආධාරයෙන් පරීක්ෂා කරන ලද අතර, ඒවා පරිණත වී නැති බව හඳුනා ගැනිණි.

ප්‍රගතිය : % භෞතික : 40% මූල්‍යමය : 23%

**ව්‍යාපෘතිය 1.3 – ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ජලජීවී කෘෂි ඒකාබද්ධ වගා පද්ධතියක් වැඩි දියුණු කිරීම.**

ප්‍රදේශයේ තිබෙන වැව් 14 ක් නිරීක්ෂණය කළ අතර, එයින් වැව් 08 ක් මසුන් ගහණ අධ්‍යයනයට තෝරා ගැනිණි. ධීවර ජනාවාස 08 ක් මෙම වැව් ආශ්‍රිතව ස්ථාපිත වී ඇති අතර, ක්ෂුද්‍ර අභිජනනාගාර වලින් ලබාගත් තිලාපියා එම වැව් වලට ලබාදුනි.

අඩු වියදම් සහිත ආහාර සඳහා ඉහල පෝෂක ප්‍රමාණයන්ගෙන් යුත් කෘතිම මත්ස්‍ය ආහාර භාවිතා කෙරේ. Macrobrachium පසු කීටයන්ගේ ඉහල වර්ධක අගයන් ලබා ගැනීමට සුදුසු කෘතිම ආහාර වර්ග 3 ක් සන්සන්දනාත්මකව අධ්‍යයනය කරන ලදී. ව්‍යාපෘතියේ මුහුදු පැලැටි අධ්‍යයන කොටස ව්‍යාපෘති අංක 102.8 (මුහුදු පැලැටි වල නිෂ්පාදනතාවය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනය) යටතේ සිදුවිනි.

ප්‍රගතිය : % භෞතික : 80% මූල්‍යමය : 50%

**ව්‍යාපෘතිය 1.4 – ඒක දේශික විසිතුරු මත්ස්‍ය විශේෂවල මත්ස්‍ය පැටවුන් ඇතිදැඩි කිරීම සඳහා යොදන අභිජනන ක්‍රම අධ්‍යයනය සහ විසිතුරු ජලජ පැලෑටි බෝ කිරීමේ ක්‍රම දියුණු කිරීම.**

**a.** ඒක දේශික විසිතුරු මත්ස්‍ය අභිජනනය සඳහා තාක්ෂණික ක්‍රම.

*Puntius nigorofasciatas, Puntius titteya, Danio pathirana, Puntius cumingii, Belontia signata* සහ *Puntius srilankensis* යන මත්ස්‍යයින්ගේ අභිජනන කටයුතු සිදු කරන ලදී. ඒවා අඛණ්ඩව සිදුවිය. *Puntius asoka, Puntius pleurotaenia* යන විශේෂ වලද අභිජනන කටයුතු ඇරඹිනි. මෙම අභිජනන කටයුතු 2005 වසරේදී ද අඛණ්ඩව සිදුවේ. 2004 දෙසැම්බරයේදී සිදුවූ සුනාමි ව්‍යසනය නිසා ඒක දේශික මත්ස්‍ය ගහණය මුළුමනින් විනාශ විය.

**විසිතුරු ජලජ පැලෑටි බෝ කිරීම.**

පෙර වර්ෂවල එකතු කරන ලද පැලෑටි පවත්වා ගැනීම සඳහා අධ්‍යයනයන් සිදුවිය. අලුත් පැලෑටි එකතුවක් සිදු නොවූ අතර, වගා අධ්‍යයනයන් පමණක් සිදුවිය. *Aponogetan* විශේෂය බීජ මගින් ව්‍යාප්ත කිරීමේ අධ්‍යයනය සතුටුදායක විය. ටැංකිවල හා ක්ෂේත්‍රයේදී වෙන වෙනම වැවූ *Aponogetan* විශේෂයේ බීජ ප්‍රචාරණයෙන් උසස් බීජ ප්‍රචාරණයක් දැකිය හැකිවූයේ ගලාගෙන යන ජලය සහිත ක්ෂේත්‍රයේ වැවුනු ඒවායේය. සියලුම ජලජ පැලෑටි එකතුව හා වර්ධනය කළ පැලෑටි සුනාමිය නිසා සම්පූර්ණයෙන් විනාශ වී ගියේය. ක්‍රියාකාරකම් 2005 වසරේදී ද සිදුවේ. ඉල්ලීම් කරන ලද පැලෑටි බෝ කරන හා වවන ස්ථාන පරීක්ෂාව වැඩිදියුණු කිරීමේ උපදේශාත්මක සේවා සිදු කෙරිණි. පර්යේෂණ පත්‍රිකා 03 ක් දේශීය සම්මන්ත්‍රණ සඳහා ඉදිරිපත් කළ අතර, එක් පත්‍රිකාවක් පළාත් සම්මන්ත්‍රණයකට අනුමත වුවද ඉදිරිපත් නොවිය.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 30%

**ව්‍යාපෘතිය 1.5 – ශ්‍රී ලංකාවේ දක්නට ඇති නීති විරෝධී වාර්තාගත නොවූ සහ පාලනය නොවන ධීවර කර්මාන්තයන් පිළිබඳ ගවේෂණය කිරීම.**

ශ්‍රී ලංකාවේ ජලාශ 11 ක් ආශ්‍රිතව පහත දිස්ත්‍රික්කයන්හි ස්ථානවල අඛණ්ඩව දත්ත රැස් කරන ලදී. උඩවලව (රත්නපුර දිස්ත්‍රික්කය), තබ්බෝව (පුත්තලම දිස්ත්‍රික්කය), වාලච්චේන, නාච්චදූව, අංගමුව (අනුරාධපුර දිස්ත්‍රික්කය), උඩුකිරිවෙල, යෝධකණ්ඩිය, ලුණුගම්වෙහෙර (හම්බන්තොට දිස්ත්‍රික්කය), මින්නේරිය හා හඳපාන්විල්ලුව (පොළොන්නරුව දිස්ත්‍රික්කය) මෙම ස්ථාන වේ.

අවුරුද්ද මැද වනවිට රජයේ නිලධාරින් මැදිහත්ව ධීවර සමිති වලට බලය ලබාදීමට අනුමත විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නීති විරෝධී ධීවර ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් නවතා දැමීම හා තහනම් කිරීම සිදුවිය.

ධීවර සමිති සඳහා බලපත්‍ර වලට අනුමැතිය ලබාදීම රජයේ නිලධාරින් විසින් අවුරුද්ද මැද්දී සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමහර ධීවර පන්න ක්‍රම සීමා කරන ලද අතර, සමහර නීති විරෝධී ධීවර පන්න ක්‍රම තහනම් කරනු ලැබීය. මේ නිසා ඇතැම් ජලාශවල මත්ස්‍ය වර්ධනය (උදා:මින්නේරිය) වැඩි දියුණු විය. කුඩා ඇස් සහිත කරමල් දැල් හා මා දැල් අභ්‍යන්තර ජලාශ වලට වඩාත් හානිකර ආම්පන්න ලෙස හඳුනා ගැණිනි. තහනම් කරන ලද තංගුස් දැලද බෙහෙවින් භාවිතා වන පන්න ක්‍රමයක් වේ.

විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා ආනයනය කරන ලද ආගන්තුක මත්ස්‍ය විශේෂයක් වන ටැංකි පිරිසිදු කරන්නා (tank cleaner) මහවැලි තෙත්බිම් ආශ්‍රිත හඳපාන විල්ලුව ආක්‍රමණය කර ඇති බව සොයා ගැණිනි.

**ව්‍යාපෘතිය 1.6 – දකුණු පළාතේ දක්නට ඇති මිරිදිය මත්ස්‍ය විශේෂ විශේෂයෙන්ම ඒක දේශික විසිතුරු මත්ස්‍ය විශේෂ පිළිබඳ සමීක්ෂණය.**

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ගංගාවල මසුන්ගේ වාසස්ථාන සිතියම්ගත කිරීම හා මත්ස්‍ය විශේෂ වල පැවැත්ම සඳහා බලපාන පාරිසරික දූෂණ තත්ව සොයා බැලීමයි.

නිල්වලා හා ගිං ගඟ ආශ්‍රිතව ගවේෂණය සිදුකළ අතර, රුකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය තුළ ඒක දේශික මත්ස්‍ය විශේෂ එකතුවක් ස්ථාපනය කරන ලදී.

ප්‍රගතිය : % භෞතික :75% මූල්‍යමය : 20%

**ව්‍යාපෘතිය 1.7 – උසස් තත්වයෙන් යුතු හා උසස් ඉල්ලුමක් ඇති මිරිදිය විසිතුරු මත්ස්‍යයින්ගේ මව් ගහණයන් ගොඩ නැංවීම.**

Gold fish හා කාපයන්ගේ අභිජනන කටයුතු සිදුවිය. උසස් තත්වයේ ආහාර ලබාදුන් අතර, උසස් තත්වයෙන් යුත් පැටවුන් තෝරා ඔවුන් වෙන්කර ගැනීම සතුටුදායක ලෙස සිදුවුනි. උසස් තත්වයේ මත්ස්‍ය මව් ගහණයක් ඇති කිරීම සඳහා විශේෂිත ආහාර ලබාදීම මගින් ඔවුන්ගේ පෝෂණ තත්වය වැඩි දියුණු කරන ලදී. උසස් තත්වයෙන් යුත් ගප්පි කීටයන් ලබා ගැනීම සඳහා උසස් තත්වයේ ගප්පි විශේෂ ද, උසස් මව් ගහණයක් ලබා ගැනීම සඳහා මොලී, ප්ලේටි හා ස්වෝඩ් ටේල් විශේෂ ද වගා කරන ලදී. එසේම උසස් ප්‍රමිතියෙන් යුත් ගප්පි විශේෂයන් ද නිෂ්පාදනය කරන ලදී.

Tiger හා albino Oscars ගේ පවත්වා ගැනීමේ කටයුතු ද සාර්ථකව සිදුවිය. හොඳ තත්වයේ කුඩා මත්ස්‍ය පැටවු වෙන් කෙරිණි. අඩු වියදමින් යුත් පෝෂ්‍යදායි, උසස් තත්වයේ මත්ස්‍ය ආහාර අප විසින් පිළියෙල කොට මසුන්ට ලබා දුන් අතර, 2004 වසරේදී අභිජනන කටයුතු සතුටුදායක ලෙස සිදුවිය.

සුනාමිය නිසා මෙම සියලු මව් සතුන් හා කීට ගහණය මුළුමනින්ම විනාශ විය.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 65%

**ව්‍යාපෘතිය 1.8 – වාසස්ථාන විනාශවීම කෙරෙහි බලපෑම ඇතිකළ හැකි මුහුදු තෘණවල නිෂ්පාදනාවය විවධ කලපු පරිසර පද්ධති ඇසුරින් සන්සන්දනාත්මක ලෙස අධ්‍යයනය කිරීම.**

2003 වසරේ තිබූ කඩොලාන ප්‍රමාණයට වඩා 40% ක පමණ අඩුවීමක් මීගමුව කලපුවෙන් දක්නට ඇත. මෙයට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගත්තේ ජල තත්වයන්ගේ වෙනස්වීම හා අධික ලෙස කලපුව ගොඩවීමයි. විශේෂයන්ගේ සංයුතියද අඩුවීමක් ඇත. 2003 වසර හා සසඳන විට මුන්දලම කලපුව ආශ්‍රිත අත්හැර දමන ඉස්සන් ගොවිපළ හා ඒ ආශ්‍රිත කඩොලාන පරිසරයේ මුහුදු තෘණවල වැඩිවීමක් පෙන්වයි. පුත්තලම කලපුවේ තල්ලු දැල භාවිතය නිසා මුහුදු තෘණ බිම් විශාල ලෙස විනාශ වී ඇත. මුන්දලම කලපුවේ *Halophila ovalis* ආවරණ ප්‍රතිශතය අඩු වුවද එහි ඒකක වර්ග එලයක ජෛව ස්කන්ධය ඉහළම අගයක් ගත් අතර, පුත්තලම කලපුව අඩුම අගය දැක්විය. *Halophila ovalis* ගේ ප්‍රභාසංස්ලේෂණ වේගය මීගමුව හා මුන්දලම කලපුවේ පිළිවෙලින් 1500 mg $O_2m^2$ / day to 2000 mg $O_2m^2$ / day සහ 2000 mg $O_2m^2$ / day – 2772 mg $O_2m^2$ / day විය.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 50%

**5. ව්‍යාප්ති වැඩ සටහන්.**

1. නුවර වැවේ මසුන් වෙනත් ජලාශවලට බැහැර කිරීම සඳහා ගවේෂණ.

2. මාතර දිස්ත්‍රික්කයේ ගරන්ඩුව කලපුවේ හා වැල්ලමඩම කලපුවේ මසුන් හා ඉස්සන් ඇති කිරීමට සුදුසු ස්ථාන සොයා බැලීම.

3. දකුණු පළාතේ මසුන් ඇති කිරීම සඳහා සුදුසු ස්ථාන සොයා බැලීම, සුරතල් මසුන් පිළිබඳ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම.

4. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පැවැති 12 වැනි "ජන සභා" වැඩ සටහනට සහභාගී වීම.

- විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන - අකුරැස්ස ප්‍රාදේශීය සභාව - 2004 නොවැම්බර්11, 13, 14
- විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන - තිහගොඩ ප්‍රාදේශීය සභාව - 2004 නොවැම්බර් 11
- විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන - කුරුණෑගල ව්‍යාපාර සංවර්ධන ආයතනය - 2004 දෙසැම්බර් 11 18 19
- විසිතුරු මත්ස්‍ය වගාව හා කළමනාකරණ පුහුණු පාඨමාලාව - නාරා ආයතනයේදී - ජනවාරි දින 10 වැඩ සටහන
- විසිතුරු මත්ස්‍ය වගාව හා කළමනාකරණ පුහුණු පාඨමාලාව - නාරා ආයතනයේදී - 14/05/2004 - 30/05/2004
- විසිතුරු මත්ස්‍ය වගාව හා කළමනාකරණ පුහුණු පාඨමාලාව - නාරා ආයතනයේදී - 06/08/2004 - 23/08/2004
- විසිතුරු මත්ස්‍ය වගාව හා කළමනාකරණ පුහුණු පාඨමාලාව - නාරා ආයතනයේදී - 03/12/2004 - 20/12/2004

**6. දැනුවත් කිරීමේ වැඩ සටහන්.**

- ගම්පහ මීගමුව ජා ඇල සහ වත්තල අධ්‍යාපන කලාපයේ පාසැල් ගුරුවරුන් සඳහා වෙරළාසන්න පරිසර පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් කිරීම.
- කඩොලාන පරිසර පද්ධතිය පිළිබඳ පාසැල් ළමුන් දහසක් පමණ දැනුවත් කිරීමේ වැඩ සටහන් කිරීම.

**7. ප්‍රකාශන.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසැල් ළමුන් විශාල පිරිසකට මිරිදිය මත්ස්‍ය වගාව, කඩොලාන පරිසර පද්ධතිය, පොකිරිස්සෝ, සුරතල් මත්ස්‍ය විශේෂ (වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති) පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රකාශන ලබාදීම.

**වාර්තා.**

1. නුවර වැවේ මසුන් බැහැර කිරීමේ මූලික ගවේෂණ වාර්තාව.
2. මාතර දිස්ත්‍රික්කයේ ගරන්ඩුව හා වැල්ලමඩම කලපුවේ පොකිරිස්සන් ඇති කිරීමේ සුදුසු ස්ථාන සොයා බැලීමේ වාර්තාව.
3. ශ්‍රී ලංකා ග්‍රාමීය මිරිදිය කර්මාන්තය සංවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණයන් පිළිබඳ ප්‍රකාශනය (ප්‍රථම ප්‍රකාශනය)
4. ශ්‍රී ලංකාවේ කලාපීය වැව් පිළිබඳ GIFT වාර්තාව (උප කර්තෘ)
5. සීමාසහිත Asia Aquarium වෙතින් අභිජනනය කර අපනයනය කරන ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂ පිළිබඳ පරීක්ෂා කිරීම. 22/12/2004

6. Lumbini Aquarium වෙතින් සිදුකල ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය අභිජනන ප්‍රමාණ සමීක්ෂණයේ වාර්තාව. 05/10/2004

7. Messrs Aquamarine international ආයතනය සඳහා වාර්තාව – ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය අභිජනන සමීක්ෂණ වාර්තාව. 07/09/2004

8. Lumbini Aquarium සඳහා වාර්තාව ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය අභිජනන සමීක්ෂණ වාර්තාව. 09/03/2004

9. බේරුවල ප්‍රදේශයේ තක්සේරු වාර්තාවක්. 22/12/2004

10. කුඩා තුළ මත්ස්‍ය වගාව මත්ස්‍යයින් සඳහා අඩු වියදම් ආහාර පිළියෙල කිරීම, අඩු වියදමින් යුත් තිලාපියා කුඩා අභිජනනාගාර සැදීම පිළිබඳ වාර්තාව.

## 8. ප්‍රකාශන :

01. කොරයා, ජ්.එස්.එල්.ජ්., සහ ජයසිංහ ජේ.එම්.පී.කේ. ඔලන්ද ඇල ප්‍රදේශයේ ඉස්සන්ගේ රෝග පැතිරීමේ නවතම ප්‍රවනතාවය.
SLAFAR වාර්ෂික වාර්තාව.

02. කොරයා, ජ්.එස්.එල්.ජ්., පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විසිතුරු ජලජ පැළෑටිවල පැතිරීම.

03. කොරයා, ජ්.එස්.එල්.ජ්., ජයසේකර, එම්.එස්.එස්., කුරේ, එන්.එන්.ජ්., *Aponageton rigidifolics* නම් ආවේණික මත්ස්‍ය අභිජනන හැසිරීම් පිළිබඳ වැදගත් තත්ව නිරීක්ෂණය.
SLAFAR වාර්ෂික වාර්තාව.

04. කොරයා, ජ්.එස්.එල්.ජ්., ජයසේකර, එම්.එස්.එස්., වාණිජමය වශයෙන් වැදගත් *Aponageton* විශේෂ 3 ක වර්ධනය පිළිබඳ සැසඳීම. ලිංගික හා ශාක ප්‍රචාරණ ක්‍රමවල පැතිරීම. විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව.

05. කොරයා, ජ්.එස්.එල්.ජ්., ශ්‍රී ලංකාවේ ඉස්සන් ආශ්‍රිත ධීවර කර්මාන්තයේ සුදු පුල්ලි වෛරසයේ බලපෑම.
7 වැනි ආසියානු ධීවර සංසදය සඳහා ඉදිරිපත් වීමට අනුමැතිය ලැබුණි. (ඉදිරිපත් නොවීය.)

06. කොරයා, ජ්.එස්.එල්.ජ්., පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ආවේණික හා වඳ වී යාමේ තර්ජනයට ලක්වී ඇති විසිතුරු ජලජ පැළෑටි වන *Cryptocoryne* විශේෂයේ පැතිරීම.
7 වැනි ආසියානු ධීවර සංසදය සඳහා ඉදිරිපත් වීමට අනුමැතිය විය. (ඉදිරිපත් නොවීය.)

07. කොරයා, ජ්.එස්.එල්.ජ්., ඔලන්ද ඇල හා මුන්දලම කලපු පරිසර පද්ධතියේ භාවිතයන් හා සම්පත් විවිධත්වයේ වෙනස්වීම්.
7 වැනි ආසියානු ධීවර සංසදය සඳහා ඉදිරිපත් වීමට අනුමැතිය විය. (ඉදිරිපත් නොවීය.)

08. කොරයා, ජ්.එස්.එල්.ජ්., ශ්‍රී ලංකාවේ මිරිදිය කර්මාන්තයේ තත්වය – APO වැඩමුළුව සඳහා දේශීය වාර්තාව.

09. ISTAVI සඳහා පර්යේෂණ වාර්තාව ශ්‍රී ලංකාවේ Nile තිලාපියා *(Oreochromics niloticus)* හා රතු තිලාපියා *(Oreochromics sp)* කුඩුවල ඇති කිරීම සඳහා පරීක්ෂණය.

10. කොරයා, ජ්.එස්.එල්.ජ්., සහ ජයසිංහ ජේ.එම්.පී.කේ. ඔලන්ද ඇල ප්‍රදේශයේ මිරිදිය පොකිරිස්සන්ගේ රෝග පැතිරීමේ නවතම ප්‍රවනතාවය.
SLAFAR වාර්ෂික වාර්තාව.

**පොත් සහ පත්‍රිකා**

1. විසිතුරු මත්ස්‍ය වගා කටයුතු වලදී රෝග හඳුනා ගැනීම හා පාලනය.

2. විසිතුරු මත්ස්‍ය වගාවේදී ටැංකි සෑදීම, පාලනය හා ජල තත්ව කළමනාකරණය.

3. විසිතුරු මසුන් අභිජනනය.

4. යෝධ මිරිදිය ඉස්සා අභිජනනය.

5. විසිතුරු මත්ස්‍ය තටාක පාලනය කරන නිවැරදි ක්‍රමය.

6. තටාක වල මත්ස්‍ය කිටයන් සඳහා ආහාර ලබාදීම.

7. තටාක වල විසිතුරු මසුන් සඳහා කෘත්‍රිම ආහාර පිළියෙල කිරීම.
   (මෙම 1 සිට 7 දක්වා සිංහල මාධ්‍යයෙනි.)

8. නුවර වැවේ මසුන්.

**පුහුණුවීම්.**

1. ආසියානු නිෂ්පාදන සංවිධානය විසින් මිරිදිය කර්මාන්තය සංවර්ධනය හා තැංවීම සඳහා තාක්ෂණික ක්‍රම පිළිබඳ සාකච්ඡාවක් සඳහා එක් නිලධාරියෙක් දින **05** ක වීන ජලජීවී වගා තාක්ෂණික සංසදයට සහභාගී විය.

2. බැංකොක් AAHRI හි ජලජ ජීවීන්ගේ රෝග විනිශ්චය කිරීම පිළිබඳ එක් මසක පුහුණුවක් සඳහා එක් නිලධාරියෙකු සහභාගී විය.

**සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම්.**

**ජාත්‍යන්තර.**

1. තිලාපියා ඇති කිරීම (ISTAVI) – (01)
   ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

**දේශීය.**

1. SLAAS - සහභාගිත්වය (03)

2. SLAFAR - සහභාගිත්වය (03)

3. ජෛව විද්‍යා ආයතනය (02)

# තොරතුරු තාක්ෂණ අංශය

## අංශ ප්‍රධානී : ජේ.බී.ජේ.කේ.ගුණරත්න මහතා

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

විදේශීය මූල්‍යමය ව්‍යාපෘති 03 ක්ද භාණ්ඩාගාර මුදල් මත ව්‍යාපෘති 02 ක්ද වර්ෂය තුළදී ක්‍රියාත්මක විය දේශීයව ආධාර ලබාදුන් ව්‍යාපෘති වලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබා ගන්නා ලදී.

සමුද්‍ර පරිසරයේ තෙල් කාන්දු වීම් වල බලපෑම් පිළිබඳ අනාවැකි පළ කිරීමේ දත්ත පාරිසරික සංවේදිතා පද්ධතිය (ESI) (විදේශීය ආධාර ලබන ව්‍යාපෘතියක්) ස්ථාපනය කිරීමට නොහැකි වූයේ අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට MPPA ආධාර නොලැබීම නිසාය.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. යෙදවුම් වැඩි දියුණු කිරීම සහ උපකාරක කටයුතු. | නාරා ආයතනයේ අන්තර්ජාල කටයුතු සංවර්ධනය හා ඉහළ නැංවීමේ සේවා. | 0.242 | අජිත් ගුණරත්න | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| 2. දුරස්ථ පරිලෝකනය හා භූගෝලීය තොරතුරු පද්ධතිය. | මීගමුව කලපුව ආශ්‍රිත සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය සහ දුරස්ථ සංජානනය වැඩි දියුණු කිරීම. | 0.123 | අජිත් ගුණරත්න | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |

### 3. කාර්ය සාධනය :

#### 3.1 නාරා ව්‍යාපෘති

**3.1.1** නාරා ආයතනයේ අන්තර්ජාල කටයුතු සංවර්ධනය හා වැඩි දියුණු කිරීම.

පරිගණක ජාලයේ දෘඩාංග හා මෘදුකාංග වල තත්වය වැඩි දියුණු කිරීම, නාරා වෙබ් අඩවි පිටු යාවත්කාල කිරීම හා නාරා පුස්තකාලය හා සෘජු සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීම, අන්තර්ජාල, ඊ-මේල් පද්ධතිය වැඩිදියුණු කිරීම, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සිසුන් උපයෝගී කර ගනිමින් වෘත්තිකයන්ගේ දත්ත පද්ධතියක් ඇති කිරීම හා වාහන වෙන් කිරීමේ පද්ධතියක් ඇති කිරීම සඳහා සැලසුම් කිරීම.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 100%

**3.1.2** මීගමුව කලපුවේ භූගෝලීය පද්ධතියේ හා දුරස්ථ සංජානන කටයුතු සංවර්ධනය හා සංවේදී ප්‍රදේශ කළමනාකරණය.

මීගමු කලපුවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශය හා උප ජල පෝෂක ප්‍රදේශ මගින් කලපුවට සිදුවන බලපෑම ස්වීඩන උප්සලා විශ්ව විද්‍යාල විශේෂඥයින්ගේ සහයෝගයෙන් නිරීක්ෂණය කරන ලදී. කලපුවේ මුහුදු තෘණ බිම් හා වෙරළ කලාපයේ කොරල්පර ඇතුලත් සිතියම් නිර්මාණය කිරීම.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 80%

## 3.2 බාහිර මුදල් සපයන ව්‍යාපෘති.

### 3.2.1 සෘතු අනුව ධීවර වගාවන් සිදු කරන ජලාශ හඳුනා ගැනීම. (ACIAR ප්‍රතිපාදන)

චන්ද්‍රිකා ඡායාරූප උපයෝගී කර ගනිමින් අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්ක වල තෝරාගත් වැව් වල ඒ ආශ්‍රිත පෝෂක ප්‍රදේශය ආවරණය වන පරිදි දත්ත ලබා ගැණිනි. ($P<0.05$) ලෙස ජලජ පැලෑටි ප්‍රතිශතය හා මත්ස්‍ය අස්වැන්න අතර සම්බන්ධතාවය සෘණාත්මක බව නිරීක්ෂණය විය.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 70%

### 3.2.2 හම්බන්තොට පාසැල් වල පාරිසරික අධ්‍යාපන වැඩ සටහන් (HIZCMP)

ව්‍යාපෘතිය මගින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙරළාසන්න පාසල් හි ශිෂ්‍යයන් මගින් ජලජ පරිසරයේ ජලයේ තත්වයන් පිළිබඳ දත්ත පදනමකට ඇතුලත් කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

ප්‍රගතිය : 100% මූල්‍යමය : අරමුදල් ලැබෙන තෙක්.

### 3.2.3 පාරිසරික සංවේදිතාවයන් මත භූගෝලීය තොරතුරු පද්ධතියේ දත්ත පදනම ගොඩ නැගීම. (MPPA – NIVA)

සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය සමග ගිවිසුමක් අත්සන් කරන ලදී. සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරියෙන් අරමුදල් හා දත්ත පද්ධතිය ලැබීමට නියමිතය.

ප්‍රගතිය : % භෞතික : 10% මූල්‍යමය : 0%

## 4. ප්‍රකාශණ

1. ස්ට්‍රොම්ක්විස්ට්, එල්., හොග්, එෆ්., ගුණරත්න, ඒ.බී.ඒ.කේ., රත්නායක, ටී. ශ්‍රී ලංකාවේ මීගමුව කලපුවේ පාරිසරික කළමනාකරණය හා අධීක්ෂණය. (පිළියෙල වෙමින් තිබේ.)
2. විජේනායක, ඩබ්.එම්.එච්.කේ., ගුණරත්න, ඒ.බී.ඒ.කේ., නිත්‍ය නොවන ජලාශ ආශ්‍රිත ධීවර වගාවන් ඇති කිරීමට භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංජානන තාක්ෂණය භාවිතයෙන් සොයා බැලීම. (පිළියෙල වෙමින් තිබේ.)

## 5. වෙනත්.

1. නාරා ආයතනයේ පරිපාලන කටයුතු පරිගණක ගත කිරීම සඳහා දත්ත පදනම් ඇති කිරීම - SLIIT ආයතනයේ කණ්ඩායම් 02 ක් අධීක්ෂණය සඳහා යෙදිණි.
2. භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංජානනීය ක්‍රම පිළිබඳව සාගර විශ්ව විද්‍යාලයේ දේශණ පැවැත්විය.

## පුස්තකාල හා තොරතුරු අංශය.

### අංශ ප්‍රධානි : වී.රූපසිංහ මිය.

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

ජලජ සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු හා දැනුම රැස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රකාශයට පත් කිරීම යන කරුණු සම්බන්ධයෙන් පුස්තකාල සහ තොරතුරු අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අංශයේ කොටස් 02 ක් ඇත. පුස්තකාලය ප්‍රධාන කොටස වන අතර, මූලිකව තොරතුරු හා දැනුම රැස් කිරීම හා බෙදා හැරීම සිදු කරයි. අනෙක් කොටස වන ව්‍යාප්ති අංශය 2002 වසරේ සිට අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙහිදී මාධ්‍ය වැඩ සටහන් සංවිධානය, පුවත්පත් සඳහා ලිපි සැකසීම, ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩ සටහන් සංවිධානය ආදිය සිදුවේ.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. ජලජ සම්පත් පිළිබඳ පුස්තකාල තොරතුරු එක්රැස් කිරීම. | 1.1 ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ තොරතුරු ජාලයක් පුස්තකාලය සම්බන්ධව ගොඩ නැගීම | 0.34 | වී.රූපසිංහ | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| | 1.2 සම්පත් බෙදා ගැනීම. | 0.16 | වී.රූපසිංහ | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| | 1.3 පුස්තකාලයට සම්පත් රැස් කිරීම | 1.00 | වී.රූපසිංහ | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| 2. ව්‍යාප්ති වැඩ සටහන් | 1.4 මාධ්‍ය හා පොදු සම්ප්‍රජානීය වැඩ සටහන් | 1.55 | ජ්.ලියනගේ | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |

**3. කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1.1**

වින්ඩෝස් මෘදුකාංග භාවිතා කර පුස්තකාලයේ දත්ත පද්ධතිය වැඩිදියුණු කෙරිණි මෙමගින් පරිශීලනය කරන්නන් හට අන්තර්ජාලය හරහා කෙලින්ම තොරතුරු කරා පහසුවෙන් ළඟා වීමට හැකිවීම.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 60%

**ව්‍යාපෘතිය 1.2**

ENLINETT SLISTINET හා AGRINET පද්ධති 03 ක් පුස්තකාලයේ සම්පත් බෙදා ගැනීම සඳහා ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය. මෙහි අරමුණ වූයේ ධීවර හා ජලජ සම්පත් විෂය සම්බන්ධ විද්‍යාත්මක තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පත්‍රිකා පිළියෙල කිරීම ආදියයි.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 68%

**ව්‍යාපෘතිය 1.3**

අදාල වර්ෂය තුලදී ත්‍යාග වශයෙන් පොත් 58 ක් ලැබුණු අතර තවත් සඟරා 03 ක් හා පොත් 02 ක් මිළදී ගන්නා ලදී. අමතරව සඟරා 05 ක් සඳහා දායක මුදල් ගෙවීය.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 100%

**ව්‍යාපෘතිය 1.4**

විසිතුරු මත්ස්‍ය අභිජනනය හා වගාව, සාගර සම්පත් පිළිබඳ සැලකිලිමත් විය යුතු විද්‍යාත්මක හරයන් ගැන පුවත්පත් සඳහා ලියැවුනු ලිපි ප්‍රකාශයට පත්විය. ලේක්හවුස් ආයතනයේ පුවත්පතක් වන "ඩෙලිනිව්ස්" හි මේවා පළවිය. විසිතුරු මත්ස්‍ය අභිජනනය, වගාව හා එහි කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 04 ක් සංවිධානය කෙරිණි. විවිධ විද්‍යාත්මක ප්‍රදර්ශන, රූපවාහිනී වැඩ සටහන් සඳහා නාරා ආයතනයේ නිලධාරීන් උනන්දුවෙන් සහභාගී විය.

විවිධ ප්‍රදර්ශන - 10
රූපවාහිනී වැඩ සටහන් සඳහා - 12

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 40%

# සමුද්‍ර ජීව සම්පත් අංශය.

## අංශ ප්‍රධානි : ආචාර්ය සී.අමරසිරි මිය

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය

සජීවී සමුද්‍රික සම්පත් හා පරිසර පද්ධති ආශ්‍රිත කළමණාකරණය, සංවර්ධන සහ සංරක්ෂණය කරා යොමු වූ පර්යේෂණ දියත් කිරීමේ වගකීම සමුද්‍ර ජීව සම්පත් අංශයට පැවරී ඇත.

ප්‍රධාන අංශ 02 කට පර්යේෂණ දියත් කෙරිණි.

1. ධීවර සම්පත්වල සමතුලිතතාවය තබා ගැනීම.
2. පාරිසරික වශයෙන් වැදගත් සමුද්‍ර ක්‍රියාකාරකම් හා සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය.

පර්යේෂණ වැඩසටහන් 03 ක් ලෙස සංවිධානය කෙරිණි.

ධීවර සම්පත් තක්සේරු කිරීම සහ කළමණාකරණය, කොරල් පර සංරක්ෂණය සහ කළමණාකරණය කිරීම, කැස්බෑ සම්පත් කළමණාකරණය සහ සංරක්ෂණය කිරීම වේ. 2004 වසර සඳහා පර්යේෂණ ව්‍යාපෘති 09 ක් දියත් කෙරිණි. අංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ නිලධාරයන් 09 දෙනකු, පර්යේෂණ සහකරුවන් 11 දෙනකු, නියැදිකරුවන් 12 දෙනකු, කිමිදුම් සහකරුවන් දෙදෙනකු, එක් පර්යේෂණාගාර සහායකයකු, දත්ත නිවේශක ශිල්පීන් දෙදෙනකු, එක් යතුරු ලේඛිකාවක සහ කම්කරුවන් දෙදෙනකු ගෙන් සමන්විත වේ. පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම පිළිබඳ වගකීම පර්යේෂණ නිලධරයන් වෙත පැවරී ඇති අතර, ක්ෂේත්‍රීය දත්ත රැස් කිරීමෙන් පර්යේෂණ කටයුතු වලට සහාය දීම, දත්ත රැස් කර තබා ගැනීම, මත්ස්‍ය නියැදි විශ්ලේෂණය කිරීම යනාදිය සිදු කිරීමෙහි වගකීම පර්යේෂණ සහකාරවරුන් සහ කිමිදුම් සහායකයන් වෙත පැවරී ඇත. දත්ත පදනම් යාවත්කාලීන කිරීම සඳහා අක්වෙරළ ධීවර කර්මාන්තය ආශ්‍රිත දත්ත සහ තෝරාගත් වෙරළාසන්න ධීවර පන්න ආශ්‍රිත දත්ත රැස් කිරීම සඳහා නියැදිකරුවන් අනුයුක්ත කොට ඇත. අංශය සතු දත්ත පදනම් පවත්වා ගැනීම දත්ත නිවේශක ශිල්පීන් වෙත පැවරී ඇත.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. ධීවර සම්පත් තක්සේරු කිරීම සහ කළමණාකරණය | 1.1 විශාල ප්‍රමාණයේ උපතිතල මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය. | 1.41 | ආචාර්ය සී.අමරසිරි | අඛණ්ඩ | |
| | 1.2 වෙරළාසන්න මුහුද ආශ්‍රිත මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය. | 0.60 | පී.ජ්.වී.ප්‍රනාන්දු | අඛණ්ඩ | |
| | 1.3 පත්ලේ සරණ මත්ස්‍ය සම්පත් උපයෝජනය පිළිබඳ අධ්‍යයනය. | 0.80 | ආචාර්ය ආර්.මල්දෙණිය | අඛණ්ඩ | |
| | 1.4 ශ්‍රී ලංකාවේ උතුරු මුහුදු තීරයේ ට්‍රෝලිං ධීවර කර්මාන්තයේ තත්වයන් පිළිබඳ මූලික අධ්‍යයනය. | 0.246 | පී.ජ්.ජ්.වී.ජයවර්ධන | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| | 1.5 බටහිර වෙරළ තීරයේ නොගැඹුරු මුහුදෙහි වැලි ගොඩ දැමීම මගින් ඉස්සන් ආශ්‍රිත ධීවර කර්මාන්තය කෙරෙහි ඇතිවන ජීව විද්‍යාත්මක ආර්ථික සහ සමාජ විද්‍යාත්මක බලපෑම් තක්සේරු කිරීම. | 0.238 | පී.ජ්.ජ්.වී.ජයවර්ධන | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.6 P.homarus ගේ මූලික ගහණ ඇස්තමේන්තු කිරීම. | 0.152 | යූ.එස්.පී.ලියනගේ | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| | 1.7 සඳෙහි ආවරණ කාලයන් අනුව මුහුදු කකුළුවන්ගේ හැව හැලීම හා බරෙහි වෙනස්කම් පිළිබඳ ජීව විද්‍යාත්මක හා කර්මාන්තය ගැන අධ්‍යයනය. | 0.18 | ඩී.සී.ටී.දිසානායක | 2004 ජනවාරි | 2004 දෙසැම්බර් |
| 2. කොරල්පර සංරක්ෂණය සහ කළමණාකරණය | 2.1 කොරල් පර සංරක්ෂණය සහ කළමණාකරණය. | 0.17 | ඒ.රාජසූරිය | අඛණ්ඩ | |
| 3. කැස්බෑවුන් සහ සමුද්‍ර ක්ෂීරපායින් සංරක්ෂණය සහ කළමණාකරණය | 3.1 ශ්‍රී ලංකාවේ කැස්බෑවුන් සංරක්ෂණය කිරීම සඳහා පොදු සහභාගිත්ව වැඩ සටහනක් ඇති කිරීම. | 0.179 | ආචාර්ය ආර්.මල්දෙනිය | 2004 | 2005 |
| 4. විශේෂ ව්‍යාපෘති | 4.1 සාගර කෞතුකාගාරය වැඩි දියුණු කිරීම හා නිල් තල්මස් සැකිල්ල සඳහා පියසක් ඉදි කිරීම. | 0.66 | ------------- | 2004 | 2005 |

## 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1.1 – විශාල ප්‍රමාණයේ උපතිතල මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, අක්වෙරළ ධීවර කර්මාන්තයේ විශාල ප්‍රමාණයේ උපතිතල මසුන් පිළිබඳ ජීව විද්‍යාත්මක තොරතුරු හා දත්ත එක්රැස් කිරීමයි. මෙමගින් සම්පතේ වෙනස්වීම පිළිබඳ අධ්‍යයනය සිදුවේ. ප්‍රතිඵල වලදී ධීවර සම්පතේ නිෂ්පාදනය වැඩිවී ඇති බව පෙනිනි. වර්ෂයේ පළමු මාස 10 තුළදී නිෂ්පාදනය වූයේ මෙට්‍රික් ටොන් 87,496 කි. කහ වරල් කෙලවල්ලන් ටොන් 17,514 ක්ද, බලයන් ටොන් 38,784 ක්ද, අනෙකුත් ටූනා මසුන් ටොන් 2891 ක්ද, බිල්ෆිෂ් ටොන් 12,181 ක්ද, මෝරුන් ටොන් 6261 ක් හා අනෙකුත් මසුන් ටොන් 9658 ක් වශයෙන් සමන්විත විය. ටූනා මරුවැල් පන්නය සඳහා යෙදුණු බෝට්ටු සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ලැබිණි. අක්වෙරළ ධීවර කර්මාන්තය සම්බන්ධ දත්ත සාගර සම්පත් අමාත්‍යාංශය හා ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කරන ලදී. තක්සේරුගත කිරීමේදී ඉන්දියානු සාගරයේ බලයන් සම්පත් සම්පූර්ණ වශයෙන් පාවිච්චි කර නැති අතර, කහවරල් හා සප්පරුන් සම්පත් සම්පූර්ණ වශයෙන් පාවිච්චි කරන බව පෙනිණි.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 81.54%

**ව්‍යාපෘතිය 1.2 – වෙරළාසන්න මුහුද ආශ්‍රිත මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය.**

තෝරාගත් වෙරළාසන්න මුහුද ආශ්‍රිත ධීවර දත්ත අවුරුද්ද තුළදී එකතු කරන ලදී. දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම සම්පූර්ණ කෙරිණි. පෙර වසර සමග සසඳන විටදී මත්ස්‍ය උපයෝජනයේ හා එකතුවේ විශාල වෙනස්වීමක් දක්නට නොලැබුණි. ඉන්දියානු දැල්ලාගේ ප්‍රජනනය හා සංක්‍රමණය පිළිබඳ විස්තර අධ්‍යයනය සිදුවිය. "වෙරළාසන්න ධීවර කර්මාන්තය 2004" ලෙස වාර්තාව ඉදිරිපත් කෙරිණි.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 95.67%

**ව්‍යාපෘතිය 1.3 – පත්ලේ සරණ මත්ස්‍ය සම්පත් උපයෝජනය පිළිබඳ අධ්‍යයනය.**

ව්‍යාපෘතිය අංග 03 කින් සමන්විත විය.

- කල්පිටිය සිට කිරින්ද දක්වා පත්ලේ සරණ මසුන්ගේ අධීක්ෂණය.

- මුතුබෙල්ලන් වගාව සඳහා සුදුසු බිම් තෝරා ගැනීම සහ කෘතිම පර ඇති කිරීම මගින් මත්ස්‍ය කර්මාන්තයේ ඵලදායිතාවය වර්ධනය කිරීම.

සියලු සැලසුම් සකස් කෙරිණි. විශාල ප්‍රදේශවල පතුලේ සරණ ගල් මාලු ආදී මත්ස්‍ය කර්මාන්තය සිදුවේ. දැල්ලන්ගේ අස්වැන්නෙහි වැඩිවීමක් දක්නට ලැබුනි.

ත්‍රිකුණාමලයේ කොඩ්බේ හා ක්ලෙපන්බර්ග් හි මුතුබෙල්ලන් වගාව සඳහා අත්හදා බැලීම් සිදු කෙරිණි. ගහණයන්ගේ වර්ධනයන් අධ්‍යයන කාලය තුල අධීක්ෂණය කෙරිණි. කෙසේ වුවත්, සුනාමිය පැමිණීම නිසා වගා භූමි හා පහුරු ආදිය විනාශ වූ බැවින් සැලසුම් කළ පරිදි අධ්‍යයනයන් සම්පූර්ණ කරගත නොහැකි විය.

කෘතිම පර ඇති කිරීම සඳහා කිරින්ද, කලමැටිය හා රූකව සුදුසු ස්ථාන ලෙස තෝරා ගැනිනි. පරයන් ඇති කිරීම සඳහා මූලික කටයුතු සංවිධානය විය.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 80.5%

**ව්‍යාපෘතිය 1.4 – ශ්‍රී ලංකාවේ උතුරු මුහුදු තීරයේ ට්‍රෝලිං ධීවර කර්මාන්තයේ තත්වයන් පිළිබඳ මූලික අධ්‍යයනය.**

ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්මුනේ, මන්නාරම සහ යාපනය දිස්ත්‍රික්කයේ ඉස්සන් ධීවර කර්මාන්තයේ තත්වයන් පිළිබඳ සොයා බැලීනි. කර්මාන්තය සිදු කිරීම සඳහා සූදානම් වෙමින් තිබූ බව පෙනිනි. වර්තමානයේදී ට්‍රෝලිං කර්මාන්තයේ මත්ස්‍ය විශේෂ සංයුතිය, ප්‍රමාණයන්, පරිශ්‍රමයන් ආදී කරුණු හා ඒ ආශ්‍රිත අනෙකුත් ධීවර කර්මාන්තයන්ගේ දත්තයන් ද එකතු කෙරිණි. ට්‍රෝලිං කර්මාන්තය සිදු කිරීමේ සීමා ලිහිල් කිරීම නිසා ඒ සඳහා යෙදෙන බෝට්ටු සංඛ්‍යාවේ ඉහළ යාමක් දක්නට ලැබුණි.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 50.23%

**ව්‍යාපෘතිය 1.5 – බටහිර වෙරළ තීරයේ නොගැඹුරු මුහුදෙහි වැලි ගොඩ දැමීම මගින් ඉස්සන් ආශ්‍රිත ධීවර කර්මාන්තය කෙරෙහි ඇතිවන ජීව විද්‍යාත්මක ආර්ථික සහ සමාජ විද්‍යාත්මක බලපෑම් තක්සේරු කිරීම.**

වැලි ගොඩ දැමීම නිසා ඉස්සන් කර්මාන්තයේදී අස්වැන්නේ ප්‍රමාණයන් හා වර්තමාන අස්වැන්නේ ප්‍රමාණයන් අතර ඇස්තමේන්තු සංසන්දනය කෙරිණි. විශේෂ සංයුතිය ආදියද සංසන්දනය විය. ප්‍රදේශයේ ධීවරයන්ගේ තොරතුරු පරීක්ෂාවට ලක් කිරීමෙන් ආර්ථික හා සමාජීය තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිඵල වලින් පෙනී ගියේ වැලි ගොඩ දැමීමෙන් සැලකිය යුතු බලපෑමක් එල්ල නොවන බවයි.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 67.22%

**ව්‍යාපෘතිය 1.6 – P.homarus ගේ මූලික ගහණ ඇස්තමේන්තු කිරීම.**

ව්‍යාපෘතියේ ප්‍රගතිය රූකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තාවට ලබාදුනි.

ප්‍රගතිය : % භෞතික : 90% මූල්‍යමය : 38.89%

**ව්‍යාපෘතිය 1.7 – සඳෙහි ආවර්ණ කාලයන් අනුව මුහුදු කකුළුවන්ගේ හැව හැලීම හා බරෙහි වෙනස්කම් පිළිබඳ ජීව විද්‍යාත්මක හා කර්මාන්තය ගැන අධ්‍යයනය.**

ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළේ කකුළුවන්ගේ ධීවර කර්මාන්තය පිළිබඳ මූලික අධීක්ෂණයන් සම්පූර්ණ කෙරිණි. මෙම කර්මාන්තයේ යෙදීම්, අස්වැන්නේ ප්‍රගතිය, නිෂ්පාදනය ආදිය ප්‍රබල ලෙස වැඩිවී ඇති බව අධ්‍යයන කාලයේදී සොයා ගැනිණි. මේ පිළිබඳ පෙර දත්ත නොමැති බැවින් සංඛ්‍යාත්මක වශයෙන්

සැසඳීම් සිදු කිරීමට අපහසුය. කකුළුවන් අපනයනය විශාල ලාභ ගෙන දෙන කර්මාන්තයක් නිසා කර්මාන්තය සඳහා නියැළෙන ප්‍රමාණයන්ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

මෙම කර්මාන්තය සඳහා 95% ක් පමණ දෙනා දැල් වශයෙන් භාවිතා කරන්නේ අගල් 2.5-4.4 ප්‍රමාණයේ ඇස් සහිත මොනොෆිලමන්ට් කරමල් දැල්ය. සඳෙහි ආවර්ණ කාලයන් කකුළුවන්ගේ හැව හැලීම හා ප්‍රජනනය රටාවන් සඳහා බලපාන අයුරු අධ්‍යයනය කෙරිණි.

ප්‍රගතිය : % භෞතික : 95% මූල්‍යමය : 80.37%

**ව්‍යාපෘතිය 1.8 – කොරල්පර සංරක්ෂණය සහ කළමනාකරණය.**

1998 වසරෙන් පසු ප්‍රධාන වශයෙන් කොරල්පර වල තත්වයන් පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා අධ්‍යයනයන් සිදුවිය. බාර් රීෆ් සමුද්‍ර අභය භූමිය, හික්කඩුව ජාතික සමුද්‍රික උද්‍යානය, උණවටුන, රුමස්සල සමුද්‍රික අභය භූමිය, වැලිගම/කප්පරතොට, තිලාවේලි හි පරෙවි දූපත ජාතික උද්‍යානය හා ත්‍රිකුණාමලයේ ඕලන්ද දූපත ප්‍රදේශවල කොරල්පර වල තත්වය අධ්‍යයනය කරන ලදී.

කොරල්පර වල තත්ව තක්සේරු කිරීමේදී ස්වාභාවික බලපෑම් හා මිනිසුන්ගේ බලපෑමද සැලකිල්ලට ගැනිනි. අධීක්ෂණයේ ප්‍රතිඵල වාර්තා ලෙසද, විද්‍යාත්මක ලිපි හා සම්මන්ත්‍රණ සඳහාද ඉදිරිපත් කෙරිණි.

ප්‍රගතිය : % භෞතික : 98% මූල්‍යමය : 117.7%

**වැඩ සටහන 3 – කැස්බෑවුන් සංරක්ෂණය හා කළමනාකරණය.**

**ව්‍යාපෘතිය 1.9 – ශ්‍රී ලංකාවේ කැස්බෑ සම්පත සංරක්ෂණය කිරීම සඳහා විද්‍යාත්මක පදනමක් සහිත ක්‍රමයක් ස්ථාපනය කිරීම.**

කැස්බෑ බිත්තර කැදලි අධ්‍යයනය විල්පත්තු ජාතික අභය භූමිය දක්වා අවුරුද්ද තුළදී සිදුවිය. මෙහිදී විශේෂයෙන් කල්පිටියේ ග්‍රාමරක්ෂක කඳවුර, වයඹදිග වෙරළේ කාරතිව් දූපත සහ බත්තලංගුණ්ඩුව දූපත, උච්චමුනේ, පුච්චලම්, සිලාවතුර හා දකුණු පරය ප්‍රදේශවල ඉඳහිට කැස්බෑ කැදලි ඇති බව අනාවරණය විය. පුච්චලම් සිට කල්පිටිය දක්වා ඇතුළුව ඊට ඉදිරියෙන් ඇති දූපත් සඳහා මසකට කැස්බෑවුන් 125-175 ක් අතර ප්‍රමාණයක් පැමිණෙන බව ඇස්තමේන්තුගත විය. මීට අමතරව, 2004 වසරේදී බටහිර වෙරළේ හලාවත සිට ගාල්ල දක්වා මසකට සතුන් 75 ක පමණ ප්‍රමාණයකගේ පැමිණීම වාර්තා විය.

දකුණු හා නිරිතදිග වෙරළ තීරයේ ඇති කැස්බෑ සංරක්ෂණාගාර ආදියෙහි අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කෙරිණි. සංරක්ෂණාගාර විශාල ප්‍රමාණයක නඩත්තු කටයුතු ඉතා පහළ මට්ටමක පැවති අතර, විශේෂයෙන් ජලයේ තත්ව පාලනය හා ටැංකිවල කටයුතු ආදිය ගැන විද්‍යාත්මක පාලන ක්‍රම ඔවුනට උපදෙස් දුනි.

අභිජනනාගාර පාලනය සඳහා ක්‍රමවේදයන් යනුවෙන් පසුගිය අවුරුදු 03 ක පර්යේෂණ එකතුවක් හා තොරතුරු ආදිය වනජීවී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.

සංරක්ෂණාගාර 02 ක කුඩා සිමෙන්ති ටැංකි වල සිට විශාල ඔලුගෙඩි කැස්බෑවුන් හතර දෙනෙකු 2004 වසර තුළදී පරිසරයට නිදහස් කර හැරිණි. මෙයින් දෙදෙනෙකු වසර 08 කට වඩා වයස අතර, අනෙක් දෙදෙනා වසර හතරකට වඩා වයසය.

ප්‍රගතිය : % භෞතික : 98% මූල්‍යමය : 95.74%

**2004 වසර තුළදී ප්‍රකාශයට පත්කළ විද්‍යා ලිපි හා වාර්තා.**


ජයවර්ධන, පී.ඒ.ඩී., මැක්ලස්කි, ඩී.එස්., සහ ටයිට්ලර්, පී., (2004) ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ මීගමුව හා හැදල ප්‍රදේශවල ට්‍රෝලිං මගින් අල්ලන ඉස්සන් කර්මාන්තයේ වර්තමාන තත්වය. ලංකා විද්‍යා සඟරාව 32 : 21-37

ජයවර්ධන, පී.ඒ.ඩී., වෙරළ තීරයේ ඉස්සන් සඳහා සිදු කෙරෙන ට්‍රෝලිං කර්මාන්තයේදී සුදුසු දැ හා ජීව විද්‍යාත්මක බලපෑම අධ්‍යයනය - වාර්තාව 2004 වසරේදී ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ දී ඉදිරිපත් විය.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., (2004)
2000 වසරේදී ශ්‍රී ලංකාවේ අක්වෙරළේ උපතිතල මසුන්ගේ තත්වය.
ජලජ සම්පත් සංගමයේ 9 වැනි වාර්ෂික සැසිය සඳහා ඉදිරිපත් කෙරිණි.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., (2004) ශ්‍රී ලංකාවේ මාදැල් කර්මාන්තය ජලජ සම්පත් සංගමයේ 9 වැනි වාර්ෂික සැසිය සඳහා ඉදිරිපත් කෙරිණි.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., වික්‍රමාරච්චි, ජේ., ගමගේ, ආර්., පෙරේරා, එච්.ඒ.ආර්.ඊ.
ශ්‍රී ලංකාවේ කොග්ගල, මලල සහ රැකව යන කළපුවල ජෛව සංයුතිය සහ ඒ ආශ්‍රිත ධීවර කර්මාන්තයන් කෙරෙහි වෙරළබඩ ඉදිකිරීම් සහ අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් මගින් ඇතිවන බලපෑම, සාරාංශය.

ශ්‍රී ලංකා ධීවර සහ ජලජ විද්‍යා සංගමයේ වාර සඟරාව.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළේ කරමල් දැල් භාවිතය නිසා මාදැල් කර්මාන්තය සඳහා ඇතිවී ඇති බලපෑම් පිළිබඳ *Amblygaster Sirm* ගේ ගහණ ගණත්ව අධ්‍යයනයෙන් තීර්ණය කිරීම.
ආසියානු ධීවර විද්‍යාව සඳහා.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., 90 දශකයේ මැද භාගයේදී ශ්‍රී ලංකාවේ දකුණුදිග වෙරළේ කුඩා සමුද්‍රික මත්ස්‍ය කර්මාන්තයේ තත්වය. 7 වැනි ආසියානු ධීවර සංසදය සඳහා ඉදිරිපත් කෙරිණි.

ප්‍රනාන්දු, පී.ඒ.ටී., Cephalopoda සතුන්ගේ වර්ධනය තක්සේරු කිරීම සඳහා නව ප්‍රවේශයක්. වොන් බර්ටලන්ෆි ක්‍රමය ඇසුරෙන් කැනේඩියානු ජලජීවී විද්‍යා සඟරාවට (අනුමත නොවීය.)

හපුතන්ත්‍රි, එස්.එස්.කේ., මොරේ, ජේ., අමරසිංහ, යූ.එස්., ද සිල්වා, එස්. (2004) ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධතියේ කුඩා සාමුද්‍රික මසුන්ගේ අන්තර් ක්‍රියාකාරිත්ව අධ්‍යයනය පිළිබඳ පද්ධතියක්.

රාජසූරිය, ඒ., සහීර්, එච්., වෙන්කටරාමන්, කේ., ඉස්ලාම්, ඉසෙඩ්, ටමෙලන්ඩර්, ජේ. (2004)
දකුණු ආසියාවේ කොරල්පර වල තත්වයන්.

බංගලා දේශය, චාගෝස්, ඉන්දියාව, මාල දිවයින සහ ශ්‍රී ලංකාව විකින්ස්ටන්, සී., (ed) ලෝකයේ කොරල්පර වල තත්වයන් (2004) (Voo 1 සහ 2) ඕස්ට්‍රේලියානු සමුද්‍ර විද්‍යා ආයතනය.
Vol 1 Pp 213 - 233

රාජසූරිය, ඒ., පෙරේරා, එන්., ප්‍රනාන්දු, එම්., ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලයේ පිහිටි කොරල්පර වල තත්වයන්, ඉන්දියානු සාගරයේ කොරල්පර වල තත්වය පහත වැටීම. තත්ව වාර්තාව 2004, කෝඩියෝ (මුද්‍රණයේ පවතී.)

රාජසූරිය, ඒ., සහ පෙරේරා, එන්., 1998 ප්‍රධාන කොරල්පර විනාශයෙන් පසු වසර 05 කට පසු ශ්‍රී ලංකාවේ කොරල්පර වල තත්වය. ඉන්දියානු සාරගයේ කොරල්පර වල තත්වය පහත වැටීම, තත්ව වාර්තාව 2004 කෝඩියෝ (මුද්‍රණයේ පවතී.)

රාජසූරිය, ඒ., සහ පෙරේරා, එන්., (2004) ශ්‍රී ලංකාවට නව ඒන්ජල් මසුන් (Pomacanthidae) විශේෂ 02 ක්. කෙටි සන්නිවේදනය SLAFAR සඟරාවට.

රා[illegible] මොරටුව් ප්‍රභූද්‍ර මත්ස්‍ය අභිජනනාගාර බිය්නස් ලංකා සඳහා, අපනයන සං[illegible] [illegible] 21 No.2 Pp 2-3

වා[illegible]

රාජ[illegible] හා කරුණාරත්න, සී., (2004) ශ්‍රී ලංකාවේ කොරල්පර වල තත්[illegible] 10 වැනි ජාත්‍යන්තර කොරල්පර සම්මන්ත්‍රණය සඳහා. (ජෝ[illegible])

රාජ[illegible] (2004) විරයාර ලෙස සූරතල් සමුද්‍ර මත්ස්‍ය අස්වැන්න නෙළීම, සාගර සම්පත් අමා[illegible] ප්‍රදර්ශනයෙ සඳහා අත්පොතක් ලෙස.

කො[illegible] සංවර්ධනය කිරීම සඳහා කොළඹ වරාය ආශ්‍රිත පර වල පාරිසරික බලපෑම් තක්[illegible] වාර්තාව.

තා[illegible] ඩ්‍රෙජ්තොටුවාවේ ඉදි කිරීමට වෙරළ තීරයේ බර යන්ත්‍ර ස්ථානගත කිරීම.

තලෙ[illegible] අතර ඉදි කිරීමට යෝජිත සේතු සමුදුම් ව්‍යාපෘතිය සඳහා කොර[illegible] පිලිබඳ තාරා වාර්තාව සඳහා දායක වීම.

ශ්‍රී [illegible] කොරල්පර ගැන ලිපි සැපයීම. (මිතිස්දෝරු දෙපාර්තමේන්තුවේ ජාතික[illegible])

දැ[illegible]

කො[illegible] කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් රුකව විදුහලේ සිදු[illegible] 2004 [illegible] – මෙම වැඩ සටහන ඩා-ස්ව සංරක්ෂණ ව්‍යාපෘතිය සංවිධානය කොට ක්‍රියාත්[illegible]

200[illegible]

[illegible] නිලධාරීන් සඳහා කොරල්පර සංරක්ෂණය මැයෙන් ගෝල්ඩන් ස්ටාර් බීච් හෝ[illegible]. මෙම වැඩමුළුව සංවිධානය කොට ක්‍රියාත්මක කලේ වෙරළ සංරක්ෂණ දෙපා[illegible].

200[illegible]

[illegible] ප්‍රධානීන් සඳහා SLIDA හිදි වෙරළ සංරක්ෂණ දෙපා[illegible] කරන ලද කොරල්පර සංරක්ෂණය හා වෙරළබඩ පරිසර පද්[illegible].

200[illegible]

[illegible] ධීවර පරීක්ෂක දිස්ත්‍රික් ධීවර නිලධාරි ආදි නිලධාරීන් සඳහා, "[illegible] කළමනාකරණය" යන මැයෙන් ඉදිරිපත් කිරීම. මෙම වැඩ සටහන SL[illegible].

[illegible] විසඳුම් සඳහා විවිධ පාසැල් වලින් නාරා ආයතනයට පැමිණි සිදු[illegible] සංරක්ෂණය හා කළමනාකරණය ගැන තොරතුරු සපයා දීම.

# සාගර විද්‍යා අංශය

## අංශ ප්‍රධානි : ආචාර්ය කේ.අරුළානන්දන්

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය

සාගර විද්‍යා අංශයේ ක්‍රියාකාරකම් වෙරළබඩ, අක් වෙරළේ සාගර විද්‍යාව හා සාගර විද්‍යා දත්ත කළමනාකරණය ලෙස වර්ග කොට සිදු කෙරිණි. වෙරළබඩ සාගර විද්‍යා අධ්‍යයන කටයුතු සිදුවූයේ වෙරළබඩ ජල පද්ධතියේ ද්‍රව ගති විද්‍යාව හා වෙරළබඩ පරිසරයේ පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීමට උපකාරී කිරීමත්ය. එසේම අක්වෙරළ සාගර විද්‍යා අධ්‍යයන කටයුතු වලදී ඉදි කිරීම් කර්මාන්තය සඳහා විකල්ප ලෙස තැන්පත් වූ වැලි භාවිතය හා ශ්‍රී ලංකාව වටා මුහුදු ජල මට්ටම වෙනස්වීම් මත වෙරළබඩ ජනාවාස, සම්පත් හා භූරූප විද්‍යා පිළිබඳ අධ්‍යයන සිදු කරන ලදී.

නාරා ආයතනයට මෙම වසර වැදගත් වූයේ, විශ්ව සාගර නිරීක්ෂක පද්ධතිය (GLOSS) එකතුවීම සඳහා අවස්ථාව ඇතිවීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රථම ස්වයං මුහුදු ජල මට්ටම් ස්ථානය මෝදර ගොඩ නැගිනි. සමුද්‍ර කොමිසම මගින් උනන්දු කිරීම මත සමුද්‍ර බලශක්ති සම්පත පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ආයතන / දෙපාර්තමේන්තු / සංවිධාන ආදිය මේ සඳහා එකතු විය. සේතු සමුද්‍රම් වැඩ සටහන සඳහා නාරා ආයතනයේ නිලධාරීන්ද සම්බන්ධ වූ අතර, සාගර විද්‍යා අංශයද ක්‍රියාශීලී ලෙස දායක විය.

ඉන්දියාවෙන් පැමිණි "සමුද්‍ර ෂවුදිකම" නම් මිනුම් නැව හා අංශයේ කණ්ඩායම් දෙකක් 2004 ජනවාරි 8-18 දක්වා කොළඹ උතුර සිට බේරුවල දක්වා බටහිර මහාද්වීපික තටකයේ භූවිද්‍යාත්මක/භූ භෞතික විෂමතා ගැන අධ්‍යයනය සඳහා යොමුවිය. ඉන්දියානු සාගරයේ විශ්ව සාගර නිරීක්ෂණ පද්ධතිය (IOGOOS – 11) සඳහා මූලික සංවිධාන කටයුතු සිදු කරන ලදී. සම්මන්ත්‍රණය 2004 අප්‍රේල් 26 සිට 29 කොළඹදී පවත්වන ලදී.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම්.

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. ශ. | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. වෙරළාසන්න සාගර විද්‍යාව | 1.1 වෙරළාසන්න ජල ස්කන්ධයන් හි සහ ඒ ආශ්‍රිත ජලාශවල භෞතික සහ ජීව විද්‍යාත්මක සාගර විද්‍යා අධ්‍යයනය. | 0. 4 | ආචාර්ය කේ.අරුළානන්දන්<br>එච්.බී.ජයසිරි<br>එස්.යූ.පී.ජිනදාස | 2000 සිට | 2010 දක්වා |
| | 1.2 ශ්‍රී ලංකාව අවට මුහුදේ කෙටිකාලීන සහ දිගුකාලීන මුහුදු මට්ටම් විචලනයන් අධ්‍යයනය කිරීම, ආකෘති ගත කිරීම. | 0. 4 | ආචාර්ය<br>ජේ.එම්.එස්.විජේරත්න | 2000 සිට | 2010 දක්වා |
| 2. අක්වෙරළ ආශ්‍රිත සාගර විද්‍යාව | 2.1 ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකය ආශ්‍රිත භූ විද්‍යාත්මක භෞතික සහ රසායනික සාගර විද්‍යා පරාමිතික අධ්‍යයනය (සයුරි යාත්‍රාව ආධාරයෙන්) | 0. 6 | එස්.යූ.පී.ජිනදාස<br>එච්.බී.ජයසිරි<br>ආචාර්ය කේ.අරුළානන්දන් | 2000 සිට | 2010 දක්වා |
| | 2.2 දුරස්ථ චන්ද්‍රිකා ස්වයං පාලන තාක්ෂණය මගින් සමුද්‍රයේ වෙනස්වීම් හරහා ධීවර කටයුතු සිදු කිරීමට සුදුසු කලාප ගැන අනාවැකි කීමේ පද්ධතියක් ඇති කිරීම. | 0. 6 | ජේ.කේ.රාජපක්ෂ | 2000 සිට | 2010 දක්වා |
| 3. සාගරික දත්ත කළමනාකරණය | 3.1 ශ්‍රී ලංකා ජාතික සාගර විද්‍යාත්මක දත්ත පදනම | 0. 2 | ආචාර්ය කේ.තෙන්නකෝන් | 2000 සිට | 2010 දක්වා |
| 4. ජාතික සාගර විද්‍යා දත්ත මධ්‍යස්ථානය | 4.1 ජාතික සාගර විද්‍යා මධ්‍යස්ථානය (NDC) | 0. 3 | ආචාර්ය කේ.තෙන්නකෝන් | 2000 සිට | 2010 දක්වා |

3. තාරා ව්‍යාපෘති.

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍යමය |
| 1.1 වෙරළබඩ ජල පද්ධති හා ආශ්‍රිත ජලයේ භෞතික ජීව විද්‍යාත්මක හා සාගර විද්‍යාත්මක භූ විද්‍යා අධ්‍යයනය. | 85 | 54.34 |
| 1.2 ශ්‍රී ලංකාව වටා ජල තීරයේ කෙටි හා දිගුකාලීන ජල මට්ටම් වෙනස්වීම් පිළිබඳ අධීක්ෂණය හා අධ්‍යයනයන්. | 90 | 57.56 |
| 2.1 ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකය ආශ්‍රිත භූ විද්‍යාත්මක, ජෛව විද්‍යාත්මක, භෞතික සහ රසායනික සාගර විද්‍යා පරාමිතික අධ්‍යයනය (සයුරි යාත්‍රාව ආධාරයෙන්) | 75 | 35.30 |
| 2.2 දුරස්ථ චන්ද්‍රිකා ස්වයං පාලන තාක්ෂණය මගින් සමුද්‍රයේ වෙනස්වීම් හරහා ධීවර කටයුතු සිදු කිරීම, සුදුසු කලාප ගැන අනාවැකි කීමේ පද්ධතියක් ඇති කිරීම. | 50 | 8.13 |
| 3.1 ශ්‍රී ලංකා ජාතික සාගර විද්‍යාත්මක දත්ත පදනම. | 100 | 149.68 |
| 4.1 ජාතික සාගර විද්‍යා මධ්‍යස්ථානය. | 100 | 99.35 |

4. ප්‍රකාශන.

5.1 පර්යේෂණ ලිපි – අරුළානන්තන්, කේ. (2004).
මඩකලපුව කලපුවේ ජලයේ තත්වය හා භෞතික ක්‍රියාකාරකම් SLAFAR සඳහා ඉදිරිපත් කෙරිණි.

අරුළානන්තන්, කේ. (2004).
කලපුවල නොගැඹුරු ජලය හා මිරිදිය ජලය අතර ජල හුවමාරුවේ බලපෑම් – පුත්තලම කලපුව – ශ්‍රී ලංකාවේ පුත්තලම් කලපුව හා මෝය.

අරුළානන්තන්, කේ. (2004).
ශ්‍රී ලංකාවේ නොගැඹුරු මෝය 02 ක් අතර ගති විද්‍යාව – ඉන්දියානු සාගර මුහුදු පරිසර සමුළුව – පර්ත් – බටහිර ඕස්ට්‍රේලියාව, 14 සිට 18 පෙබරවාරි 2005.

අරුළානන්තන්, කේ. (2004).
ඉහළ ලවණතාවයකින් යුත් මෝය ප්‍රදේශයේ කාලානුරූපීව ජල හුවමාරුව – ඉන්දියානු සාගර මුහුදු පරිසර සමුළුව– පර්ත් – බටහිර ඕස්ට්‍රේලියාව, 14 සිට 18 පෙබරවාරි 2005.

ජයසිරි, එච්.බී., ක්ලෝරොෆිල් – ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලපු හා මෝය වල ක්ලෝරෆිල් වල පෝෂ්‍ය තත්වය තක්සේරු කිරීමේ මෙවලමක් වශයෙන්.

ජිනදාස, එස්.යූ.පී., පොන්සේකා, ජී.එම්., සහ සිල්වා, ද.ආර්.පී.,
ශ්‍රී ලංකාවේ මොණරාගල ප්‍රදේශයේ චුම්බක ක්ෂේත්‍රය වෙනස්වීම මගින් භූ විද්‍යාත්මක ව්‍යුහය නිර්ණය කිරීම හා භූගත ජලය තිබිය හැකි ස්ථාන හඳුනා ගැනීම – ඉදිරිපත් විය.. 4 වැනි භූ විද්‍යා සමුළුව – නේපාලය.

ජිනදාස, එස්.යූ.පී.,
ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකයේ අවසාධිතයන් පිළිබඳ මූලික පරීක්ෂණ සිදු කිරීම.
ශ්‍රී ලංකා ජලජ විද්‍යා සගරාවට අනුමත විය.

ජිනදාස, එස්.යූ.පී.,
ශ්‍රී ලංකාවේ දකුණු මහාද්වීපික තටකයේ ඇති අවසාධිත හා බනිජ මුහුදු තරංග අනුව වෙනස්වීම අධ්‍යයනය.

SLAFAR සඳහා ඉදිරිපත් විය.

රාජපක්ෂ, ජේ.කේ., සමරකෝන්, ලාල්., යොකොයාමා රුසෝ.,
TERRA/MODIS හා SST මගින් ඉන්දු චීන අර්ධද්වීපයේ ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය.
ස්වයං සංජානනය පිළිබඳ ආසියානු සමුළුව, තායිලන්තයේ 22 – 26 නොවැම්බර් 2004.

තෙන්නකෝන්, ටී.කේ.ඩී. හා අරුලානන්තන්, කේ.,
ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ සාගර ශක්ති විභවයන්.
"ශ්‍රී ලංකාවේ ඊසානදිග ප්‍රදේශයේ පාරිසරික කළමනාකරණය" යන මැයෙන් ජාත්‍යන්තර වැඩමුළුවකට ඉදිරිපත් විය.

විජේරත්න, ඊ.එම්.එස්., රිඩ්බර්ග්, එල්., හා පතිරණ, කේ.පී.පී.,
ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ හලාවත කඩින් කඩ වැසෙන කලපුව ආශ්‍රිත උදම් මෝයේ මුහුදු මට්ටම, ජල හුවමාරුව හා විසිරීම පිළිබඳ ආකෘතීන්.
ශ්‍රී ලංකාවේ, පේරාදෙණියේ 2004 මැයි 17 – 21 දක්වා පැවැති දහවැනි ආසියානු ජල කාර්මික සමුළුවට.

විජේරත්න, ඊ.එම්.එස්., රිඩ්බර්ග්, එල්., හා පතිරණ, කේ.පී.පී.,
ශ්‍රී ලංකාවේ නොගැඹුරු උදම් ජල ප්‍රදේශයක් වූ මීගමුව කලපුව සඳහා 1D හා 2D උදම් ආකෘතීන් සැසඳීම.
ශ්‍රී ලංකාවේ පේරාදෙණියේ 2004 මැයි 17–21 දක්වා පැවති දහවැනි ආසියානු ජල කාර්මික සමුළුවට.

විජේරත්න, ඊ.එම්.එස්., පට්ටිආරච්චි, චරිත, බී., සහ ග්‍රේල්, එමා.,
පෝක් සන්ධිය තුලින් මෝසම් කාලයේදී ජල හුවමාරුව පිළිබඳ ආකෘතීන්,
ඉන්දියානු සාගර මුහුදු පරිසර සමුළුව, පර්ත්, ඕස්ට්‍රේලියා. 2005 පෙබරවාරි 14–18

විජේරත්න, ඊ.එම්.එස්., රිඩ්බර්ග්, එල්.,
උදම් දෝලනය පිළිබඳ ආකෘතියක්,
ශ්‍රී ලංකාවේ පුත්තලම් කලපුවේ අධි ලවණතාවය ඇති ප්‍රදේශවල උදම් වෙනස්වීම් වල ස්ථිර වේලාවන්.
ඉන්දියානු සාගර මුහුදු පරිසර සමුළුව බටහිර ඕස්ට්‍රේලියාවේ, පර්ත්.
2005 පෙබරවාරි 14–18

විජේරත්න, ඊ.එම්.එස්., පට්ටිආරච්චි, චරිත, බී.,
ශ්‍රී ලංකාවේ ජල තීරයේ මුහුදු ජලයේ වෙනස්වීම්
ඉන්දියානු සාගර මුහුදු පරිසර සමුළුව, බටහිර ඕස්ට්‍රේලියාව, පර්ත්.
2005 පෙබරවාරි 14–18

## 5.2 පර්යේෂණ වාර්තා.

ජිනදාස, එස්.යූ.පී.,
මුදුන් ඇල සංවර්ධන ව්‍යාපෘතියේ භූගර්භ හා භෞතික විද්‍යාව පිළිබඳ වාර්තාව, අක්වෙරළ ගොඩැලි ප්‍රදේශ අධීක්ෂණය.

තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කලාපීය කොමිසමේ මධ්‍යම ඉන්දියානු සාගර හා සාගර දත්ත හා තොරතුරු ජල ව්‍යාපෘතියේ රටවල් 19 ක කලාපීය ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති යෝජනාවලිය.

තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
සමුද්‍ර මාරු ගමන් සිතියම (SM 18, 22, 24) නැවත පිළියෙල කිරීම.
තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
සමුද්‍ර මාරු ආදර්ශ සිතියම – නැවත පිළියෙල කිරීම.

5.3 **පොත් / පත්‍රිකා.**
**පුවත්පත් සඳහා ලිපි.**

ජිනදාස, එස්.යූ.පී.,
ගංගා වැලි වෙනුවට මුහුදු වැලි
දිනමිණ - 24/08/2004

ද, සිල්වා නිශාන්ත.
ආර්ගෝ බෝයා - නාරා පුවත් සඳහා.

රාජපක්ෂ, ජේ.කේ.,
ධීවර කර්මාන්තයේ ඉදිරි ගමන සඳහා දුරස්ථ සංජානන ක්‍රම යොදා ගැනීම.
ක්‍රමයන් - දිනමිණ 17/08/2004

රාජපක්ෂ, ජේ.කේ.,
මත්ස්‍ය අස්වැන්න නෙළීම සඳහා චන්ද්‍රිකා තාක්ෂණය භාවිතය.
නාරා පුවත් සඳහා 4 වෙළුම 1 කලාපය

උඩවත්ත, අමල්,. තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
විදුසර විද්‍යා සඟරාවට "ඉසුරු ආකරයක් මැද අපේ අනාගතය" 32 වෙළුම.
11/08/2004

විජේරත්න, ඊ.එම්.එස්.,
සුනාමිය ගැන 2004/12/30 දින ලක්බිම පුවත්පතට.

විජේරත්න, ඊ.එම්.එස්.,
ශ්‍රී ලංකාව වටා ආර්ගෝ බෝයා යෙදීම. WWW. argoinformation center.

6. **පුහුණුවීම් / දැනුවත් කිරීම්**
IOMAC මගින් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති වැඩසටහනට
අපේ දේශයට සාගර විද්‍යාවේ වැදගත්කම.
අරුලානන්තන්, කේ.,

තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
ජාතික ධීවර හා නාවුක ඉංජිනේරු ආයතනයේ සිසුන් සඳහා ඉගැන්වීම්.

ජිනදාස, එස්.යූ.පී.,
ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත හා අක්වෙරළේ ඛනිජ සම්පත් සංවිධානය, භූ විද්‍යා හා ඛනිජ සම්පත් පර්යේෂණ කමිටුව.

තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
IOMAC මගින් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති වැඩ සටහනට -
අපේ දේශයට සාගර විද්‍යාවේ වැදගත්කම.

තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
කටුනායක උසස් තාක්ෂණ ඩිප්ලෝමා ආයතනයේ ඉගැන්වීම්.

තෙන්නකෝන්, ටී.කේ.ඩී., විසින් පුහුණු කිරීම්.
වීරසිංහ, එම්.එස්.එම්., (04/9441) සහ අමරදාස, ඩබ්.එන්.ඩී., (04/9458) මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යාව හදාරන සිසුන් සඳහා.

විජේරත්න, ඊ.එම්.එස්.,
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ තුෂාර, එච්.කේ.ආර්., රත්මඩුගල, සංජීව., හා ආරියරත්න, එච්.ඊ.කේ.එස්., යන සිසුන්ගේ උපාධියේ පරීක්ෂක ලෙස.

# පසු අස්වනු තාක්ෂණ අංශය

**අංශ ප්‍රධානී : ආචාර්ය රංජිත් එදිරිසිංහ**

## 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය

ධීවර හා ජලජ සම්පත හා සම්බන්ධ පසු අස්වනු තාක්ෂණයේ විවිධ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලි සඳහා දායකවීම අංශය මගින් සිදු කරයි. එසේම ධීවර නිෂ්පාදන, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන, ජලජීවී වගාව හා සම්බන්ධ ක්ෂුද්‍ර ජීවාත්මක සහ රසායනික විශ්ලේෂණ පරීක්ෂණ සේවා තත්ව පාලන පර්යේෂණාගාරය මගින් ලබාදෙයි. ප්‍රධාන කණ්ඩායම් 3 ක් මගින් අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලි සිදු කරයි. උදාහරණ ලෙස, පරීක්ෂණ සේවා, මත්ස්‍ය නිෂ්පාදන හා ආහාරවල සංවර්ධනයන් ආදියයි. 2004 වසර තුළදී ප්‍රධාන ව්‍යාපෘති 5 ක් හා පරීක්ෂණ සේවා ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. ඊට අමතරව 7 වැනි ව්‍යාපෘතිය ලෙස උපකරණ මිලදී ගැනීම් ආදිය සිදුවිය.

තත්ව පාලන විද්‍යාගාරයේ ඇති ක්ෂුද්‍රජීව විද්‍යා අංශය මගින් ISO 17025 තත්ව සහතිකය යටතේ පරීක්ෂණ වාර්තා ලබාදුනි. ඊට අමතරව ඉස්සන්ගේ සිරුරේ ඇති ප්‍රතිජීවක නිර්ණය කිරීමේ කාර්යයන්ද සිදු කරයි. පසු අස්වනු තාක්ෂණ අංශය මගින් ධීවර නිෂ්පාදනාගාර වල සනීපාරක්ෂක ප්‍රශ්න වැරදි ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ කර්මාන්තයට සම්බන්ධ නිලධාරීන් සඳහා තාක්ෂණ දැනුම ලබාදීම ආදියද සිදු කරයි. ඊට අමතරව අංශය විසින් විවිධ කර්මාන්ත සඳහා පසු අස්වනු තාක්ෂණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ සටහන්, විවිධ ඉදිරිපත් කිරීම් ආදිය ඉටු කරන ලදී.

වර්තමානයේදී අංශයේ පර්යේෂණ නිලධාරීන් 05 ක්, පර්යේෂණ සහකාරවරුන් 01 ක්, දත්ත සැකසුම් ක්‍රියා කරන්නෙක් හා සේවා සැපයුම් ලෙස විද්‍යාගාර සහායකයින් 02 ක් හා කම්කරුවන් 08 දෙනෙකුත් සේවය කරයි. එක් පර්යේෂණ නිලධාරියෙක් ඔහුගේ ආචාර්ය උපාධිය නිමකර වර්ෂය ආරම්භයේදී පමණ ආපසු පැමිණියේය. එසේම තවත් නිලධාරිණියක් ඇයගේ ආචාර්ය උපාධිය සඳහා අවුරුද්ද අවසාන භාගයේදී දිවයිනෙන් බැහැරව ගියාය. වර්තමානයේදී පර්යේෂණ නිලධාරි පුරප්පාඩු 02 ක් පවතී. පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු සිංගප්පූරුවේ හා තායිලන්තයේ පැවති මත්ස්‍ය ආහාරවල තත්ව නිර්ණය කිරීමේ කෙටි පුහුණුවක් සඳහා සහභාගි වූහ. එක් පර්යේෂණ සහකාරවරයෙක් විද්‍යාගාර කළමනාකරණ පාඨමාලාවක් හදාරයි.

ISO තත්ව පාලන වැඩ සටහනේ අවශ්‍යතාවය අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ITI ආයතනයේදී පැවැත්වූ පුහුණු පාඨමාලා කිහිපයක් සඳහා අංශයේ සේවකයින් සහභාගි වූහ.

2004 දෙසැම්බර් 26 දින පැමිණි සුනාමිය නිසා අංශයට බරපතල හානි සිදුවිය. රසායන විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා හා කාබනික රසායනාගාරය හා නිෂ්පාදන අංශ තදබල ලෙස විනාශයට පත්විය. සමහර විද්‍යාගාර උපකරණ හා කාර්යාලීය අංග විනාශ වී ගිය අතර, අනෙක් ඒවා තදබල ලෙස හානියට පත්විය.

## 2. සිදු කරන ලද ක්‍රියාකාරකම්.

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. ශ. | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1 | නාරා ආයතනයේ තත්ව පාලන පර්යේෂණාගාරයට බලය ලත් පර්යේෂණාගාරයක තත්වය ලබා ගැනීම. | 2.2 | කේ.ඩබ්.එස්. ආරියවංශ<br>පී.ජේ.ගනේගමආරච්චි | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 2 | ධීවර කර්මාන්තය ආශ්‍රිත ගුණාත්මක තත්ව පාදක පසු අස්වනු හානි අඩුකර ගැනීම සඳහා පිළියම් සොයා බැලීම. | 0.6 | පී.ජේ.ගනේගමආරච්චි | 2004 ජනවාරි | 2004 දෙසැ: |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව ප්‍රමිතීන් වර්ධනය කිරීම සඳහා ක්‍රම සොයා බැලීම. | 0.5 | කේ.ඩබ්.එස්.ආරියවංශ | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 4 | ජලජීවී වගා ධීවර කර්මාන්තයේදී යොදා ගන්නා ප්‍රතිජීවක හා සත්ව ඖෂධ ද්‍රව්‍ය වල පාවිච්චිය හා අවශේෂ ප්‍රමාණ අධීක්ෂණය. | 0.8 | ආචාර්ය ආර්.එදිරිසිංහ | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 5 | අඩු මිල මත්ස්‍ය සම්පත් යොදා මත්ස්‍ය නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ලුණු දමා කල් තබා ගත හැකි මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව පාලනය. | 0.5 | පී.එස්.ජයසිංහ | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 6 | මෝට්ටින්ගේ නිෂ්පාදන වල වෙළඳපල අගය වැඩිදියුණු කිරීම. | 0.4 | අයි.කාරියවසම් | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 7 | උපකරණ | 3.6 | | 2004 ජනවාරි | 2004 දෙසැ: |

## 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1: නාරා ආයතනයේ තත්ව පාලන පර්යේෂණාගාරයට බලය ලත් පර්යේෂණාගාරයක තත්වය ලබා ගැනීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මත්ස්‍ය හා ඒ ආශ්‍රිත ආහාරවල තත්ව සහතික උසස් පරීක්ෂණ මගින් නාරා ආයතනයෙන් ලබාදීමයි. අයි.එස්.ඕ. / අයි.ඊ.සී. 17025 ප්‍රමිතියට අනුකූල ගුණාත්මක තත්ව පාලන වැඩ පිළිවෙලක් පර්යේෂණාගාරයෙහි ක්‍රියාත්මක වේ. පරීක්ෂණ සිදු කෙරෙන තත්වපාලන විද්‍යාගාරයට 2004 මාර්තු මස සිට පහත සඳහන් පරීක්ෂණ සඳහා බලයලත් තත්වයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලැබුණි.

ස්වායු බැක්ටීරියා ප්‍රමාණය.
ආන්ත්‍රික බැක්ටීරියා.
මළපහ සමග පිටවන ආන්ත්‍රික බැක්ටීරියා.
ඊ කෝලි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විගණනයට හා තක්සේරුව අභ්‍යන්තර විගණනයට හා කළමනාකරණ තක්සේරු ද සිදුවිය. මීට අමතරව ඉන්පසු කර්මාන්තයේ නියැදි පරීක්ෂණය හා වාර්තා ලබාදීම සිදුවිය.

ටෙන්ඩර් පරිපාටියට අනුව රසායනික ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම් සිදුවන බැවින් ව්‍යාපෘතියේ කාර්යයන් ප්‍රමාද විය.

ප්‍රගතිය : % භෞතික : 80% මූල්‍යමය : 35%

**ව්‍යාපෘතිය 2 : ධීවර කර්මාන්තය ආශ්‍රිත ගුණාත්මක තත්ව පාදක පසු අස්වනු හානි අඩුකර ගැනීම සඳහා පිළියම් සොයා බැලීම.**

පෙර වර්ෂයේ සිදුකල ක්‍රියාකාරකම් අඛණ්ඩව කෙරිණි. අදාල වර්ෂය තුළදී නිවැරදි මසුන් පරිහරණය මගින් මත්ස්‍ය විශේෂවල නැවුම් හා පිරිසිදු බව හා තත්වය අධ්‍යයනය කරන ලදී. බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල හා ත්‍රිකුණාමලය ධීවර වරායන්හි බහුදින යාත්‍රා මගින් අල්ලන ලද මෝරුන් හා ටූනා මසුන්ගේ හා වරායන්ගේ තත්වයන් තක්සේරු කෙරිණි. ත්‍රිකුණාමලය ප්‍රදේශයේ කුඩා මසුන් ඇල්ලීම හා මූලික මත්ස්‍ය පරිහරණ ක්‍රම හා මසුන් බෙදා හරින තෝරාගත් අංශයන්හි අධ්‍යයනයන් සිදු කෙරිණි. අදාල ධීවර කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සමග ව්‍යාප්ති වැඩ සටහන් දියත් කර ඒ ආශ්‍රයෙන් සොයාගත් කරුණු හරහා නිර්දේශ කිරීම් සිදුවිය.

තවත් අධ්‍යයනයක් ලෙස වියලන ලද මසුන් ප්ලාස්ටික් මලුවල ඇසිරීමේදී හා රාක්ක වල තත්වයන් දියුණු කිරීම සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණ වූයේ, අඩු උෂ්ණත්ව තත්වයන්හිදී වායුරෝධක කර මුද්‍රා තැබූ මලුවල ගහණයන්ගේ වර්ධනයන් අඩු කිරීමයි.

ප්‍රගතිය : %    භෞතික : 95%    මූල්‍යමය : 59%

**ව්‍යාපෘතිය 3 : මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව ප්‍රමිතීන් වර්ධනය කිරීම සඳහා ක්‍රම සොයා බැලීම.**

2002 වසරේ සිට අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘතියකි. මසුන්ගේ ගුණාත්මක තත්ව සූචි ක්‍රමය මගින් ගබඩා කාලය ඇතුලත දී කිසියම් මත්ස්‍ය විශේෂයක සංවේදී පරාමිති සහ ගුණාංග අගැයීමට ලක් කෙරේ. මෙම අධ්‍යයනයේදී, *Thunnus albalaros* (කහවරල් කෙලවල්ලා) මත්ස්‍ය විශේෂය සඳහා ගුණාත්මක තත්ව සූචියක් වැඩි දියුණු කරන ලදී. ව්‍යාපෘතිය අංක 1 හි කටයුතු වල තියැලෙන්නට සිදුවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපාන ලදී.

ප්‍රගතිය : %    භෞතික : 85%    මූල්‍යමය : 38%

**ව්‍යාපෘතිය 4 : ජලජීවී වගා ධීවර කර්මාන්තයේදී යොදා ගන්නා ප්‍රතිජීවක හා සත්ව ඖෂධ ද්‍රව්‍යවල පාවිච්චිය හා අවශේෂ ප්‍රමාණ අධීක්ෂණය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ජලජීවී වගා ධීවර කර්මාන්තයේදී සත්ව බෙහෙත් ද්‍රව්‍යයන්හි භාවිතය සොයා බැලීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පෙනී ගියේ ජලජීවී වගා කර්මාන්තයේදී පොදු සෞඛ්‍යයට අන්තරායකර හා පරිසරයට හානිදායී බෙහෙත් ද්‍රව්‍ය පාවිච්චියට ගැනීම ව්‍යාප්ත වී ඇති බවයි. අධ්‍යයන කාලය තුලදී ඉස්සන්ගේ ක්ලෝරොෆෙනිකොල් මට්ටම මැනීම සඳහා එලීසා (ELISA) ක්‍රමය ස්ථාපිත කරන ලදී.

ඉස්සන්ගේ නියැදි ගණනාවක් ගොවීන්ගෙන් හා කර්මාන්තශාලා වලින් නිරීක්ෂණයන් සඳහා එකතු කරන ලදී. නියැදි පරීක්ෂණයන්ට අනුව බොහෝ නියැදි වල මිනිය හැකි ප්‍රමාණය වන (0.2 ppm) වලට වඩා අඩුවෙන් පැවතිය අතර, එක් නියැදියක මට්ටම පමණක් 0.2 ppm ට වඩා ඉහලින් තිබුණි. කෙසේ වුවත් ELISA ක්‍රමයේ සංවේදීතාවය බෙහෙත් ද්‍රව්‍ය වල බිංදුවේ මට්ටමට විශ්ලේෂණය කිරීමට ප්‍රමාණවත් නොවීය. එම නිසා ඉස්සන්ගේ ක්ලෝරොෆෙනිකොල් මට්ටම බිංදුව දක්වා පෙන්විය හැකි HPLC/MS/MS ක්‍රමය ස්ථාපිත කිරීමට සිදුවිය.

ඊට අමතරව ELISA ක්‍රමය කර්මාන්තයේ නියැදි පරීක්ෂණයට හා පරීක්ෂණ වාර්තා ලබාදීමට භාවිතා කෙරුණි. අනෙකුත් ප්‍රතිජීවක වල අධ්‍යයනයන් මට්ටම් නිර්ණය කිරීමද සිදුවිය. එම ක්‍රමයන් ද ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ නාරා ආයතනය තුල ස්ථාපිත කිරීමට නියමිතය.

ව්‍යාපෘතියේ ක්‍රියාවලියන් සහ අරමුණු නියමිත කාලය තුලදී ඉටුකර ගත නොහැකි වූයේ ටෙන්ඩර් පටිපාටියට අනුව රසායනික ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමේ ප්‍රමාදයන් නිසාය. කෙසේ වුවත් පෙර වර්ෂයේ ඉතිරිව තිබූ රසායනික ද්‍රව්‍ය මේ සඳහා භාවිතා කෙරිණි.

ප්‍රගතිය : %    භෞතික : 85%    මූල්‍යමය : 26%

**ව්‍යාපෘතිය 5 : අඩු මිල මත්ස්‍ය සම්පත් යොදා මත්ස්‍ය නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ලුණු දමා කල් තබාගත හැකි මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව පාලනය.**

කල් තබාගත හැකි මත්ස්‍ය නිෂ්පාදන වල පෝෂණ තත්වයන් වැඩි දියුණු කිරීම හා ඒවා ප්‍රයෝජනයට යොදා ගැනීම.

වියළි මසුන්ගේ පෝෂණ තත්ව වෙනස්වීම් අධ්‍යයනය කිරීම ව්‍යාපෘතිය මගින් සිදුවේ. පහත සඳහන් මත්ස්‍ය විශේෂයන්හි තෙල් හා මේද සංයුතිය පිළිවෙලින් මෙසේය.

මොදා (Lates calcarcfer), කිරලාවා (Decapterus විශේෂ), හුරුල්ලා විශේෂයන් හි පිළිවෙලින් 6.86% , 5.74% හා 5.58% කි. රිදී කාරල්ලා (*Leiognathus splendens*) ගේ 22.0% ක ඉහළ අළු ප්‍රමාණයක් සහ කට්ටාවා (*Scomberoides commersonianus*) ගේ 21.37% ක ප්‍රමාණයක් විය. වියළි මසුන්ගේ තෙතමනය සියයට 54.31 සිට 12.35 දක්වා පරාසයකින් යුක්ත වූ අතර, පිළිවෙලින් කට්ටාවා හා හාල්මැස්සන් (Stolephorus) විශේෂ වලින් මෙය වාර්තා විය.

"ශ්‍රී ලංකාවේ කර්මාන්තයක් ලෙස ඒගාර් නිස්සාරණය හා භාවිතය" යන මැයෙන් නාරා ආයතනය අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හා ඉන්දියාවේ CSP ආයතනය එක්ව ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ග්ලැසිලේරියා ව්‍යාප්ත කිරීම හා අපනයනය සඳහා අවස්ථා සොයා බැලීමයි.

මෙම ඇගාරොෆයිට්ස් නිෂ්පාදන ක්‍රියාවලියේදී *G.edulis* වල අශුද්ධ ද්‍රව්‍ය 41.20% ද, දූවිලි 1.98% ද, මඩ හා වැලි 51.54% ද වශයෙන් පිළිවෙලින් තිබුණි. අනෙකුත් මුහුදු පැලෑටි වලදී අඩුම දූෂක ලෙස DDMS 12.16% ලෙසද, (0.57%) ලෙසද, *Gelidiella acerosa* හි මුළු දූෂක ප්‍රමාණය 26.35% ලෙසද විය. සෙන්ට්‍රිග්‍රේඩ් 32 ක උෂ්ණත්වය හා 2% ක සාන්ද්‍රණයකින් යුත් ඒගාර් මාධ්‍ය මුහුදු පැලෑටි වගාව සඳහා යෝග්‍ය විය. අනෙක් විශේෂයක් වූ *G.acerosa* සමග සංසන්දනය කළ විට එහි ජෙල් ඝනත්වය ඉහළ මට්ටමක 497.22g හිදී 29.58% ප්‍රතිඵල වාර්තා වූයේ ඉහළ අගයක් ලෙස අළු 7.16% ක්ද, ------- වන අගය උෂ්ණත්වය සෙන්ට්‍රිග්‍රේඩ් 89 ද, ජෙලටිනීය අගය සෙන්ට්‍රිගේඩ් 32 ද විය. සියලු විශේෂයන් අතරින් *G.edulis* හි 37% ක ඉහළ ප්‍රතිඵලයක් ලැබුණි.

*G.verucosa* වල ප්‍රෝටීන් අගය 3.85% ලෙස ඉහළ අගයක් තිබූ අතර, එහිදී තෙතමනය 17.90% හා ජෙල් වල ප්‍රබලතාවය *Gelidiella acerosa* වලට වඩා 7 ගුණයකට වඩා පහළ තත්වයේ විය. සියලු විශේෂවල ප්‍රතිඵල සතුටුදායක තත්වයේ වූ අතර, නිෂ්පාදන වල තත්වය හා වඩා හොඳ සංවර්ධන කාර්යයන් සඳහා භාවිතා කිරීමට හැකිවීම පරීක්ෂණ වල වැදගත් අංගයක් විය.

ප්‍රගතිය : % භෞතික : 85% මූල්‍යමය : 51%

**ව්‍යාපෘතිය 6 : මට්ටින් ගේ නිෂ්පාදන වල වෙළඳපොළ අගය වැඩි දියුණු කිරීම.**

කල්පිටිය හා මොරටුව ප්‍රදේශයේ කවච මසුන් ලෙස මට්ටින් බහුල වශයෙන් ඇත. කල්පිටිය ප්‍රදේශවාසීන් ඔවුන්ගේ ස්ථිර ආදායම් මාර්ගයක් ලෙස මට්ටින් එකතු කිරීම කරනු ලබයි. වර්තමානයේදී මෙම කර්මාන්තයේ සංවර්ධනය සඳහා ක්‍රියා මාර්ග ගෙන නැත.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, මට්ටි කර්මාන්තයේ දියුණුව හා වෙළඳපොළේදී අගය වැඩි කිරීම් වස් සංවර්ධන ක්‍රියාවලියක් ඇති කිරීමයි. මට්ටින් අස්වන ප්‍රදේශවලින් හා කල්පිටිය කළපුවේ හා අක්වෙරළේ ජලය නියැදි එක්රැස් කර එහි ක්ෂුද්‍රජීවී විද්‍යා පරීක්ෂණයන්ට භාජනය කරන ලදී. මෙම පරීක්ෂණ වලින් පෙනී ගියේ ආහාර සඳහා යෝග්‍ය මට්ටි විශේෂ 4 ක් මෙම ප්‍රදේශයේ සිටිනා බවයි. මෙහිදී විශේෂ 3 ක් අඩු වියදමක් දරා නිෂ්පාදනය කළ හැකි බව සොයා ගැනුණි.

වියලු වායුහරණය කර පැකට් කරන ලද මට්ටින්ගේ මද මාස 06 ක පමණ කාලයක් යෝග්‍ය තත්ව යටතේ කල් තබාගත හැකි ලෙස දියුණු කරන ලදී. ඊට අමතරව, මට්ටින් සෝස් හා ලුණු ජලයේ දමා ගබඩා කර තැබීමේ ක්ෂුද්‍ර ජීවී අධ්‍යයනයන් සිදු කරන ලදී. නිෂ්පාදන වර්ග 02 ක් අවන්හල් 4 කට ලබාදෙන ලදී. ඔවුන්ගෙන් යහපත් ප්‍රතිචාර ලැබුණි.

ඊට අමතරව ගබඩා කළ ආහාර වල මාස 06 කට පසුව තත්වයන්ගේ රසායනික හා ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදු කිරීම මගින් කල් තබාගත හැකි කාලය නිර්ණය කෙරුණි.

ප්‍රගතිය : % භෞතික : 80% මූල්‍යමය : 31%

**ව්‍යාපෘතිය 7 : උපකරණ මිලදී ගැනීම.**

මෙම කාලය තුලදී ඉන්කියුබේටර් වැනි අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සිදුවිය. එසේම ආරක්‍ෂා සහිත කබඩ්, මූලික ජල රැඳවුම්, ඇඹරුම් උපකරණ, ජල පිරිසිදු කරන උපකරණ ආදිය මිලදී ගන්නා ලදී. මිලදී ගැනීමේ ක්‍රම සඳහා ද, අංශයේ අනෙකුත් කටයුතු නිසාද උපකරණ මිලදී ගැනීමේ කටයුතු පමාවිය.

5. **ප්‍රකාශන.**

5.1 **පර්යේෂණ ලිපි.**

1. දිසානායක, ඒ .ඩී. එස් .එන්., ගනේගමආරච්චි, ජී.ජේ. හා ෆොන්සේකා, ටී.එස්.ජී., (2004)
   වියලන ලද මත්ස්‍ය ආහාර ගබඩා කර තබා ගැනීමේ සංවර්ධන ක්‍රමයන්.
   4 වැනි කෘෂිකාර්මික පර්යේෂණ සමුළුව - වයඹ විශ්ව විද්‍යාලය, මාකඳුර, ගෝනාවිල, ශ්‍රී ලංකාව.

2. ආරියවංශ, කේ.ඩබ්.එස්., සමරජීව, යූ., සහ ජයසූරිය, එස්.පී., (2004)
   ස්වාභාවික කලපුවල (Penaeus monodon) කරවඩු ඉස්සාගේ භෞත රසායනික තත්වයන් හා ක්ෂුද්‍රජීවී තත්ව අධ්‍යයනය, සම්පූර්ණ පර්යේෂණ වාර්තාව නාරා ආයතනයේ සගරාව සඳහා ඉදිරිපත් කෙරිණි.

3. ආරියවංශ, කේ.ඩබ්.එස්., හෙට්ටිආරච්චි, කේ.එස්., සහ ජයසූරිය, එස්.පී., (2004)
   ශ්‍රී ලංකාවේ කලපු ජලයේ වගා කරනා කරවඩු ඉස්සාගේ (Penaeus monodon) ක්ෂුද්‍ර ජීවී තත්ව අධ්‍යයනය සම්පූර්ණ පර්යේෂණ වාර්තාව නාරා ආයතනයේ සගරාව සඳහා ඉදිරිපත් කෙරිණි.

4. ආරියවංශ, කේ.ඩබ්.එස්., සමරජීව, යූ., සහ ජයසූරිය, එස්.පී., (2004)
   ස්වාභාවික කලපු වල (Penaeus monodon) කරවඩු ඉස්සාගේ භෞත රසායනික තත්වයන් හා ක්ෂ්ද්‍රජීවී තත්ව අධ්‍යයනයන්.
   2004 මලයාසියාවේ 7 වැනි ආසියානු ධීවර සමුළුව සඳහා.

5. වදුරුස්ස, බී.එම්.කේ., ද සිල්වා, ඩී.එච්.එම්.එන්., සහ ආරියවංශ, කේ.ඩබ්.එස්.,
   බලයාගේ (Katsuwonus pelamis) කල් තබාගත හැකි කාලය නිර්ණය කිරීම සඳහා තත්ව දර්ශකයක් හඳුන්වා දීම.
   7 වැනි ආසියානු ධීවර සමුළුව, මලයාසියාව.

6. ජයසිංහ, පී.එස්., ගලප්පත්ති, සී., (2004)
   අයිස්වල ගබඩා කාලය තුලදී තිලාපියා මසුන්ගේ තත්ව හා අගයන් පහත වැටීම පිළිබඳ අධ්‍යයනය.
   2004 SLASS වාර්ෂික සැසිය.

7. සුරසිංහ, එන්.එස්., සෝමාවතී, කේ.එම්., සහ ජයසිංහ, පී.එස්., (2004)
   Gracillaria (මුහුදු පැලෑටි) වල විශේෂ නිෂ්පාදන තත්ව දියුණු කිරීම හා ඒගාර් ජෙලි නිෂ්පාදනය කිරීම.
   ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ 6 වැනි වාර්ෂික සැසිය.

5.2 **පර්යේෂණ වාර්තා.**

1. බේරුවල ධීවර වරායේ මෝර මාළුන්ගේ පසු අස්වනු තත්ව නිර්ණය කිරීම.
   ගනේගමආරච්චි, ජී.ජේ.,

2. ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්තයේදී Thunnus විශේෂයන් (කෙලවල්ලා) පරිහරණයේදී තත්ව බිඳ වැටීම් පිළිබඳ අධයයනය – ගනේගමආරච්චි, ජී.ජේ.,

3. ත්‍රිකුණාමලයේ කොඩ්බේ ධීවර වරායේ බලය (Skipjack tuna) හා කහ වරල් කෙලවල්ලා (Yellowfine tuna) මසුන් ඇල්ලීම හා පරිහරණ තත්ව අධ්‍යයනය – ගනේගමආරච්චි, ජී.ජේ.,

4. තිකුණාමලයේ සාලයා මත්ස්‍ය විශේෂයන්ගේ වෙළඳපොල හා පරිහරණ ක්‍රමවල තත්ව තිගමනයන් කිරීම – ගනේගමආරච්චි, ජී.ජේ.,

5. අභ්‍යන්තර ජලජ ඉස්සන්ගේ ප්‍රතිජීවක මට්ටම් නිර්ණය කිරීම – එදිරිසිංහ, ආර්.,

6. ශ්‍රී ලංකාවේ Agarophytes තක්සේරු කිරීම – ජයසිංහ, පී.එස්., පහලවත්තආරච්චි, ඩබ්., සනාතම්, එස්., සහ කිරිඇල්ල.

**5.3 පත්‍රිකා.**

1. වෙළඳපොල සඳහා උසස් තත්වයේ වියළි මසුන් පිළියෙල කරන අයුරු.
   24/11/2004 ඉරිදා රිවිදින පත්‍රය සඳහා – ජයසිංහ, පී.එස්.,

2. සෞඛ්‍ය සම්පන්න මිනිස් ජීවිතයක් සඳහා යෝග්‍ය ආහාර පැසවීම සඳහා හිතකර ක්ෂුද්‍ර ජීවීන් – දිනමිණ පුවත්පතට.

## 6. පුහුණුවීම් / සමූප්‍රජානන වැඩ සටහන්.

1. මත්ස්‍ය පරිහරණ හා වෙළඳපොල තත්ව නගා සිටුවීමේ වැඩමුළු පැවැත්වීම (සමුද්‍ර ජීව විද්‍යා හා සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය සමග එක්ව)

   ඉලක්ක සමූහයන් : ධීවර ප්‍රජාවන් සහ බහුදින ධීවර කර්මාන්ත කළමනාකරණ වගකිවයුත්තන්. ස්ථානය / දිනය : තංගල්ල, 12/10/2004 තුඩාවැල්ල, 14/10/2004 මිරිස්ස. 16/11/2004 වැඩමුළු 03.

2. ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පැවැත්වූ "මසුන් හඳුනා ගැනීම, තෙලා ගැනීම, පරිහරණය, ආරක්ෂාව හා වෙළඳපොල" පිළිබඳ පුහුණු වැඩ සටහන.

   ලංකා ධීවර සංස්ථාව හා ලංකා ධීවර හා වරාය විසින් 2004 දෙසැම්බර් 02 නාරා හිදී. (මේ සඳහා ධීවර තාක්ෂණ අංශය, සමුද්‍ර ජීව විද්‍යා අංශය, පරිසර අධ්‍යයන අංශය හා සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය දායකත්වය ලබා දුනි.)

3. නිකවැරටියේ ධීවර ප්‍රජාවන් සඳහා කර්මාන්තයක් ලෙස උම්බලකඩ නිෂ්පාදනය පිළිබඳ වැඩසටහන.

# සේවා සහ මෙහෙයුම් අංශය.

## අංශ ප්‍රධානි : යූ.ජ්.සිරිසේන මහතා.

1. **වර්ෂය පිළිබඳ සමාලෝචනය.**

සේවා සහ මෙහෙයුම් අංශය විසින් එදිනෙදා හා පහත සඳහන් අංශවල නඩත්තු කටයුතු පාලනය කරයි.

- ප්‍රවාහන පහසුකම් සැලසීම
- සිවිල් වැඩ
- යාන්ත්‍රික වැඩ
- විදුලි
- ඉලෙක්ට්‍රොනික්

වාහන නඩත්තුව පිළිබඳ සියලු වගකීම්, අංශය වෙත පැවරිණි. දිනපතා ආයතනයේ රාජකාරි සඳහා වාහන යෙදවීම් සිදුවිය. අවශ්‍ය ප්‍රමාණයට වාහන නොමැතිවීම ද, කුලී පදනම මත වාහන නොගැනීම නිසාද ගැටළු ඇතිවිය. අවුරුදු 10 කට වඩා පැරණි වාහන සඳහා නඩත්තුවට කාලය හා මුදල් විශාල ලෙස වැය වේ. මේ සඳහා පරණ වාහන වෙනුවට අළුත් වාහන මිළදී ගැනීම යෝග්‍ය ය. නාරා ආයතන භූමිය නඩත්තු කටයුතු සිදු කිරීම ඉතා විශේෂයෙන් සිදුවිය. ආයතන භූමිය විශාල ප්‍රමාණයක් බිම් සැකසුම් නිලධාරි විසින් නිමැවුම් කරන ලදී.

**උපකරණ:**

විද්‍යාගාර වල උපකරණ වල නඩත්තු හා සේවා කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. මුහුදු ආශ්‍රිතව නිසා වායු සමනය උපකරණ වල නඩත්තු කටයුතු නිතරම සිදු කරන ලදී.

**සීමා කිරීම්:**

ප්‍රධාන ඉංජිනේරු නොමැතිවීම (විනය පරීක්ෂණය සිදුවෙමින් පවතී.) නිසා 2004 වසරේදී අංශයේ වැඩ කටයුතු කිරීම අපහසු විය. මේ නිසා පරිපාලන නිලධාරිගෙන් ඉංජිනේරු අංශයේ වැඩ පිළිබඳ අපේක්ෂා කරන ප්‍රතිඵල ලබාගත නොහැකි වූ අතර, සිවිල් ඉංජිනේරුවරයෙකු ඒ සඳහා යෙදවීම අත්‍යාවශ්‍ය විය.

2. **සිදු කරන ලද ක්‍රියාකාරකම්.**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. ශ. | භාර නිලධාරින් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. සිවිල් ඉදි කිරීම | 1.1 කාක දූපතේ නාරා භූමියේ ඉදි කිරීමට නියමිත කඩොලාන උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු හා සීමාවේ කළුගල් පාර සැකසීම. | 1.0 | යූ. ඒ. සිරිසේන | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 1.2 පර්යේෂණ මධ්‍යස්ථානයන් හි නවාතැන් පහසුකම් සඳහා වැඩි දියුණු කිරීම. | 3.0 | යූ. ඒ. සිරිසේන | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 1.3 කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර ජලජීවි වගා අංශයේ විද්‍යාගාරයේ 1 වෙනි මහල සම්පූර්ණ කිරීම. | 2.0 | යූ. ඒ. සිරිසේන | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 1.4 නාරා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි පිළිසකර කිරීම. | 1.0 | යූ. ඒ. සිරිසේන | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| 2. වාහන අළුත්වැඩියා කිරීම. | 2.1 නාරා ප්‍රවාහන පද්ධතියේ ඇති වාහන 2 ක ප්‍රධාන අළුත්වැඩියා කටයුතු. | 1.8 | යූ. ඒ. සිරිසේන | 2004 ජනවාරි | 2004 දෙසැ: |
| | 2.2 උපකරණ | 4.0 | යූ. ඒ. සිරිසේන | | |

2. කාර්යසාධනය.

**ව්‍යාපෘතිය 1.1 :**

ප්‍රධාන ඉංජිනේරුවරයකු නොමැතිවීම නිසා වැඩ කටයුතු පමා විය.

ප්‍රගතිය : % භෞතික : 0% මූල්‍යමය : 0%

**ව්‍යාපෘතිය 1.2 :**

ප්‍රධාන ඉංජිනේරුවරයකු නොමැතිවීම නිසා වැඩ කටයුතු අඩාල විය.

ප්‍රගතිය : % භෞතික : 0% මූල්‍යමය : 0%

**ව්‍යාපෘතිය 1.3 :**

ප්‍රධාන ඉංජිනේරුවරයකු නොමැතිවීම නිසා වැඩ කටයුතු අඩාල විය.

ප්‍රගතිය : % භෞතික : 0% මූල්‍යමය : 0%

**ව්‍යාපෘතිය 1.4 :**

ප්‍රධාන ඉංජිනේරුවරයකු නොමැතිවීම නිසා වැඩ කටයුතු අඩාල විය.

ප්‍රගතිය : % භෞතික : 0% මූල්‍යමය : 0%

**ව්‍යාපෘතිය 2.1 :**

- වාහන අංක 32/3417 අවලම්බක, බ්‍රේක් සුක්කානම් අළුත්වැඩියා සම්පූර්ණ කරන ලදී.
- වාහන අංක 61/6251 සුක්කානම, සස්පෙන්ෂන්, එන්ජිමේ අළුත්වැඩියා සම්පූර්ණ කරන ලදී.
- 62/2177 වාහනයේ ටින්කර්, පාට කිරීමේ වැඩ අවසන් කරන ලදී.
- 32/7028 වාහනයේ අළුත්වැඩියා කටයුතු නිම විය.

ප්‍රගතිය : % භෞතික : 100% මූල්‍යමය : 60%

**ව්‍යාපෘතිය 2.2 :**

ප්‍රගතිය : % භෞතික : 60% මූල්‍යමය : 40%

**අනෙකුත් නඩත්තු කටයුතු සඳහා පුනරාවර්තන වියදම්.**

ආයතනයේ ගොඩනැගිලි, විදුලිබලය, ජල සැපයුම්, දුරකථන / ෆැක්ස් යන්ත්‍ර, වායුසමනය පද්ධතිය, පරිගණක පද්ධතිය, උපකරණ හා ආයුධ සඳහා පුනරාවර්තන වියදම් යෙදවිය. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (NIFNE) සඳහා විදුලිබල සැපයුමද නාරා ආයතනය විසින් ලබා දුනි.

## සමාජ, ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය.

**අංශ ප්‍රධානී : ආචාර්ය ආර්.මල්දෙණිය.**

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය.**

ධීවර අංශය සහ ධීවර ප්‍රජාව ආශ්‍රිත සමාජ, ආර්ථික සහ අලෙවිකරණ අංශයන් ආශ්‍රිත පර්යේෂණ දියත් කිරීම පිළිබඳ වගකීම සමාජ, ආර්ථික සහ අලෙවි පර්යේෂණ ආංශය වෙත පැවරී ඇත.

යෝජිත ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩල අඩුවක් තිබුණද, වැඩ සටහන් ආරම්භ වූ නමුත් ආර්ථික විද්‍යාඥ, සමාජ විද්‍යාඥ හා සංඛ්‍යා නිලධාරි යන පුරප්පාඩු 03 ඉක්මණින් පිරවිය යුතු විය. වෙළඳපොල පිළිබඳ අදාල පර්යේෂණ නිලධාරි 2004 අගෝස්තු දක්වා අධ්‍යයන නිවාඩු ලබා ගත්තා ලදී. පර්යේෂණ සහකාරවරුන් හතර දෙනෙකු අංශයේ ක්ෂේත්‍ර දත්ත රුස් කිරීම සඳහා සම්පූර්ණයෙන් නිරත විය. අලෙවිකරණය පිළිබඳ පර්යේෂණ නිලධාරි ලලිත් අමරලාල් මහතා නාරා ආයතනයේ පසු අස්වනු තාක්ෂණ අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු 02 කට සහභාගි විය.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම්.**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කල මුදල රු. ශ. | භාර නිලධාරීන් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික අධ්‍යයනය. | 1.1. ධීවර කාන්තාව : මුහුදු හා අභ්‍යන්තර ධීවර ක්ෂේත්‍රයේ ධීවර කාන්තාවගේ ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය. | 0.60 | ආචාර්ය ආර්.මල්දෙණිය | 2004 | 2005 |
| | 1.2 කෙටි වැඩ සටහන් පුහුණු කිරීම. | 0.36 | ආචාර්ය ආර්.මල්දෙණිය<br>ආර්.ගමගේ<br>ජ්.අමරසිංහ | 2004 | |
| | 1.3 ශ්‍රී ලංකාවේ ධීවර කරමාන්තයේ ධීවර කාර්මිකයන්ගේ පෝෂණ කළමනාකරණය | 0.60 | ආචාර්ය ආර්.මල්දෙණිය<br>එච්.ඩී.විමලසේන<br>ඩී.ද මෙල් | 2004 | |
| 2. ධීවර සංඛ්‍යා සැකසීම | 2.1 ධීවර වාර්ෂික සංග්‍රහය | 0.30 | ආචාර්ය ආර්.මල්දෙණිය | අඛණ්ඩව | |

**2. කාර්යසාධනය.**

**වැඩ සටහන 1 : ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික අධ්‍යයනය.**

**ව්‍යාපෘතිය 1.1 : ධීවර කාන්තාව.**

**මුහුදු හා අභ්‍යන්තර ධීවර ක්ෂේත්‍රයේ ධීවර කාන්තාවගේ ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය.**

ව්‍යාපෘතියේ අරමුණ වූයේ, ධීවර කාන්තාවගේ දායකත්වයන් හා අභිලාෂයන් හඳුනා ගැනීම හා ධීවර ක්ෂේත්‍රයේ ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වයන් අධ්‍යයනය හා කුඩා ධීවර කණ්ඩායම් වල අධ්‍යයනයන්ය. සැලසුම් කිරීම් වල ගැටළු නිසා කුමවත් අධ්‍යයන කටයුතු මාස 04 කට පමා විය. මුහුදු හා අභ්‍යන්තර ධීවර ක්ෂේත්‍රවල දත්ත රුස් කිරීම සමගාමීව සිදුවිය. මුහුදු ක්ෂේත්‍රයේ අධ්‍යයනයන් පුත්තලම, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා අම්පාර දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක විය. පොලොන්නරුව, අනුරාධපුරය, රත්නපුරය, මොණරාගල දිස්ත්‍රික්කවල වැව් ආශ්‍රිත නිත්‍ය හා කාලානුරූපී ධීවර ප්‍රජාවගේ අධ්‍යයනයන් සම්පූර්ණ කළ අතර, හම්බන්තොට හා පුත්තලම දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක වෙමින් පවතී.

උතුරු පළාතේ දිස්ත්‍රික්කයන් හි අධ්‍යයන කටයුතු යාපනය විශ්ව විද්‍යාලය හා එක්ව සිදු කිරීමට කටයුතු යොදන ලදී

ශ්‍රී ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ දායකත්වයෙන් කලා වැව හා කවුඩුල්ල වැව ධීවර කාන්තාවන් සඳහා ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දීමේ වැඩමුළු 02 ක් පැවැත්වීය.

අවුරුද්ද සඳහා වෙන්කළ මුදල – රු. 600,000/-

**ව්‍යාපෘතිය 1.2 : කෙටි පැවරුම් – සටහන් – පුහුණු කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ, විධිමත් ධීවර කෙටි වැඩ සටහන් දියත් කිරීම සඳහා විවිධ ආයතන හරහා නිශ්චිත හා නිශ්චිත නොවන ක්‍රම හඳුනා ගැනීමයි.

විවිධ ගැටළු පැමිණිය නිසා සැලසුම් කළ කාලයෙන් මාස 04 ක් පමා වී වැඩ සටහන් ආරම්භ කිරීමට සිදුවිය. සියලුම දිස්ත්‍රික්කයන් හි කෙටි පැවරුම් වැඩ සටහන් දියත් කර දත්ත එකතු කිරීමට සිතු මුත් අවශ්‍ය සහාය නොලැබුණු බැවින් ආයතන වලින් ලබාගත් දත්ත හරහා අදහස් ලබා ගැනීමට සිදුවිය. බොහෝ ආයතන, විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේ දත්ත සංකීර්ණ ලබා දීමට අකමැති විය. එනම් රාජ්‍ය ආයතන වලට වඩා ඔවුන්ගේ නිරීක්ෂණයන් කුඩා කණ්ඩායම් සමග සම්බන්ධතාවයන් හා ක්‍රියාත්මක වීම් ඉදිරියෙන් තිබීමයි.

තනි පුද්ගල පැවරුම් කුඩා කණ්ඩායම් වල සහභාගිත්වයෙන් සිදුවිය. රාජ්‍ය නොවන සංවිධාන වලින් කෙටි පැවරුම් අඩු මට්ටමින් ලැබුනි. හේතුව ඔවුන් වඩා උනන්දු වන්නේ නිවාස තනාදීම්, වැසිකිළි පහසුකම් හා කුසලතා සංවර්ධනය හා අධ්‍යාපන අරමුණුය. රාජ්‍ය ආයතන වලින් වඩා වැදගත් රාජ්‍ය බැංකුය. මෙම ගැටළු නිසා ව්‍යාපෘතියේ අරමුණු වර්ෂය අවසානයේදී සපුරා ගැනීමට නොහැකි විය.

අවුරුද්ද සඳහා වෙන්කළ මුදල – රු. 360,000/-

**ව්‍යාපෘතිය 1.3 : ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ධීවර කාර්මිකයන්ගේ පෝෂණ කළමනාකරණය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, ධීවර ක්ෂේත්‍රයේ කාර්මිකයන්ගේ දායකත්වයන් විශේෂයෙන් අක්වෙරළ ධීවර ක්ෂේත්‍රයේ ධීවර සම්පත සඳහා යෙදීම් හා දායකත්වයන් අධ්‍යයනයන්ය. මෙම ව්‍යාපෘතියද පමා වී ආරම්භ කිරීමට සිදුවිය. දිස්ත්‍රික්ක 07 ක දත්ත රැස් කිරීම් සිදුවිය. පුත්තලම, හලාවත, මීගමුව, (ගම්පහ) බේරුවල, (කළුතර) ගාල්ල, මාතර, තංගල්ල හා කල්මුණේ (අම්පාර) දිස්ත්‍රික්කයන් වේ. මෙම අධ්‍යයනයේදී බහුදින යාත්‍රාවල යෙදෙන ගැතියන්ගේ කළමනාකරණ තීරණ සම්පත් වල සමතුලිතතාවය රඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනිණි. ඔවුන්ගේ මූලික අධ්‍යාපන දැනුම ඉතා පහළ මට්ටම්වල විය. සියයට 70 කට වඩා ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ විය. බොහෝ යාත්‍රා හිමියන් ඔවුන්ගේ ගැතියන් රක්ෂණය කර නැත. යාත්‍රාපතින් හැර අනෙක් බොහෝ ගැතියන් සිතියම් හා GPS කියවීමට නොහැකි මට්ටමේ වේ. මූලික දත්ත අධ්‍යයනයක් "නාරා පුවත්" සගරාව සඳහා සැකසුනි.

අවුරුද්ද සඳහා වෙන්කළ මුදල – රු. 600,000/-

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## 2004 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | | 2004 | 2003 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ ගොඩනැගිලි සහ උපකරණ | (14) | 301,515,539.99 | 289,353,730.00 |
| | | 301,515,539.99 | 289,353,730.00 |
| ජංගම වත්කම් | | | |
| 2004.12.31 දිනට තොගය | (15) | 862,697.69 | 1,101,234,00 |
| ණයගැතියෝ සහ පූර්ව ගෙවීම් | (16) | 3,460,765.59 | 2,986,182.00 |
| තැන්පතු | (17) | 807,250.00 | 807,250.00 |
| අත්තිකාරම් | (18) | 2,026,819.91 | 1,681,441.00 |
| කාර්ය මණ්ඩල ණය | (19) | 8,018,427.19 | 7,420,948.00 |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | (20) | 2,267,175.00 | 589,686.00 |
| | | 17,443,135.38 | 14,586,741.00 |
| **මුළු වත්කම්** | | **318,958,675.37** | **303,940,471.00** |
| **ස්කන්ධයන් සහ බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය සහ තොගය** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන (රාජ්‍ය) | (21) | 528,865,380.00 | 478,165,380.00 |
| ප්‍රති තක්සේරු ඉතිරිය | (22) | 306,770,948..60 | 265,352,099.00 |
| විදේශාධාර | (23) | 144,371,574.00 | 144,558,859.00 |
| දේශීය ආධාර | (24) | 25,920,137.64 | 28,418,368.00 |
| ආදායමට වැඩි වියදම් අතිරික්තය | (25) | (728,709,002.94) | (654,551,593.00) |
| | | 277,219,037.30 | 261,943,113.00 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික දීමනා | | 26,793,761.65 | 18,649,713.00 |
| **ජංගම බැරකම්** | | | |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | (26) | 7,803,662.29 | 12,508,023.00 |
| ව්‍යාපෘති ණයහිමියෝ | (27) | 5,760,075.60 | 5,900,463.00 |
| විශේෂඥ සේවා ව්‍යාපෘති ණයහිමියෝ | (28) | 1,382,138.53 | 4,939,159.00 |
| බැංකුවේ ඇති මුදල් | | | |
| | | 14,945,876.42 | 23,347,645.00 |
| ස්කන්ධයන් හා බැරකම්වල එකතුව | | 318,958,675.37 | 303,940,471.00 |

ආචාර්ය කපිල සී.කේ.පෙරේරා
සභාපති

ආචාර්ය එස්.සී.ජයමාන්න
අධ්‍යක්ෂ ජනරාල්

එම්.ඩී.සේනාරත්න
ගණකාධිකාරී

# විගණකාධිපති වාර්තාව

මගේ අංකය : ඒ එල්/බී/නාරා/2004/13 | දිනය : 2005 අප්‍රේල් 30 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ , 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන, මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් නියෝජිතායතනයේ සභාපතිවරයා වෙත යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

**1.2** විගණන විෂය පථය.

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුළත හැකිතාක් දුරට විගණනයෙන් කළ හැකි පරිද්දෙන් පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නියාමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශ වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේ දැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2.** ගිණුම්.

**2.1** විගණන මතය.

මාගේ පරීක්ෂණයෙන් හෙළි වූ අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මාගේ වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් හේතුවෙන් ඇතිවන බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන්වල (සටහන් අංක 1 සිට 7) දක්වා ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2003 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයේ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

### 2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුනාමි ව්‍යසනය හේතුවෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ චංචල ස්ථාවර වත්කම් සඳහා වූ හානිය ගණන් බලා නොතිබුණි. නාරා ආයතනයේ පවතින තොරතුරු වලට අනුව, "සයුරි" නෞකාව හැර සිදුවූ හානිය රු. 168,381,000 ක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) වියදමේ ස්වභාවය නොසලකා අයභාර වියදම් ප්‍රාග්ධනගත කර තිබුණි.

#### 2.2.2 හඳුනාගත් පාඩු.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | වටිනාකම රු. | විස්තරය |
|---|---|---|
| (අ) මිලදී ගැනීමේ අත්තිකාරම් | 215,278 | ආයතන 04 ක් වෙත භාණ්ඩ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ගෙවා තිබුණු නමුත්, 2004 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂ 3 සිට 7 දක්වා වූ කාලයක් ගත වී තිබුණ ද, නියෝජිතායතනය වෙත භාණ්ඩ ලැබී නොතිබුණි. |
| (ආ) සේවා අත්තිකාරම් | 599,510 | ආයතන 02 ක් වෙත අත්තිකාරම් ගෙවා තිබුණු මුත් වර්ෂ 2 සිට 4 දක්වා කාලයක් මෙම සේවා ලැබී නොතිබුණි. |

#### 2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තොර ගනුදෙනු.

කළමනාකරණ සේවා මණ්ඩලයේ එකගතාවය සමග භාණ්ඩාගාර අනුමැතිය රහිතව, නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක කර, ඊට අනුකූලව සේවකයින් වෙත හිඟ වැටුප් ලෙස රු.674,946 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කළ ගිණුම් අනුව, 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ නියෝජිතායතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 74,157,411 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව පෙර වර්ෂය සඳහා ඌනතාවය රු. 71,988,197 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,159,214 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 3.2 කාර්ය සාධනය ඇගයීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයයට යොමුව | වටිනාකම රු. | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | තල්මස් සැකිල්ල සඳහා ආවරණය. | 202,605 | නියමිත ලෙස ස්ථාවර ආවරණයක් ඉදි නොකිරීමේ හේතුවෙන් හානියට පත්ව ඇත. |
| (ආ) | ධීවර ආම්පන්න පිළිබඳ කෞතුකාගාරය පිහිටුවීම. | 834,275 | දුර්වල සැලසුම් කිරීමේ හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ඌන උපයෝජනය. |
| (ඇ) | සමුද්‍ර ජීවී සම්පත් ආවරණ හා පර්යේෂණ අංශයේ කාර්ය සාධනය. | 1,317,665 | අධිකාරියෙන් තොර කරුණු හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ඌන උපයෝජනය. |
| (ඇ) | "සුනාමි" ව්‍යසනය හේතුවෙන් වංචල වත්කම් සඳහා වූ හානිය. | සොයාගත නොහැක. | අනාගත කාර්ය සාධනයට මෙම තත්ත්වය බලපෑම වලක්වාලීමට පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඉක්මන් ක්‍රියා මාර්ග ගතයුතු වීම. |

**3.3 වාහන උපයෝජනය.**

සමාලෝචිත වර්ෂය අවසානයේ දී නියෝජිතායතනය සතු වාහන 22 ක ඇණියක් පැවතුණි. නියෝජිතායතනය හා සම්බන්ධ නොවූ කාර්යයන් වෙනුවෙන් සමහර වාහන යොදවා තිබුණි.

**4. පද්ධති හා පාලන.**

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අත්තිකාරම් ගෙවීම හා බේරුම් කිරීම.

(ආ) බඳවා ගැනීම සහ උසස්වීම.

(එස්.සී.මායාදුන්නේ)
විගණකාධිපති.

## 2004 වසර සඳහා විගණකාධිපති වාර්තාව පිළිබඳව ගත්තා ලද පියවර.

**2.2 ගිණුම් පිළිබඳ විවේචන.**

**2.2.1. ගිණුම් කිරීමේ ඌනතා.**

(අ) නිශ්චිත අගයන් පෙන්වා නැත. දළ වශයෙන් පෙන්වා දී ඇත. භාතිය පිළිබඳ තක්සේරු කිරීම් සිදු කිරීම ඉක්මන් වැඩි අතර, සමහර විද්‍යාත්මක උපකරණ පිළිබඳ තක්සේරු කිරීමට විවිධ ආයතන කරා යවා ඇත. අනාගතය සඳහා තවදුරටත් නාරා ආයතනය තුළ පාවිච්චියට ගැනීම ලාභදායිද යන්න පරීක්ෂා කෙරේ. එංවල දේපළ වල අලාභය රු.110,727,354/- ක් ලෙස තක්සේරු කර ඇත. මේ සඳහා 'සයුරි' යාත්‍රාවේ අලාභය ද අයත් අතර, 'සයුරි' යාත්‍රාව අලුත්වැඩියා කිරීම සඳහා තීරණය කර ඇත.

(ආ) මෙයට අදාළ වන්නේ කැල්කියුලේටර්ස්, කාර්යාලීය බෑග් හා බිත්ති ඔර්ලෝස් වැනි දේය. මෙම භාණ්ඩ මිලදී ගැනීමට ස්ථාවර ගිණුමෙන් වැය වී ඇති නිසා මේවා ස්ථාවර භාණ්ඩ ලෙස සලකනු ලැබේ.

**2.2.2. හඳුනාගත් අඩුපාඩු.**

**(අ) මිලට ගැනුම් අත්තිකාරම්.**

ඒලියන් ඉලෙක්ට්‍රොනික් පුද්ගලික සමාගමට රු. 145,000/- ක මුදලක් ගෙවන ලදී. ආසිරි ඒජන්සීස් වෙත රු. 70,590/- ක මුදලක් ගෙවන ලදී. වවුචර් අංක 12 / සැප්තැම්බර් 2005 යටතේ ගෙවීම් සිදුවිය.

(b) සේවා අත්තිකාරම්.

කල්පිටිය හා කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වල සම්පූර්ණ නොවූ ඉදිකිරීම් වල වැරදි පවතී. කඩොල්කැලේ ඉදිකිරීම් සඳහා අදාල වගකිවයුතු නිලධාරියා සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ පවතී. පරීක්ෂණ වාර්තාව පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර, එය විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා ඉදිරිපත් වේ. එම කමිටුවේ අදහස් මත සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. එසේම කල්පිටිය ඉදිරිකිරීම් සඳහා වැය වූ රු.399,510/- ක මුදලක් සඳහා තවමත් ක්‍රියාමාර්ග ගෙන නැත.

**2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.**

හිග වැටුප් වශයෙන් රු. 675,946/- ක මුදලක් ගෙවීම සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය මත එකග වුණි.

**3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය.**

3.1 මූල්‍යමය ප්‍රතිඵල - අදහස් නැත.

**3.2 කාර්ය සාධනය අගැයීම.**

(අ) තල්මස් සැකිල්ල සඳහා පියස්සක් ඉදි කිරීමට එකගවීම.
(ආ) ධීවර ආම්පන්න කෞතුකාගාරයක් තැනීමට එකගවීම.
(ඇ) සමුද්‍ර ජීව විද්‍යා අංශය උසස් කිරීම.
මේ සඳහා එකගතාවයක් ඇතිවිය.
මෙවැනි අවස්ථා නැවත ඇති නොවන ලෙස පියවර ගෙන ඇත.

(ඇ) සුනාමි ව්‍යසනය නිසා සිදුවූ අලාභහානි තක්සේරු කොට ඇත.

යාත්‍රා, බෝට්ටු හා වාහනවලට හැර අනෙකුත් ඒවාට රක්ෂණ ආවරණයක් ගෙන නැත. එසේ වුවද, පරිගණක හා ආරක්ෂාව සඳහා වූ උපකරණ වල ආරක්ෂාව සඳහා අවශ්‍ය පූර්ව ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙහිදී පසුගිය අත්දැකීම් අනුව සුනාමි වැනි අවස්ථා වලදී සිදුවන හානියන් හැර අනෙක් හානි සඳහා ආරක්ෂාව සඳහා පියවර ගෙන ඇත.

**3.3 වාහන ප්‍රයෝජනයට ගැනීම.**

ආයතනයට සම්බන්ධ නොමැති කටයුතු සඳහා වාහන පාවිච්චි කිරීමට නොදීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

**4. පද්ධතිය හා පාලනය.**

යෝජනා සටහන් කරගෙන ඇත. ඒවායේ සඳහන් කර ඇති කාරණා පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වීමට පියවර ගෙන ඇත. සමහර ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Aquatic Resources Research and Development Agency(NARA)

1. Place of Scanning : Crow Island, Colombo 15
2. Date Scanned : 2017/04/27
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : T.L.D. Sajintha

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : B G Sunethra Kariyawasam

Signature : ...

Date : 2017/04/27

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*